වාර්ෂික වාර්තාව

2016





ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය



2016

වාර්ෂික වාර්තාව

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

පටුන

පිටුව

සභාපතිතුමාගේ පණිවුඩය

සාමාන්‍යාධිකාරීතුමියගේ පණිවුඩය

1. පොදු

1.1 හැඳින්වීම 1
අපගේ දැක්ම 1
අපගේ මෙහෙවර 1
අරමුණු 1
පරමාර්ථ 1
1.2 සංස්ථාපිත තොරතුරු 2
1.3 අධ්‍යක්ෂ මණ්ඩලය 3
1.4 සංස්ථාපිත කළමනාකරණය 4
1.5 අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම් 5

2. සංස්ථාපිත පාලනය

2.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් 7
2.2 විගණන හා කළමනාකරණ කමිටුව 7
2.3 ප්‍රගති සමාලෝචන රැස්වීම් 7
2.4 අභ්‍යන්තර පාලනය 7
2.5 විධායක කළමනාකරණය 7
2.6 අවදානම් කළමනාකරණය 8
2.6.1 ද්‍රවශීල අවදානම 8
2.6.2 වෙළඳපොළ අවදානම 8
2.6.3 මෙහෙයුම් අවදානම 8
2.7 පාරිසරික ගැටලු 9

3. මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

නිවාස සංවර්ධන කොට්ඨාශය

3.1 2016 - නිවාස සංවර්ධන වැඩසටහන 12
සැමට සෙවණ විසිරි නිවාස වැඩසටහන 12
සැමට සෙවණ ආදර්ශ ගම්මාන වැඩසටහන 13
සම්පත් සෙවණ වැඩසටහන 14
වැන්දඹු කාන්තාවන් සඳහා සහ විසිරි නිවාස ණය සැපයීම 14
සැමට සෙවණ උදාකළ ගම්මාන වැඩසටහන 14
කපලාරු කිරීමේ වැඩසටහන 14
සෙවණ ආධාර වැඩසටහන 14
අනුග්‍රාහක ආයතන පරිත්‍යාග අරමුදලින් සෙවණ ආධාර ආදර්ශ ගම්මාන වැඩසටහන ... 14
වැලිඔය තිරසාර ඒකාබද්ධ නිවාස සංවර්ධන ව්‍යාපෘතිය 15
වකුගඩු රෝගයෙන් පීඩාවට පත් වූවන් හා අන්ත දිළිඳු පවුල් වෙනුවෙන් ක්‍රියාත්මක නිවාස වැඩසටහන 15
3.2 දේපළ කළමනාකරණය 17
3.3 ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්
මහල් නිවාස ප්‍රතිසංස්කරණය (නගමු පුරවර) 18
නගමු පුරවර නවීකරණ වැඩසටහන 18
රාජ්‍ය,පෞද්ගලික ඒකාබද්ධ ව්‍යාපෘති වැඩසටහන (PPP Projects) 21

අනෙකුත් ව්‍යාපෘති 21

කඩිනම් මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය 21

ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති 22

3.4 මානව සම්පත් කළමනාකරණ 22

3.4.1 මානව සම්පත් කළමනාකරණ අංශය 22

3.4.2 පාලන අංශය 23

2016 වර්ෂයේ පාලන කොට්ඨාශයේ කාර්ය සාධනය 23

3.4.3 විනය අංශය 23

3.4.4 ප්‍රවාහන අංශය 23

2016 වර්ෂය තුළ ප්‍රවාහන අංශය සම්පාදනය කළ ඉලක්ක 23

3.4.5 පුහුණු හා සංවර්ධන අංශය 23

3.4.6 මාණ්ඩලික නිවාස ණය අංශය 25

3.4.7 ආරක්ෂක අංශය 25

සම්පාදනය කළ ඉලක්ක 25

ආරක්ෂක නිලධාරීන් විසින් ප්‍රධාන කාර්යාලය/ දිස්ත්‍රික් කාර්යාල සංකීර්ණ හැර

ආරක්ෂක සේවාවන් සපයන ස්ථාන 25

ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල 25

3.4.8 සෙවණ අධ්‍යයන කේන්ද්‍රය 26

3.4.9 ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය හා සමාජ වෙබ් අඩවි

(Social Media) මෙහෙයුම් පරිගණක.අංශය 26

3.4.10 ලේඛනාගාරය හා පොත් බැඳුම් අංශය. 26

3.5 නීති කොට්ඨාශය 26

3.5.1 ඔප්පු නිකුත් කිරීම 27

3.6 සැළසුම් හා ප්‍රගති කොට්ඨාශය 27

4. මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

4.1 අයකිරීම් අංශය 30

4.1.1 2016 වසරේ ක්‍රියාකාරිත්වය 30

4.1.2 2016 වසරේ අයකිරීම් වැඩිකර ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග 30

4.2 අභ්‍යන්තර විගණන අංශය 34

4.3 තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය 34

4.3.1 තොරතුරු හා ප්‍රචාරක ඒකකය 34

4.3.2 සෙවණ මාධ්‍ය ඒකකය 35

4.3.3 මුද්‍රණ ඒකකය 36

4.4 තොරතුරු තාක්ෂණ අංශය 36

4.5 සී/ස ඕෂන්වීව් ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගම 38

4.5.1 හැඳින්වීම 38

4.5.2 දැක්ම 38

4.5.3 මෙහෙවර 38

4.5.4 අරමුණු 38

4.5.5 සී/ස ඕෂන්වීව් ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය ... 38

4.5.6 සී/ස ඔෂන්විව් ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගමේ කාර්යමණ්ඩලය 38

4.5.7 කළමනාකාරිත්වයේ ප්‍රගති සමාලෝචනය 38

4.5.8 2017 ඉදිරි සැලසුම් 38

5. මූල්‍යමය ප්‍රකාශන

5.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 39
5.2 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය 40
5.3 ගිණුම් ප්‍රතිපත්ති 41
5.4 මූල්‍ය ප්‍රකාශනවල සටහන් 47

6. දිස්ත්‍රික් කාර්යාලය තොරතුරු

6.1 දිස්ත්‍රික් කාර්යාල ජාලය 74
6.2 දිස්ත්‍රික් කාර්යාල නම් හා ලිපිනයන් 75

7. විගණකාධිපති වාර්තාව **76**

සංඛ්‍යා සටහන්

පිටුව

1. පොදු

2. සංස්ථාපිත පාලනය

2.1 සමස්ත කාර්ය මණ්ඩල සංයුතිය 11

2.2 සැමට සෙවන නිවාස සංවර්ධන වැඩසටහන හා නිවාස ණය අයකිරීම් 11

3. මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

3.1 2016-12-31 දිනට නිවාස වැඩසටහන් ප්‍රගතිය 16

3.2 2016 වර්ෂයේ දී අලෙවි කර ඇති නිවාස සංඛ්‍යාව 17

3.3 2016 වසර තුළ ඉටුකර ඇති ව්‍යාපෘති, නගමු පුරවර. 2013 අවිච්ඡේද 18

3.4 නගමු පුරවර 2014 අවිච්ඡේද, (විශාල පරිමාණයේ ව්‍යාපෘති) 19

3.5 නගමු පුරවර 2014 අවිච්ඡේද, (කුඩා පරිමාණයේ ව්‍යාපෘති) 19

3.6 නගමු පුරවර නවීකරණ වැඩසටහන - 2016 20

3.7 අනෙකුත් ව්‍යාපෘති 21

3.8 මාණ්ඩලික නිවාස ණය අනුමත කර ඇති ආකාරය 25

3.9 මාණ්ඩලික නිවාස ණය අනුමත ප්‍රතිපාදන සහ වැය 25

3.10 බදු ඔප්පු නිකුත් කිරීම 27

3.11 ප්‍රධාන කාර්යාලය මගින් මෙහෙයවනු ලබන නඩු 27

3.12 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය "සැමට-සෙවණ" නිවාස සංවර්ධන වැඩසටහන - 2016 ... 29

4. මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

4.1 ඉලක්ක සපුරා ගැනීම 30

4.2 නිවාස සාප්පු / වාරික සහ කුලී අයකිරීම් ක්‍රියාකාරිත්වය - 2016 31

4.3 නිවාස ණය හා ග්‍රාමීය හා නාගරික කුලී 32

4.4 සෙවණ මාධ්‍ය සේවය 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආදායම් හා ලාභ 35

රූප සටහන්

2. සංස්ථාපිත පාලනය

2.1 ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය 10

4. මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

4.1 ණය අයකිරීම් 2001 - 2016 33

4.2 2016 වර්ෂය සඳහා සෙවණ මාධ්‍ය සේවය ආදායම් ඉලක්ක 36



සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලාංකික ජන සමාජයේ සෑම පුරවැසියෙකුටම නිවසක හිමිකම ලබාදීම උදෙසා මනාලෙසින් සැලසුම්ගතවූ, සැමට සෙවණ ජාතික නිවාස වැඩසටහනේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කාර්යයභාරය විධිමත් අයුරින් ඉටුකරලීමට දායක වූ වසරක් ලෙසින් 2016 වසර හඳුන්වාදිය හැකිවේ.

මෙම වසර සඳහා රුපියල් මිලියන 7,000 කට අධික භාණ්ඩාගාර මූල්‍ය ආයෝජනයක් සිදුකර ඇති අතර, එයට එක්වූ බාහිර පාර්ශවයන්ගේ සහාය හා දායකත්වය තුළින් නිවාස ප්‍රතිලාභීන් 125,000 කට අධික ප්‍රමාණයකගේ නිවාස සංවර්ධන කටයුතු සඳහා දායකවීමට මෙහිදි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමත්විය. දිවයින පුරා නව ආදර්ශ ගම්මාන ඉදිකිරීම් ක්‍රියාවලිය වඩාත් සාර්ථකව 2016 වසරේදී ජනගතවූ අතර, නිවාස පිළිසකර කිරිම හා හඳුන්වාදෙනු ලැබූ කපලාරු වැඩසටහන තුළින් පමණක් ප්‍රතිලාභ හිමිකරගත් පවුල් ප්‍රමාණය 75,000 කි. විසිරි නිවාසණය වැඩපිළිවෙළ, සම්පත් සෙවණ නිවාස වැඩසටහන,සෙවණ ආධාර නිවාස වැඩපිළිවෙළ සහ වැලිඔය තිරසාර ජීකාබද්ධ නිවාස සංවර්ධන වැඩපිළිවෙල හා වකුගඩු රෝගයෙන් පීඩාවට පත්වුවනට හඳුන්වාදුන් නව නිවාස වැඩසටහන තුළින් සමස්ත සමාජයේ නිවාස අවශ්‍යතාවයෙන් සැළකියයුතු පිරිසකට දායකවීමටත්, 2016 වසරේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියට හැකිවී තිබේ.

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්වය යටතේ මධ්‍ය ආදායම්ලාභීන්ගේ නිවාස අවශ්‍යතාවයට තිරසාර විසඳුමක් ලබාදීම සඳහා නව ජාතික වැඩසටහන හඳුන්වාදීම ද 2016 වසරේදී සිදුකරන ලදී.

මෙයට අමතරව ඉදිවන්නාවූ නිවාසයන්හි හිමිකම ලබාදීම උදෙසා විශේෂ අවධානයක් යොමුකළ කාලපරිච්ඡේදයක් ලෙසින් 2016 වසර හඳුන්වා දියහැකිවේ. ඒ අනුව 2016 වසරේදී පමණක් පවුල් 5,000 කට පමණ හිමිකම් හා බදු ඔප්පු ප්‍රදානය කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමත්විය.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමන් වෙතින් හිමිවූ වඩාත් ආදර්ශමත් හා ඵලදායි නායකත්වය හා මගපෙන්වීමත්, නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍ය ගරු ඉන්දික බණ්ඩාරනායක මැතිතුමන් වෙතින් හිමිවූ අනුග්‍රහය හා දායකත්වයත්, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් නිරන්තරයෙන් හිමිවූ මගපෙන්වීමත්, 2016 වසරේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාර්ථකත්වයට හේතුවූ අතර, එම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නොමඳ සහාය හා දායකත්වය සමගින් සාමාන්‍යාධිකාරි ප්‍රමුඛ ඉහළ කළමණාකාරිත්වය හා මේ සියළු ක්‍රියාකාරකම්හි ප්‍රමුඛතම ක්‍රියාකාරින් වන දිස්ත්‍රික් කළමණාකාරිත්වය හා සමගින් සමස්ථ කාර්යය මණ්ඩලය 2016 වසරේ නිවාසකරණයේ සියළු ජයග්‍රහණයන්හි හිමිකරුවන් බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

ලක්විජය සාගර පලන්සූරිය
සභාපති,
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.



සාමාන්‍යාධිකාරීතුමියගේ පණිවුඩය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා සටහනක් තැබීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව අතිශයින් මා සතුටු වෙමි. 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව එළිදක්වන්නේ 2015 වර්ෂයේ ආරම්භ කළ නිවාස සංවර්ධන උපාය මාර්ගවල සඵලදායකත්වය තහවුරු කරමිනි. පූර්ව වර්ෂයන් හා සසඳා බැලීමේ දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සුවිශේෂී ජයග්‍රහණ රැසක් අත්කරගත් වර්ෂයක් ලෙස සමාලෝචිත වර්ෂය කැපී පෙනේ.

නිවාස සංවර්ධනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පහසුකම් සපයන්නෙකු ලෙසින් සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය මත කුටුම්භ ඒකක 125,582 ක නිවාස සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂය තුළ දායක විය. ඒ අනුව භෞතික කාර්ය සාධනය 100% ක් සහ මූල්‍ය කාර්ය සාධනය 90% ළඟාකරගෙන ඇත. මධ්‍යම පාන්තික ප්‍රජාව සඳහා සහන මිලකට නිවාස ලබාදීම සඳහා පෞද්ගලික අංශය හා ඒකාබද්ධව නිවාස වැඩසටහනක් ආරම්භ කරන ලදී. රටේ පවතින නිවාස හිඟය සඳහා විසඳුමක් වශයෙන් තදාසන්න නාගරික ප්‍රදේශවල මෙම නිවාස ඉඳිවෙනු ඇත. හෝමාගම, අතුරුගිරිය, පානදුර සහ රාගම යන ප්‍රදේශවල මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති 04 ක් ආරම්භ කිරීමෙන් මෙම වැඩසටහන ක්‍රියාවට නංවා ඇත.

නිවාස සංවර්ධන ක්‍රියාවලිය හා සමගාමීව ප්‍රතිලාභී පවුල්වල දේපළ අයිතිය තහවුරු කිරීම සඳහා සින්නක්කර ඔප්පු හා බදු ඔප්පු ලබාදීමේ වැඩපිළිවෙලක් ද ක්‍රියාත්මක විය. එමෙන්ම, වසර ගණනාවක් තුළ අළුත්වැඩියා නොකරන ලද මහල් නිවාස සංකීර්ණවල පොදු පහසුකම් වැඩිදියුණු කිරීම ද මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද තවත් වැඩසටහනකි. වර්ෂය තුළ සමස්ථ නිවාස සංවර්ධන වැඩසටහනේ වියදම රුපියල් මිලියන 6,573.019 කි.

මූල්‍යතත්ත්වය

වර්ෂය තුළ ප්‍රාග්ධන සංචිතය රු.බි. 5.43 ක් ඉහළ ගොස් ඇති අතර, ජංගම නොවන වත්කම් ප්‍රමාණය රු.බි. 3.02 කින් වර්ධනය වී ඇත. දීර්ඝකාලීන ණය ප්‍රමාණය රු.බි. 1.22 කින් පහළ ගොස් ඇති අතර, ජංගම බැරකම් රු.මි. 309/- කින් අඩු වී ඇත. කාරක ප්‍රාග්ධන 20.5% ක් දක්වා ඉහළ ගොස් ඇත. මේ අනුව වර්ෂය තුළ මූල්‍ය ස්ථාවරත්වයක් අත්කර ගැනීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට හැකි වී ඇත.

මෙහෙයුම් ප්‍රතිඵල

වර්ෂය තුළ අධිකාරිය ලැබූ සමස්ථ ආදායම රු.බි. 2.740 සිට රු.බි. 4.707 දක්වා වර්ධනය වී ඇත. වියදමේ සාපේක්ෂ වැඩිවීම රු.බි. 3.498 සිට රු.බි. 4.467 කි. වර්ෂය තුළ ලැබූ ශුද්ධ ලාභය රු.මි. 240.302 කි. මෙය අධිකාරිය ලද සුවිශේෂී ජයග්‍රහණයක් වන අතර, ඉදිරි වර්ෂය තුළ ද මෙම ප්‍රවනතාවය පවත්වාගෙන යාමට අපේක්ෂා කෙරේ.

2016 වර්ෂයේ කාර්යසාධනය ඉහළ මට්ටමක පවත්වාගෙන යමින් ජයග්‍රහණ රැසක් අත්කර ගැනීමට කැපවීමෙන් ක්‍රියාකළ සමස්ථ සේවක ප්‍රජාවට ප්‍රණාමය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ඉංජි.එම්.එස්.වීරසිංහ,
සාමාන්‍යාධිකාරි,
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.

1

පොදු

1.1 හැඳින්වීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මගින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු කරගෙනයාම සඳහා ස්ථාපිත කර ඇත.

මෙම අධිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ නාගරික කාර්යාල 02 ක් මගින් දිවයින පුරා කටයුතු කරගෙන යනු ලැබේ.

අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුරක්ෂිත නිවසක් හිමිකර දීම.

අපගේ මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනතාවගේ විශේෂයෙන්ම නිවසක් සතුකර ගැනීමට මාර්ගයක් නොමැති අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ජාතික වශයෙන් උනන්දු කරවීම, පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම, එමගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම හා ආර්ථික සමෘද්ධිය ළඟාකර දීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරයි.

අරමුණු

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත අනුව අපගේ අරමුණු වන්නේ,

- මහල් නිවාස සහ වෙනත් වාසස්ථාන හෝ ගොඩනැගිලි ඉදිකිරීමෙහිලා කෙළින්ම නියුක්ත වීම.
- නිවාස හිඟය අඩුකිරීම පිණිස නිවාස සංවර්ධන යෝජනා ක්‍රම පිහිටුවීමට සැලසුම් සකස් කිරීම.
- මුඩුක්කු හා පැල්පත් සහිත ප්‍රදේශවලින් එම මුඩුක්කු සහ පැල්පත් ඉවත්කිරීම සහ ඒ ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනයට රුකුල්දීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවක් ක්‍රියාවේ යෙදවීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංවර්ධනය කිරීම
- නිවාස සංවර්ධනය සඳහා යම් තැනැත්තකුට ඉඩම් ලබාදීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවකට සමාන වන යම් ක්‍රියාකාරකමක නියුක්ත තැනැත්තන්ට මුදල් හෝ වෙනත් පහසුකම් සැපයීම.
- නිවාස සංවර්ධනයෙහි සියලු අංශවලට අදාළ වන ක්‍රියාකාරකම්වල නිරත වීම, ඒවාට අනුබලදීම සහ ඒ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
- ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියලුම ක්‍රියාකාරකම්වල යෙදීම.

පරමාර්ථ

- අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස ඉදිකර ගැනීම සඳහා පහසුකම් සැලසීම.
- අන්තදුගී පවුල්වලට නිවාස ඉදිකර ගැනීම සඳහා සහාය ලබාදීම.
- මුඩුක්කු සහ පැල්පත්වාසීන්ට නිවාස පහසුකම් සැලසීම සඳහා ඍජුව සම්බන්ධවීම හා සම්බන්ධීකරණය කිරීම.
- මධ්‍යම ආදායම් ඇති පවුල් සඳහා දැරියහැකි මිලකට නිවාස ඉදිකිරීම පිණිස අදාළ ඉදිකිරීමේ කටයුතු සිදුකරන්නන්හට පහසුකම් සැපයීම.
- නිවාස ඉදිකිරීමේ අරමුණ සඳහා ඉඩම් කැබලි ඍජු ව ලබාදීම හෝ පහසුකම් සැලසීම.
- නිවාසයක ජීවත්වීමේ අයිතිය ආරක්ෂා කිරීම.
- පැරණි නිවාස සංකීර්ණයන්වලට ජීවත්වීමට සුදුසු ප්‍රසන්න පරිසරයක් තහවුරු කිරීම.
- නාගරික අඩු ආදායම් පවුල්වලට නිවාස සපයා දීම.
- කාර්යක්ෂම ගුණාත්මක සහ ස්ථිරසාර සේවාවක් සැපයීම.

1

1.2 සංස්ථාපිත තොරතුරු

නම	: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
නෛතිකභාවය	: 1979 අංක 17 දරණ පනත
සංස්ථාපිත වර්ෂය	: 1979
ලියාපදිංචි කාර්යාලය	: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මහලේකම් කාර්යාලය සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත නො. 34, කොළඹ 02.
දුරකථන අංක	: 2421606, 2431707, 2430410, 2431722 2421748, 2380874
ෆැක්ස්	: 2434892
විද්‍යුත් තැපෑල	: chairman@nhda.lk
වෙබ් අඩවිය	: www.nhda.lk
විගණකවරු	: විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව
උපදේශන නීතිඥවරු	: නීතිපති නීතිපති දෙපාර්තමේන්තුව හල්ස්ඩෝෆ් කොළඹ 12
බැංකුකරුවෝ	: ලංකා බැංකුව ආයතනික ශාඛාව ඇව්ලන් චතුරශ්‍රය කොළඹ 01 මහජන බැංකුව, මූලස්ථාන ශාඛාව, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02

1

1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩලය අමාත්‍යතුමා විසින් පත්කරන ලද සාමාජිකයන් 6 දෙනෙකුගෙන් සහ මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ලෙස තවත් සාමාජිකයෙක්ගෙන් සමන්විත වන අතර පත්කරනු ලැබූ සාමාජිකයන්ගෙන් එක් අයෙක් සභාපති ලෙස අමාත්‍යතුමා විසින් පත්කරනු ලැබේ.



සභාපති
එල්. එස්. පලන්සූරිය මහතා
නො. 06, සුදර්ශන පාර,
හීල් වීදිය, දෙහිවල



උපසභාපති
කරුණාරත්න අතුකෝරල මහතා,
නො. 158, දික්හේනපුර,
මූනගම, හොරණ



ක්‍රියාකාරී අධ්‍යක්ෂ
කේ. ජී. වික්‍රම මහතා,
නො. 56/ඒ, උඩුමුල්ල පාර,
බත්තරමුල්ල.



සාමාජික
ශාන්ත ජයවර්ධන මහතා,
නො. 159/5, ධර්මපාල මාවත,
පොල්ලත්තපිටිය,
දඹුල්ල පාර,කුරුණෑගල.



සාමාජික
ආර්. ඒ. චූලනන්දා මහත්මිය,
(අතිරේක ලේකම්)
නො. 17/43, 05 වන පටුමග,
පුබුදු මාවත,මත්තේගොඩ.



සාමාජික
එස්. එම්. දයාරත්න මහතා,
නො. 18/3 ඒ,
බලපොකුණ පාර,
කිරුලපන.



සාමාජික
අමල් වික්‍රමතුංග මහතා,
නො. 134/එෆ්,
නාගහවත්ත පාර,
දළුගම, කැලණිය.
(2016.12.23 දින සිට)

සාමාජික
නීතිඥ පී.එස්. පුංචිහේවා මහතා,
"ශාන්ති", පන්සල පාර,
මුල්කිරිගල.
(2015.05.02 දින සිට
2016.12.22 දින දක්වා)

1

1.4 සංස්ථාපිත කළමනාකරණය

එම්.එස්.විරසිංහ මහත්මිය
සාමාන්‍යාධිකාරි/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)

පී.එම්.එල්.පී. එදිරිසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ හා පාලන)
වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු ප්‍රචාරක)
(2016.10.14 දින සිට)

ඊ.ඒ.ඩී.එස්. එදිරිසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)

ඩබ්.ඒ.ඩී. සරත් කුමාර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දේපළ කළමනාකරණ හා අලෙවි)

ඩබ්. ධනවන්ද්‍ර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා ප්‍රගති)

කේ.ඒ. ජානක මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිවාස සංවර්ධන)

කේ.ඩබ්.ඒ. ධර්ම ශ්‍රී කාරියවසම් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු හා ප්‍රචාරක)
(2016.10.13 දින දක්වා)

ඒ.කේ. පුෂ්පා රෝහිණී මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)

ආර්.එම්.යූ.ඩබ්. රත්නායක මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

නීතිඥ ධනුෂ්ක මාලින්ද ජයලත් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
(2016.11.20 දින දක්වා)

නීතිඥ මනෝරි ටී.ඔලබොඩුව
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
(2016.11.21 දින සිට)

1.5 අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම්

අපගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ.

1.ණය හා ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- අඩු ආදායම්ලාභීන් සඳහා සහනදායී පදනමට ණය පහසුකම් ලබාදීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශය හා ස්ථාවර ආදායම් ලබන පවුල් සඳහා ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- අඩු ආදායම්ලාභීන් සඳහා ණය ආධාර නිවාස ව්‍යාපෘති ඉදිකිරීම.
- දිළිඳු පවුල් සඳහා නිවාස ඉදිකිරීමට මූල්‍ය ආධාර ලබාදීම.
- නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති සඳහා ණය හා ආධාර ලබාදීම.

2. රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශය හවුල්ව නිවාස ඉදිකිරීම වර්ධනය කිරීම.

- යෝග්‍ය භූමි හඳුනාගැනීම.
- කැමති පාර්ශවයන් කැඳවීම.
- සුදුසු සංවර්ධකයින් සමඟ සාකච්ඡා කිරීම සහ යෝජනා ලබාගැනීම.
- යෝජනා ඇගයීම සහ සංවර්ධකයින් තෝරාගැනීම.
- ව්‍යාපෘති සැළසුම් නිර්මාණය කිරීම.
- අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.
- ඒකාබද්ධ සමාගම් ඇතිකිරීම.
- ක්‍රියාත්මක කිරීම, පාලනය කිරීම සහ තත්ත්වය සහතික කිරීම.
- අලෙවිකරණය සහ නිවාස විකුණුම්.
- කළමනාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.

3. නිවාස ඉදිකිරීම් හා සහාය සේවා සැපයීම.

- නිවාස යෝග්‍යතා අධ්‍යයනය කිරීම.
- ප්‍රජාව දැනුවත් කිරීම සහ සංවිධානය කිරීම.
- ප්‍රජා සංවර්ධන සංවිධාන නිර්මාණය කිරීම.
- නිවාස ඉදිකිරීම් සඳහා අවශ්‍ය තාක්ෂණ සහාය ලබාදීම.
- අඩු පිරිවැය ඉදිකිරීම් තාක්ෂණ ක්‍රමයන් ගැන තොරතුරු ව්‍යාප්ත කිරීම.
- අවශ්‍යතාවය මත මූල්‍යමය සහාය සැපයීම.
- ඉදිකිරීම් වල තත්ත්වය / අනුකූලතාවය සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීම.
- යටිතල පහසුකම් ඇති කිරීම / සම්බන්ධතාවය පැවැත්වීම.

4. නාගරික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම (නිවාස ව්‍යාපෘති).

- යෝග්‍ය ස්ථාන හඳුනාගැනීම.
- මැනුම් කටයුතු සිදුකිරීම.
- මූල්‍යමය හැකියා මට්ටම් තීරණය කිරීම.
- සැලසුම් පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.
- අයිතිය පැවරීම.

5. නගමු පුරවර (මහල් නිවාස ප්‍රතිසංස්කරණය) වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

- පැරණි මහල් නිවාස ක්‍රමවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- මහල් නිවාස අළුත්වැඩියා කිරීම.
- මහල් නිවාසවල සිටින ජනතාවගේ අධ්‍යාත්මික ගුණධර්ම වැඩිදියුණු කර අලංකාර ජනාවාස බවට පත්කිරීම සඳහා ක්‍රීඩාපිටි, ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථාන, උද්‍යාන අලංකාරකරණය, බුදුමැඳුරු අලුතින් ඉදිකිරීම.

6. ඉඩම් කට්ටි ලබාදීම.

- යෝග්‍ය භූමි හඳුනාගැනීම.
- යෝග්‍යතා අධ්‍යයනය කිරීම.
- කැබැලි සැළසුම් පිළියෙල කිරීම
- අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- ඉඩම්ලාභීන් හඳුනාගැනීම සහ තෝරාගැනීම.
- අවශ්‍ය නම් ණය දෙන ආයතන සමඟ සම්බන්ධතාවය ඇතිකර ගැනීම.
- තෝරාගත් ඉඩම්ලාභීන්ට ඉඩම් කට්ටි පැවරීම.

7. ණය අයකිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ණය හා කුලී ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- වාර්ෂික ඉලක්ක ලබාදීම, ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම, ඊට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මාසික ප්‍රගති සමාලෝචනය කිරීමට හා ඒවායේ දුර්වලතා හඳුනාගෙන පිළියම් යෙදීම.
- අයකිරීම් නියෝජිතයන් හා අයකිරීම් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආදායම් ප්‍රවර්ධන වැඩසටහන තුළ දක්වන දායකත්වය ඇගයීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1

8. නිවාස සම්බන්ධ උපදේශන සේවා

- දිස්ත්‍රික් නිවාස උපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- යෝග්‍යතා වාර්තා සකස් කිරීම.
- අවශ්‍ය අවස්ථාවේ දී සැළසුම් සැපයීම.
- ප්‍රමාණ/ද්‍රව්‍ය ලැයිස්තු/පිරිවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීම.
- සැළසුම් සඳහා අනුමැතියක් ලබාගැනීම.
- ඉදිකිරීම් අධීක්ෂණය සහ තත්ත්ව සහතික වීම.
- ඉදිකිරීම් දත්ත බැංකුවක් පවත්වාගෙන යාම.

9. අඩුපිරිවැය ඉදිකිරීම් තාක්ෂණික ක්‍රම ප්‍රචලිත කිරීම.

- අදාළ පෞද්ගලික හා රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධතාව පැවැත්වීම සහ තොරතුරු ද්‍රව්‍ය සාම්පල ආදිය රැස්කිරීම.
- උපදේශක මධ්‍යස්ථාන මගින් නව තාක්ෂණික ක්‍රම හා ද්‍රව්‍ය හඳුන්වාදීම.

10. නිවාස ක්‍රමවල පොදු ප්‍රදේශ, එහි යටිතල පහසුකම් සහ සේවාවන් සහිතව පළාත් අධිකාරියට පැවරීම.

- පොදු ප්‍රදේශ / විවෘත ස්ථානවල මායිම් සළකුණු කිරීම.
- මිනින්දෝරු සැළසුම් පිළියෙළ කිරීම.
- පළාත් අධිකාරියෙන් එකඟතාව ය ලබාගැනීම.
- ඔප්පුවක් මගින් දේපළ පැවරීම.
- නිවාස හිමියන්ට දැනුම්දීම.

11. කුසලතා වර්ධනය සඳහා පුහුණුව.

- වෘත්තීය ආයතන සහ නියෝජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කර පුහුණුසැසි සංවිධානය කිරීම.
- වෘත්තීය පුහුණු අවස්ථා සැකසීම.
- මූලික උපකරණ සහාය සැපයීම.
- ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම.
- වාසිදායී රැකියා සඳහා උපකාරවීමට දත්ත බැංකුවක් තුළ පවත්වාගෙන යාම.
- කුසලතා ඇති පුද්ගලයන්ගේ තොරතුරු නාමාවලියක් පවත්වාගෙන යාම.

12. නිවාස තොග සම්බන්ධව දත්ත පවත්වාගෙන යාම.

- ග්‍රාම නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධීකරණය සහ දත්ත රැස්කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උපදේශන
- මධ්‍යස්ථාන සමඟ සම්බන්ධීකරණය සහ දත්ත ඒකරාශි කිරීම.
- පළාත් අධිකාරි සමඟ සම්බන්ධීකරණය සහ දත්ත රැස්කිරීම.
- දිස්ත්‍රික් නිවාස කමිටුව වෙත දත්ත ඉදිරිපත් කිරීම.
- කමිටුව බාරගත් දත්ත පෙළගැස්වීම.
- දත්ත, අර්ධ වාර්ෂික ව දත්ත බැංකුව වෙත ඉදිරිපත් කිරීම.
- අනාගත සැළසුම් සඳහා දත්ත භාවිතයට ගැනීම.

2

සංස්ථාපිත පාලනය

ආයතනික පාලනයේ උසස් මට්ටම දක්වා ගමන් කිරීම සඳහා දැඩි නොනවතින කැපවීමක් අප සතුව ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය ආදී ආයතන මගින් යෝජනා කරන ලද සුදුසුම කටයුතු අනුගමනය කිරීමට සැමවිට උත්සාහ කරන අතර අපව වර්ගීකරණයට ලක්කර ඇති අප අමාත්‍යාංශය මගින් ලබාදෙන ලද නිර්ණායකයන්ට අනුකූලව කටයුතු කරයි.

2.1 අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීම්.

අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මාසයකම රැස් වේ. අයවැයට සාපේක්ෂව ප්‍රගතිය සෑම මසකම එමගින් සමාලෝචනය කරයි. විචලනයන් හඳුනාගෙන ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා සුදුසු ප්‍රතිකර්ම යොදයි. වසර තුළ රැස්වීම් වාර 18 ක් පවත්වන ලදී.

2.2 විගණන සහ කළමනාකරණ කමිටුව.

සාමාන්‍යාධිකාරිවරයා සහ අධ්‍යක්ෂවරු 03 දෙනෙකුගෙන් විගණන සහ කළමනාකරණ කමිටුව සමන්විත වේ.

2016 වර්ෂයේ පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් හා බාහිර නිලධාරීන් විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන් ලෙස සේවය කර ඇත.

1. එස්.එම්.දයාරත්න මහතා - **සභාපති**
   (අධ්‍යක්ෂ මුදල් අමාත්‍යාංශය)
2. කේ.අතුකෝරළ මහතා - **සාමාජික**
   (උප සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
3. නීතිඥ ජී.එස්.පුංචිහේවා මහතා - **සාමාජික**
   (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
4. ආර්.එස්.සමරක්කොඩි මහතා - **සාමාජික**
   (ප්‍රධාන අභ්‍යන්තර විගණක - නිවාස අමාත්‍යාංශය)
5. එස්.සංජීව මහතා- **සාමාජික**
   (විගණන අධිකාරි - රජයේ විගණන)

විගණන සහ කළමනාකරණ කමිටුව මගින් ගිණුම් හා මූල්‍ය කළමනාකරණ ක්‍රමයේ මනා පැවැත්ම සහතික කෙරෙන අතර ගිණුම් ප්‍රමිතීන් ට අදාළ නීති-රීති අනුව අභ්‍යන්තර පාලනයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ.

2016 වසර තුළ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වාර 06 ක් පවත්වා ඇත.

2.3 ප්‍රගති සමාලෝචන රැස්වීම්.

ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සභාපති, උපසභාපති, ක්‍රියාකාරි අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරි, හා සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරුන්ගේ සහභාගිත්වයෙන් සතිපතා ද, දිස්ත්‍රික් කළමනාකරුවන්ගේ සහභාගිත්වයෙන් මාසිකව ද, ආයතනයේ කටයුතු පිළිබඳව ප්‍රගතිය සමාලෝචනය කරනු ලබයි.

2.4 අභ්‍යන්තර පාලනය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම ආයතනයේ වත්කම්වල සුරක්ෂිතභාවය සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ උපදේශනයන් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම ක්‍රමෝපායන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සතු වගකීමකි.

ඒ හා සමානව අධ්‍යක්ෂක මණ්ඩලය මනාව සැකසුණු මාසික වාර්තා කරන ක්‍රමයක් තුළින් අභ්‍යන්තර පාලනය සහතික කරන අතර වත්කම් හා බැරකම් අතර සමබරතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගනු ලැබේ.

සතිපතා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන අතර සියලු ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කොට්ඨාශවල කටයුතු පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. මිල කමිටු, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු, දේපළ අනුකමිටු හා අභියාචනා කමිටු පත්කිරීම සඳහා ද පියවර ගෙන ඇත.

2.5 විධායක කළමනාකරණය.

ප්‍රධාන කාර්යාලයේ සෑම අංශයකම ප්‍රධානත්වය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු දරණ අතර, දිස්ත්‍රික් කාර්යාල 25 ක් සමඟ නගර කාර්යාල 02 ක වගකීම ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු/දිස්ත්‍රික් කළමනාකරු සතු වේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් සහ ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරුවන්/දිස්ත්‍රික් කළමනාකරුවන් සාමාන්‍යාධිකාරි වෙත වාර්තා කළ යුතු අතර, ප්‍රධාන විධායක නිලධාරි වන සාමාන්‍යාධිකාරි විසින් සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතු ය.

2

2.6 අවදානම් කළමනාකරණය

විශාල සේවාදායකයන් සමූහයකට සියලුම පහසුකම් සහිත නිවාස පහසුකම් සපයන සහ දිවයින පුරා ව්‍යාප්ත වූ ප්‍රාදේශීය කාර්යාල 25 කින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එහි විවිධ හවුල්කාරයින්ගේ අවශ්‍යතා රැකගැනීම සඳහා මූල්‍යමය සහ මූල්‍යමය නොවන අවදානම් රාශියකට මුහුණ දීමට සිදුවන අතර, එය පූර්ව කළමනාකරණය කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියලු ම ව්‍යාපාරික අරමුණු ළඟාකර ගැනීමට, එහි සංස්ථාපිත කළමනාකාරිත්වය උපදෙස් මත ප්‍රතිපත්තීන්, ක්‍රියාමාර්ග සහ අවදානම් කළමනාකරණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහයන් ගොඩනැගීම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරයි. එමඟින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියලුම ව්‍යාපාරික අරමුණු ලඟාකර ගැනීම සිදුකරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආපදාවට ලක්වීම කෙරෙහි බලපාන ක්‍රියාදාමයන් සහ පාලනය කළ හැකි පද්ධතීන්වල දුර්වලතා හඳුනාගැනීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාදාමය අධිකාරියේ විගණන අංශය සමඟ සම්බන්ධ වී කටයුතු කරයි. කාර්යක්ෂමතාවය සහ පාලනමය තත්ත්වයේ ප්‍රමාණාත්මතාවය පිළිබඳව ස්වාධීන අදහස් කාලානුරූපීව කළමනාකරණය වෙත පළකිරීම විගණන අංශය මගින් සිදුකරනු ලැබේ.

2.6.1 ද්‍රවශීල අවදානම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගිවිසුම් සඳහා වූ බැඳීම් නියමිත කාලය තුළ දී ඉටුකිරීමට නොහැකි වූ විට මෙම අවදානමට ගොදුරු වේ. ඒවා හි කාලය ඉකුත් අවස්ථාවල දී මූල්‍යමය වගකීම් ඉෂ්ට කිරීම සඳහා අරමුදල් තිබීම සහ අවශ්‍යතා පැනනැගුණ අවස්ථාවල දී ඒවායෙහි ප්‍රයෝජන ලබාගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන තිබෙන බව තහවුරු කිරීම මෙහි ඇතුළත් වේ.

සැළසුම්කරණය සඳහා මගපෙන්වීම, ක්‍රමවත් අවශ්‍යතාවන්ට අනුව කටයුතු කිරීම් ගිවිසුම් බැඳීම් සහ වර්ධන අපේක්ෂාවන් සඳහා මුහුණදීමට අවශ්‍ය ප්‍රමාණවත් ද්‍රවශීලි බවක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුවන බව තහවුරු කිරීම ආදී ප්‍රධාන කරුණු අධ්‍යක්ෂක මණ්ඩලයට සහ සංස්ථාපිත කළමනාකරණයේ සාමාජිකයන් වෙත කළමනාකරණය සඳහා පවරා දී ඇත.

- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය එය සතු ප්‍රධාන අරමුණු ළඟාකර ගැනීම සඳහා, මුදල් ඉපයීම සම්බන්ධ විකල්ප මාර්ග ප්‍රමාණවත් ලෙස තහවුරු කිරීම.
- පවත්නා ණය ආයෝජන සහ මුදල් ඉපයීමේ ක්‍රියාමාර්ග කාලානුරූපීව නැවත සළකා බැලීම.
- පවතින මිල ගණන් සමාලෝචනයට ලක්කරන අතරම, තරඟකරුවන්ගේ මිල ගණන් විශ්ලේෂණයක් සිදුකිරීම.
- සංස්ථාපිත නිර්ණායකයන්ට අනුකූලව ද්‍රවශීලි අනුපාත සඳහා මඟපෙන්වීම.

ප්‍රධානයන්, අභ්‍යන්තර උපයන අරමුදල් හා මුදල් බවට පත්කළ හැකි කෙටිකාලීන ආයෝජන පාලනය කිරීම තුළින් ද්‍රවශීලිතාවය පවත්වා ගෙනයාම දෛනිකව කරනු ලැබේ.

2.6.2 වෙළෙඳපොළ අවදානම

මිල සංවේදී වත්කම් හා බැරකම් පවත්වා ගෙනයාමේ දී පැනනගින පාඩුවන් හා සම්බන්ධව මෙම අවදානම ප්‍රධාන වශයෙන් පොලී අනුපාතයන්ගේ වෙනස්වීම් සහ කාලයත් සමඟ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල දෝලනය වීම හේතුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත මෙය බලපානු ලැබේ.

නිවසක් අවශ්‍ය සෑම පුද්ගලයෙකුටම නිවසක් සතු කිරීමට රජය මගින් ලබා දෙන මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙළෙඳපොල අවදානමට මුහුණදීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සිදු වේ.

සංස්ථාපිත කළමනාකරණ අරමුණු ලඟාකර ගැනීමට දායකව කටයුතු කරන අනෙකුත් ප්‍රධාන හවුල්කාර ආයතනයන්ගේ අවශ්‍යතාවයන් සහ සේවාදායකයන්ගේ මුදලට සරිලන සේවාවක් සඳහා වටිනාකමක් සපයා දෙමින් නිවාස වෙළෙඳපොළට එල්ල වී ඇති තර්ජනයන් උපරිමයෙන් පාලනය කර ගැනීම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිදුකරනු ලැබේ.

2.6.3 මෙහෙයුම් අවදානම

බාහිර තරඟකාරී බලවේගයන්ට මුහුණදීමට අපහසු හෝ ක්‍රියාකාරකම්වලට බාධාවන් පමුණුවන අභ්‍යන්තර දුර්වලතා නිසා ප්‍රමාණවත් නොවන හෝ අභ්‍යන්තර ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මෙම අවදානම් ඇති වේ.

සංවිධානය තුළ යහපත් සහ මනා ලෙස පාලනය කරන ලද ක්‍රියාකාරී පරිසරයක් ලබාදීම සඳහා සැකසුණු ව්‍යුහයන් සහ පුළුල් ප්‍රතිපත්තීන් සහිත පද්ධතියක් අවදානම් පාලනය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවත්වා ගෙන යනු ලැබේ.

ඵලදායී ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය සඳහා විශේෂ පියවර කීපයක් ගෙන ඇත.

- තොරතුරුවල සුරක්ෂිතභාවය ආරක්ෂාකරමින් සියලුම දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් කාලානුරූප දත්ත එකතුවන් වාර්තාකරණය සහ පිළියෙල කිරීම.
- තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තීන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්.

- **නිවාස වැඩසටහන් නිරතුරුවම සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම.**
- **ණය නැවත අයකිරීමේ වැඩසටහන්වල ක්‍රියාකාරිත්වය.**

මෙහෙයුම් අවදානම පාලනය කිරීම මධ්‍යම කළමනාකරණයේ ප්‍රධානම වගකීම වේ. පාලිත පරිසරයන්හි අනන්‍යභාවය පවත්වා ගැනීම සඳහා මුදල්, විගණන හා අනිකුත් සහායක සේවා අංශ මගින් මහඟු කාර්යයක් ඉටුකරයි.

වටිනා දේපළ ප්‍රමාණයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව ඇති හෙයින් යෝග්‍ය උපක්‍රම භාවිතා කිරීම සහ නිරන්තර සමාලෝචනය සහ කාර්යය මණ්ඩලයේ කැපවීම මගින් තරඟකාරී පරිසරය තුළ දී සාර්ථකත්වය ළඟාකර ගැනීම අපේක්ෂා කළ හැකි ය.

2.7 පාරිසරික ගැටලු


ගොඩනැගිලි ඉදිකිරීම පරිසර පද්ධතිය කෙරෙහි කිහිප ආකාරයකින් බලපානු ලැබේ. මෙම බලපෑම සභාධිපත්‍ය ගොඩනැගිලි සහ නිවාස ක්‍රමවල වඩාත් පැහැදිලිව දක්නට ලැබේ. පරිසර සංරක්ෂණ සංවර්ධන ක්‍රියාදාමයේ වැදගත් අංගයක් ලෙස විදහා දැක්විය හැකිය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජනතාවට සුරක්ෂිත සහ යහපත් පරිසරයක් සපයා දෙනු ලැබේ. ඒ අතරම පානීය ජලය, ප්‍රමාණවත් පිවිසුම් මාර්ග, අඛණ්ඩ විදුලි සැපයුම, වැසි ජලය සහ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධති, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වැනි යටිතල පහසුකම් ද සපයනු ලැබේ.

2

2.1 රූප සටහන

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සංවිධාන ව්‍යුහය



2.1 සංඛ්‍යා සටහන

2016.12.31 දිනට සමස්ත කාර්ය මණ්ඩල සංයුතිය

අනු අංකය	සේවා මට්ටම	අනුමත සංඛ්‍යාව	භෞතික සංඛ්‍යාව
01	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ	115	88
02	තෘතිය කළමනාකරණ	157	301
03	ද්විතීය	899	1405
04	ප්‍රාථමික	205	349
	එකතුව	**1376**	**2143**

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

2.2 සංඛ්‍යා සටහන

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

සැමට සෙවණ නිවාස සංවර්ධන වැඩසටහන - 2016

වැඩසටහන	ආරම්භ කිරීම	මූල්‍ය රු.මි
1. භාණ්ඩාගාර අරමුදල්		
1.1.ආදර්ශ ගම්මාන	4,641	1,079.172
1.2.විසිරි නිවාස	34,619	3,563.45
1.2.1.උදාකළ ගම්මාන	1,180	135.633
1.2.2.වැන්දඹු නිවාස	158	11.445
1.2.1.වකුගඩු රෝගී නිවාස	700	74.560
1.3.කපලාරු නිවාස	77,509	641.899
1.4.වැලි ඔය විශේෂ ව්‍යාපෘතිය	1,084	310.845
2.අභ්‍යන්තර අරමුදල්		
2.1.සම්පත් සෙවණ නිවාස	3,729	271.506
3.අධාර නිවාස		
3.1.සෙවණ අධාර නිවාස	118	9.910
3.2.සෙවණ ගම්මාන	896	23.815
4.වෙනත් අරමුදල් භාහිර අරමුදල්	10	0.435
4.1.මධ්‍යම පාන්තික නිවාස	672	
එකතුව	**125,316**	**6122.77**
5.පැරණි නිවාස ක්‍රම නවීකරණය		**240.000**
6.අවිච්ඡේද වැඩසටහන	**266**	**190.726**
එකතුව	**125,582**	**6553.400**
6.ඔප්පු නිකුත් කිරීම		
6.1.සින්නක්කර ඔප්පු		1851
6.2.බදු ඔප්පු		7599

	ඉලක්කය	ළඟාවීම	ප්‍රතිශතය
නිවාස ණය අයකිරීම්	7250.778	4121.206	57%

3

මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

නිවාස සංවර්ධන කොට්ඨාශය

3.1 2016 - නිවාස සංවර්ධන වැඩසටහන

දිවයින පුරා විසිරී සිටින නිවාස හා ඉඩම් කොටසක දැහිමිකමක් නොමැති දරු පවුල් ඉලක්ක කර ගනිමින් එම පවුල් වෙනුවෙන් තිරසාර නිවාස ඉදිකරදීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලැබූ සැමට සෙවණ නිවාස වැඩසටහන යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශවල ජීවත් වන නිවාස ගැටලුවලට මුහුණපා සිටින දරු පවුල් වෙනුවෙන් නිවාස පහසුකම් සපයාදීමේ අරමුණ ඇති ව 2016 වසර තුළ දී ක්‍රියාවට නංවන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

01. සැමට සෙවණ විසිරි නිවාස වැඩසටහන.
02. සැමට සෙවණ ආදර්ශ ගම්මාන වැඩසටහන.
03. සම්පත් සෙවණ වැඩසටහන.
04. වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස ණය සැපයීම.
05. සැමට සෙවණ උදාකළ ගම්මාන වැඩසටහන.
06. කපලාරු කිරීමේ වැඩසටහන.
07. සෙවණ ආධාර වැඩසටහන.
08. අනුග්‍රාහක ආයතන පරිත්‍යාග අරමුදලින් සෙවණ ආධාර ආදර්ශ ගම්මාන වැඩසටහන.
09. වැලිඔය විශේෂ නිවාස වැඩසටහන.
10. වකුගඩු හා අන්ත දිළිඳු නිවාස වැඩසටහන.

01.සැමට සෙවණ විසිරි නිවාස ණය වැඩසටහන

සමස්ත දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක මට්ටමින් විසිරි වශයෙන් නිවාස ඉදි කිරීම පෙරදැරි කර ගෙන ඉඩමක් හිමි ජනතාවට නව නිවසක් ඉදිකර ගැනීමට සහ තිබෙන නිවස වැඩිදියුණු කරගැනීම සඳහා මෙම නිවාස වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. මෙහි ප්‍රධාන අරමුණ ප්‍රතිලාභියාට ලබාදෙන ණය මුදලට අමතරව ප්‍රතිලාභියාගේ ද දායකත්වය තුළින් වැඩි වටිනාකමින් යුත් නිවාස ඉදිකරමින් නිවාස සංවර්ධනයට දායකවීමයි. 2016 වසරේ ඉලක්ක ගත නිවාස සංඛ්‍යාව 26,000 ක් වන අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන රුපියල් මිලියන 3,687.50 ක් වෙන්කර ඇත. මෙම වැඩසටහන යටතේ ඉදිකරන නව නිවසක් ඉදිකිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත උපරිම රු. 350,000/- ක ණය මුදලක් ද වැඩිදියුණු නිවසක් ඉදිකිරීම සඳහා රු. 262,500/- ක උපරිම ණය මුදලක් ලබා දෙන අතර නිකුත් කරන ලද ණය මුදල අනුව 3.732 % සිට 6% දක්වා වාර්ෂික පොළී පරාසයක් තුළ උපරිම වසර 10 ක කාල සීමාවක් දක්වා මාසික වාරික වශයෙන් ගෙවීමේ පදනම යටතේ මාසික ආදායම රු. 35,000/- ක් හෝ ඊට අඩු ආදායම් සහිත ප්‍රතිලාභීන් වෙනුවෙන් ණය මුදල් නිකුත් කරන ලදී.

මෙහිදී, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ප්‍රතිලාභියාට නිවස ඉදිකර ගැනීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන අතර සහභාගිත්ව සංවර්ධන පදනම මත ප්‍රතිලාභියාගේ ද දායකත්වය මත තම නිවස ඉදිකර ගැනීමට අවස්ථාව සළසා දී ඇත. නිවාස 34,619 කට රු.මිලි. 3,563.45 ණය මුදල් නිදහස් කර ඇති අතර මෙයින් නිවාස 17,715 ක වැඩ නිමකර ඇත. ඉතිරි ප්‍රතිපාදන යොදවා නිමනොකළ නිවාස 2017 වසර තුළ නිමකිරීමට නියමිතය. මෙම වැඩසටහන යටතේ වැන්දඹු හා කාන්තාවන් 158 ක් සඳහා නිවාස ඉදිකර ගැනීමට සහය ලබා දීම විශේෂිත වේ.



සැමට සෙවණ විසිරි නිවාස වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් වෙත ඔප්පු ප්‍රදානය කිරීම.

02.සැමට සෙවණ ආදර්ශ ගම්මාන වැඩසටහන

දිවයින පුරා පදිංචි නිවාස හා ඉඩම් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා ස්ථිර නිවාස ලබාදීමේ අරමුණ ඇතිව මෙම ආදර්ශ ගම්මාන වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. සුදුසු ප්‍රතිලාභීන්ට ඉඩම් කැබලි ලබා දී මූල්‍ය සහාය හා තාක්ෂණික සහාය ලබා දෙමින් නව නිවාස ඉදිකර මූලික යටිතල පහසුකම්වලින් සමන්විත අංග සම්පූර්ණ ගම්මානයක් ලෙස ජනතා අයිතියට පත්කිරීම ප්‍රධාන අරමුණ වේ.

නිවාස 25 ක් හෝ එයට වැඩි සංඛ්‍යාවක් නිවාස ඉදිකළ හැකි ඉඩම් තෝරා ඉඩම් කච්චේරි ක්‍රමයෙන් තෝරාගත් ප්‍රතිලාභී පවුල් වෙත ඉඩම් කැබලි ලබාදීම ප්‍රාදේශීය ලේකම්ගේ මූලිකත්වයෙන් සිදු වේ. **ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ප්‍රතිලාභියාට නිවස ඉදිකර ගැනීමට ණය මුදලත් හා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන අතර සහභාගිත්ව සංවර්ධන පදනම මත ප්‍රතිලාභියාගේ ද දායකත්වය මත තම නිවස ඉදිකර ගැනීමට අවස්ථාව සළසා දී ඇත. ඉලක්කගත නිවාස සංඛ්‍යාව 4,500 ක් වන අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන රුපියල් මිලියන 1,125 ක් වෙන් කර ඇත.**

නිවාස 4,641 ක වැඩ ආරම්භ කර නිවාස 259 ක් වසර අවසන් වන විට නිමකර ඇත. රු.මිලි. 1,079.172 ක ණය මුදල් නිදහස් කර ඇති අතර ඉතිරි ප්‍රතිපාදන යොදවා නිමනොකළ නිවාස 2017 වසර තුළ නිමකිරීමට සැළසුම් කර ඇත.



සැමට සෙවණ ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ සංහිඳගම ආදර්ශ ගම්මානය ජනතා අයිතියට පත්කිරීම.



හම්බන්තොට දිස්ත්‍රික්කයේ සොබාසෙත්ගම ආදර්ශ ගම්මානය විවෘත කිරීමේ උත්සවයට එක් වෙමින් ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් පාසල් දරු දැරියන් වෙත ත්‍යාග ප්‍රදානය කිරීම.



ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ දයාපුර ආදර්ශ ගම්මානය ජනතා අයිතියට පත්කිරීම.

3

03. සම්පත් සෙවණ වැඩසටහන

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පෙර වර්ෂවල දී දිවයින පුරා ලබා දී ඇති නිවාස ණය අයකිරීමෙන් ඒ ඒ කාලවකවානු තුළ උපයන ලද මුදලින් මෙම වැඩසටහන වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කෙරේ. මේ යටතේ පහත සඳහන් වැඩසටහන් සඳහා ණය මුදල් සැපයීම සිදු වේ.

සැමට සෙවණ ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ ඇතැම් ප්‍රතිලාභීන් ට නිවාස ඉදිකර ගැනීමට අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන නිවාස ණය මුදලක් ලෙස ලබාදීම.

සැමට සෙවණ විසිරි නිවාස ණය වැඩසටහන යටතේ ඇතැම් ප්‍රතිලාභින්ට නිවාස ඉදිකර ගැනීමට අවශ්‍ය ණය මුදල් සැපයීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මෙම වැඩසටහන යටතේ නිවාස ඉදිකර ගැනීමට ණය මුදල් සැපයීම සිදු කරන ලදී.

මෙම වැඩසටහන යටතේ 2016 වසර තුළ ප්‍රතිලාභීන් 3729 ක් සඳහා ණය මුදල් සැපයීම සිදුකර ඇති අතර මෙයින් නිවාස 2145 නිමි නිවාස බවට පත්කර ඇත. මේ සඳහා අභ්‍යන්තර උත්පාදන රු.මිලි. 271.506 ක් වැය කර ඇත.

- **වැන්දඹු කාන්තාවන් සඳහා විසිරි නිවාස නිවාස ණය සැපයීම**

මෙම වැඩසටහන යටතේ වැන්දඹු කාන්තාවන් 44 දෙනෙකු සඳහා ඔවුන්ගේ නිවාස ඉදි කර ගැනීමට සහාය ලබා දී ඇති අතර ඉන් නිවාස 25 ක වැඩ අවසන් කර ඇත.

04. සැමට සෙවණ උදාකළ ගම්මාන වැඩසටහන

දිවයින පුරා විසිරි සිටින ඉඩමක් හිමි එම ඉඩම්වල අර්ධ වශයෙන් ඉදිකළ නිවාස නිමි නිවාස බවට පත්කර ගැනීමට හා පවතින නිවාස වැඩිදියුණු කරගැනීමට අවශ්‍යතාවය ඇති සහ නව නිවාස ඉදිකිරීමට අවශ්‍යතාවය ඇති ගම්මානවල ජන කොට්ඨාශ වෙනුවෙන් එක් ස්ථානයක පිහිටි ගම්මානයක් උදාකළ ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීම මෙම වැඩසටහන තුළින් සිදු වේ.

මෙම වැඩසටහන යටතේ නිවාස ඉදිකර ගැනීමට ප්‍රතිලාභීන්ට ණය මුදල් සපයනු ලැබේ. **මේ යටතේ දිස්ත්‍රික්ක හයක උදාකළ ගම්මාන වැඩසටහන ආරම්භ කර ප්‍රතිලාභීන් 1,180 ක නිවාස ඉදිකර ගැනීමට රු.මිලි. 135.633 ක ණය මුදල් නිදහස් කර ඇති අතර මෙයින් නිවාස 207 ක් නිමි නිවාස බවට පත්කර ඇත.** ඉතිරි ප්‍රතිපාදන යොදවා නිමනොකළ නිවාස 2017 වසර තුළ නිමකිරීමට සැළසුම් කර ඇත.

05. කපලාරු කිරීමේ වැඩසටහන

අතිගරු ජනාධිපතිතුමාගේ පදවිප්‍රාප්තිය නිමිතිකොට ගෙන අඩු ආදායම්ලාභී පවුල් විසින් ස්ථිරව ඉදිකර ගත් නිවාසවල මූලිකව පිටත බිත්ති හෝ ඇතුලත බිත්ති සම්පූර්ණයෙන් හෝ අඩක් කපලාරු කර ඇති බිත්තිවල කපලාරුව නිමකර ගැනීම සඳහා **සෑම දිස්ත්‍රික්කයකම සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි දරු පවුල් 3,000 බැගින් දිවයින පුරා පවුල් 75,000 සඳහා වසර පුරා අදියර තුනකින් මෙම සිමෙන්ති ආධාරය ලබාදීමට සැළසුම් කරන ලදී. නිවාස 77,509 ක් වර්ෂය තුළ පිළිසකර කර ඇති අතර මේ සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රුපියල් මිලියන 641.899 ක් යොදවන ලදී.**

06. සෙවණ ආධාර වැඩසටහන

නිවාස ණය මුදලක් ලබාගෙන ආපසු ගෙවීමේ හැකියාවක් නොමැති එහෙත් නිවසක් ඉදිකර ගැනීමේ සැබෑ අවශ්‍යතාවයක් ඇති ශාරීරික දුබලත්වයෙන් පෙළෙන හෝ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති අපේක්ෂා භංගත්වයට පත් ව වාසස්ථානයක් නොමැති ඉතා දිළිඳු දරු පවුල් වෙත සහනය සැලසීම මෙයින් අපේක්ෂා කෙරේ. නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමාගේ මඟපෙන්වීම මත දිස්ත්‍රික් මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

ද්වෛනිකව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් මෙන්ම දේශපාලන නායකත්වය විසින් පෙන්නුම් කරනු ලබන නිවසක් නොමැති අසරණ දරු පවුල් වෙත හා මහජන ඉල්ලීම් තුළින් ආධාර ලබාදීමට අපේක්ෂිත ප්‍රතිලාභීන් හඳුනාගැනීම සිදු කෙරේ. මේ යටතේ අදාළ එක් එක් නිවාස ඉදිකිරීමට අවශ්‍ය පිරිවැය ඇස්තමේන්තු දිස්ත්‍රික් කළමනාකරුවන්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන අතර ඒ අනුව නිවාස ප්‍රතිලාභි හිමියන් වෙත පිරිනැමෙන ආධාර මුදල තීරණය කරනු ලැබේ. ඉඩමේ නිවාස ඉදිකර ගැනීම වෙනුවෙන් අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සූදානම් කරගෙන යම් බාහිර පාර්ශවීය දායකත්වය සහිත වීම මත ඉඩමේ හිමිකම ඇති පවුල් වෙත මෙම ආධාර මුදල් ලබාදීමේ දී වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

මේ සඳහා අවශ්‍ය අරමුදල් සෙවණ ලොතරැයි අරමුදලින් ලැබේ. **මේ යටතේ නව නිවසක් සඳහා රු.200,000/- ක උපරිම ආධාර මුදලකින් හා වැඩිදියුණු කිරීම සඳහා රු.100,000/- ක උපරිම මුදලක් ද ඉදිකිරීම මත වාරික අදියර 04 කින් මුදල් නිදහස් කිරීම සිදුකරයි. සළකා බලන වසර තුළ ප්‍රතිලාභී පවුල් 118 ක ට සෙවණ ආධාර ලබා දී ඇති අතර මේ සඳහා රු.මිලි. 9.910 වැය කර ඇත. මෙයින් නිවාස 32 ක් නිමකර ඇති අතර** නිමනොකළ නිවාස 2017 වසර තුළ ඉතිරි ප්‍රතිපාදන යොදවා නිමකිරීමට සැළසුම් කර ඇත.

07. අනුග්‍රාහක ආයතන පරිත්‍යාග අරමුදලින් සෙවණ ආධාර ආදර්ශ ගම්මාන වැඩසටහන

නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ මඟපෙන්වීම මත දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන නිවාස සංවර්ධන වැඩසටහන ගැන පැහැදීමෙන් දේශීය හා විදේශය විවිධ අනුග්‍රාහක ආයතන දානපතීන් නිවාස සංවර්ධන වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා සෙවණ අරමුදලට අරමුදල් පරිත්‍යාග කරනු ලැබේ. මෙම අනුග්‍රාහක ආයතන දානපතීන්ගේ පරිත්‍යාග අරමුදලින් සෙවණ ආධාර ආදර්ශ ගම්මාන නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරනු

ලබන අතර සළකා බලන වසර තුළ **මෙම අරමුදලින් නව නිවාස 896 ක් ඉදිකිරීම සඳහා රු.මිලි. 23.815 ක මුදලක් වැය කර ඇත. මෙයින් වසර අවසානයේ නිවාස 27 නිමකර ඇති අතර නිමනොකළ නිවාස 2017 වසර තුළ ඉතිරි පරිත්‍යාග අරමුදල් යොදවා නිමකිරීමට සැළසුම් කර ඇත.**

08. වැලිඔය තිරසාර ඒකාබද්ධ නිවාස සංවර්ධන ව්‍යාපෘතිය

උතුරේ පැවති යුද්ධමය වාතාවරණය නිමවීමෙන් පසුව පවතින සමාජ ආර්ථික ජීවන රටාව තුළ ජීවත්වීමට සුදුසු තිරසාර නිවසක් ඉදිකරගැනීම වෙනුවෙන් සහාය අපේක්ෂිත මුලතිව් දිස්ත්‍රික්කයේ වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් විශාල ප්‍රමාණයක් සුදුසු නිවහනක් නොමැතිව තාවකාලික කුඩාරම් පැල්පත්, අවතැන් කඳවුරුවල මූලික අවම පහසුකම් පවා නොමැතිව ජීවත් වේ. මින් පවුල් 1,000 ක් සඳහා නිවාස ආධාර ලබාදීමේ පදනම මත නව නිවාස 500 ක් ඉදිකිරීම් සැළසුම් කර ඇත. සුදුසු ප්‍රතිලාභීන් තෝරාගැනීම දිස්ත්‍රික් කළමනාකරු (මුලතිව්), මහවැලි සංවර්ධන අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු, ප්‍රාදේශීය ලේකම් (වැලිඔය) යන කමිටුවෙන් සිදුකර ඇත.

සමස්ථ ව්‍යාපෘතියේ කටයුතු දිස්ත්‍රික් ලේකම් (මුලතිව්) අධීක්ෂණය යටතේ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ඉහළ කළමනාකාරිත්වයේ අධීක්ෂණය යටතේ සිදු වී ඇත. මෙහි නව නිවාස සඳහා රු. 500,000 /- ක මුදලක් ද වැඩිදියුණු නිවාස සඳහා රු 200,000 /- ක මුදලක් ද පිරිනැමීමට ඇස්තමේන්තුගත කර ඇත. **මේ සඳහා භාණ්ඩාගාර අරමුදල් රු.මිලි. 350 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. සළකා බලන වර්ෂය තුළ නිවාස නව නිවාස 519 ක් ද වැඩිදියුණු නිවාස 565 ඇතුලත් ව නිවාස 1,084 ක් ද ඉදිකිරීමට කටයුතු කර ඇති අතර මෙයින් නිවාස 42 ක් වසර අවසන් වන විට නිමකර ඇත.**

වසර තුළ රු.මිලි. 310.845 ක් නිවාස ඉදිකිරීමට වැයකර ඇති අතර වැය නොකළ ඉතිරි ප්‍රතිපාදන යොදවා නිමනොකළ නිවාස 2017 වසර තුළ නිම කිරීමට සැළසුම් කර ඇත.

9. වකුගඩු රෝගයෙන් පීඩාවට පත් වූවන් හා අන්ත දිළිඳු පවුල් වෙනුවෙන් ක්‍රියාත්මක නිවාස වැඩසටහන

9.1 වකුගඩු රෝගයෙන් පීඩාවට පත් වූවන්

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.05.30 දින රැස් වූ වකුගඩු රෝග නිවාරණ කාර්යය සාධන බලකායේ නිර්දේශවලට අනුව වකුගඩු රෝගීන් හා අන්ත දිළිඳු පවුල් වෙනුවෙන් මූලික පහසුකම් සහිත නිවාස වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. රෝගියාට ගැළපෙන සෞඛ්‍ය සම්පන්න නිවසක් ඉදිකරදීමත් රෝගියා නිසා අසරණ වන පවුලේ සාමාජිකයන් ට සහනයක් සළසා දීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ. කාලික වකුගඩු රෝගයෙන් පීඩාවට පත් වූ පවුල් වෙනුවෙන් ස්ථිරසාර නිවාස ඉදි කිරීමේ බලාපොරොත්තු ඇතුව නව නිවසක් ඉදිකිරීම සඳහා රු. 500,000 /- ක උපරිම මූල්‍යාධාර මුදලක් ද, වැඩිදියුණු නිවසක් සඳහා රු. 200,000 /- ක උපරිම මුදලක් ද මේ මගින් ලබාදීමට සැළසුම් කර තිබිණි. ආධාර මුදල වාරික අදියර හතරෙන් නිකුත් කරනු ලබයි. **සළකා බලන වසර තුළ නිවාස 700 ක් ඉදිකිරීම සඳහා රු.මිලි. 74.560 ක මුදලක් වැය කරමින් මෙම නිවාස වැඩසටහනට දායක වී ඇත.**

9.2 අන්ත දිළිඳු නිවාස වැඩසටහන.

පවුලේ මාසික ආදායම රු.4,000 /- ක ට වඩා අඩු නිවාස ණය ආපසු ගෙවීමේ හැකියාව නොමැති කලත්‍රයා සුවකළ නොහැකි රෝගී තත්ත්වයෙන් පෙළීම, දිගු කාලීන ව රෝගි වූ, වැන්දඹු, ස්වාමියා හෝ බිරිඳ හැරගිය, දික්කසාද වූ පවුල් සඳහා ස්ථිර මූලික නිවසක අවශ්‍යතාවයක් ඇති, තමාට ස්ථිර මූලික නිවසක් නැති පවුල් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. ඉහත වැඩසටහන් සඳහා අරමුදල් මහා භාණ්ඩාගාරය විසින් සපයනු ලැබේ.

ප්‍රතිලාභීන් 158 කට නිවාස ඉදිකර ගැනීමට රු.මිලි. 11.445 ක ණය මුදල් සපයා ඇති අතර මෙයින් නිවාස 140 ක් නිමිනිවාස බවට පත්කර ඇත. ඉතිරි ප්‍රතිපාදන යොදවා නිමනොකළ නිවාස 2017 වසර තුළ නිම කිරීමට සැළසුම් කර ඇත.

3.1 සංඛ්‍යා සටහන

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

2016-12-31 දිනට නිවාස වැඩසටහන් ප්‍රගතිය

	වැඩසටහන	2016 ඉලක්කය		අරමුදල් මූලාශ්‍රය (රු.මිලි)			ළඟාවීම්						මහා භාණ්ඩාගාර අරමුදල් ලැබීම් (රු.මිලි)
		නිවාස ගණන (ඒකක)	වාර්ෂික වෙන්කිරීම් (රු.මිලි)	මහා භාණ්ඩාගාර	අභ්‍යන්තර උත්පාදන	සෙවණ/ වෙනත්	ඒකක ගණන		වියදම (රු.මිලි)				
							වැඩ ආරම්භ කිරීම්	වැඩ නිමි ඒකක	එකතුව	මහා භාණ්ඩාගාර	අභ්‍යන්තර උත්පාදන	සෙවණ/ වෙනත්	
	ග්‍රාමීය සහ නාගරික නිවාස වැඩසටහන												
1	ආදර්ශ ගම්මාන වැඩසටහන	4,500	1,125.000	1,125.000			4,641	259	1,079.172	1,079.172			1,125.000
	1.1 වැලිඔය ව්‍යාපෘතිය	1,000	350.000	350.000			1,084	42	310.845	310.845			350.000
2	විසිරි නිවාස වැඩසටහන	26,000	3,687.500	3,687.500			34,619	17,715	3,563.450	3,563.450			3,704.500
	2.1 උදාකල ගම්මාන වැඩසටහන						1,180	207	135.633	135.633			
	2.2 වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස වැඩසටහන						158	140	11.445	11.445			
	2.4 වකුගඩු රෝගී නිවාස වැඩ සටහන						700	1	74.560	74.560			
3	සම්පත් සෙවන (විසිරි)												
	3.1 විසිරි ණය	2,575	900.000		900.000		3,685	2,120	267.666		267.666		
	3.2 වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස වැඩසටහන						44	25	3.840		3.840		
4	කපලාරු වැඩසටහන	75,000	637.500	637.500			77,509	77,509	641.899	641.899			637.500
5	සෙවන ආධාර නිවාස වඩාසටහන (ලොතරැයි අරමුදල්)												
	5.1 ආධාර වැඩසටහන	500	100.000			100.000	118	32	9.910			9.910	
	5.2 සෙවන ආදර්ශ ගම්මාන වැඩසටහන						896	27	23.815			23.815	
6	නාගරික ඉඩම් ප්‍රතිසංවර්ධන වැඩසටහන (ඕෂන් වීව් ආයතනය)	1,330	-						-				
7	මධ්‍ය ආදායම්ලාභීන් සඳහා නිවාස වැඩසටහන	500	-				672		-				
8	උපහාර වැඩසටහන		15.000	15.000					15.000	15.000			15.000
9	වෙනත් නිවාස වැඩසටහන්		-				10	-	0.435			0.435	
	උප එකතුව	111,405.00	6,815.00	5,815.00	900.00	100.00	125,316.00	98,077.00	6,137.67	5,832.00	271.51	34.16	5,832.00
	නිවාස ආශ්‍රිත සහාය සේවා												
10	ඔප්පු නිකුත් කිරීම												
	10.1 හිමිකම් ඔප්පු	3,000						1,851					
	10.2 බදු ඔප්පු	2,000						7,599					
									-				
	උප එකතුව	5,000.00	-	-	-	-	-	9,450.00	-	-	-	-	-
	එකතුව	116,405.00	6,815.00	5,815.00	900.00	100.00	125,316.00	107,527.00	6,137.67	5,832.00	271.51	34.16	5,832.00
11	**අවිච්ඡේද වැඩසටහන**								-				
	11.1 සම්පත් සෙවන	1,817	125.290		125.290			1,483	113.571		113.571		
	11.2 ආදර්ශ ගම්මාන							9	4.295			4.295	
	11.3 ඉන්දියන් අධාර නිවාස වැඩසටහන	1,609	136.300			136.300	66	1,438	64.375			64.375	
	11.4 ඛාහිර අරමුදල් වැඩසටහන						200	111	4.425			4.425	
	11.5 රාජ්‍ය/ පෞද්ගලික දායකත්ව නිවාස වැඩසටහන	660	-					58	-				
	11.6 පුනස්ථාපන වැඩසටහන	40	63.000			63.000			4.060			4.060	
	11.7 නගමු පුරවර - පැරණි නිවාස ව්‍යාපෘති ප්‍රතිසංවර්ධනය 2016 (ව්‍යාපෘති 18)	1,258	240.000	240.000				503	84.093	84.093			240.000
	- ණය ගෙවීම්								155.907	155.907			
	උප එකතුව	5,384.00	564.59	240.00	125.29	199.30	266.00	3,602.00	430.73	240.00	113.57	77.16	240.00
	මුළු එකතුව	121,789.00	7,379.59	6,055.00	1,025.29	299.30	125,582.00	111,129.00	6,568.40	6,072.00	385.08	111.32	6,072.00

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

★ ***ග්‍රාමීය නිවාස වැඩසටහන සඳහා අයවැය ප්‍රතිපාදන වලට අමතරව පරිපූරක ඇස්තමේන්තු අයවැයෙන් රු.මිලියන 17.000 ලැබී ඇත.***

3.2 දේපළ කළමනාකරණය

(i) මෙම අධිකාරියට අයත් නිවාස ක්‍රම නිවාස හා ඉඩම් බැහැර කිරීම සඳහා පනතේ 8/1 අනුමැතිය ලබා ගැනීමට දිස්ත්‍රික් කාර්යාල විසින් එවන ලද ප්‍රතිලාභීන් ගණන 2141 කි. ඒ අතරින්, ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන දිස්ත්‍රික් කාර්යාල වෙත දන්වා ඇති ප්‍රතිලාභීන් ගණන 1423 කි.

(ii) මෙම අධිකාරියේ නිවාස සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීම පහත පරිදි සිදු වේ.

- රජයේ ඉඩම් පවරා ගැනීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් පවරා ගැනීම.
- පෞද්ගලික ඉඩම් පවරා ගැනිම.
- වෙනත් රාජ්‍ය ආයතන සතු ඉඩම් පවරා ගැනීම, **2016 වර්ෂයේ දී ඉඩම් 08 ක් පවරා ගැනීමට හැකිවිය. එම ඉඩම් අතුරින් ඉඩම් 05 ක් සඳහා දීමනා පත්‍ර ලැබුණු අතර ඉඩම් 02 ක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙ 44 වගන්තිය යටතේ පැවරුම් සහතිකය ලැබී ඇත. තවත් ඉඩමක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඔප්පුවක් මගින් පැවරී ඇත. පැවරී නොමැති අනෙකුත් ඉඩම් සියල්ලෙහි පැවරුම් කටයුතුවල අදියර කිහිපයක් 2016 වර්ෂය තුළ අවසන් කිරීමට හැකි වී ඇත. ඉඩම් වන්දි ගෙවීම සඳහා 2016 වර්ෂය ට මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් වන්දි ගෙවීමක් සිදු වී නොමැත.**

(iii) 2016 වර්ෂයේ දී පොදු දේපළ පළාත් පාලන ආයතන වෙත බැහැර කිරීම සඳහා දිස්ත්‍රික් 04 ක නිවාස ක්‍රම 49 ක් වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන එය ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් කාර්යාල වෙත දන්වා ඇත.

(iv) 2016 වර්ෂයේ දී යාබද ඉඩම් බැහැර කිරීම සඳහා දිස්ත්‍රික් 07 ක නිවාස ක්‍රම 11 ක ඉඩම් කොටස් 33 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන එය ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් කාර්යාල වෙත දන්වා ඇත.

(v) 2016 වර්ෂය තුළ කොළඹ නගර උතුර ප්‍රදේශය හා තවත් දිස්ත්‍රික්ක 09 ක හෙක්. 4.56 ක පදිංචි අනවසර පදිංචිකරුවන් 232 දෙනෙකු නියමානුකූල කිරීමට කටයුතු කර ඇත.

3.2 සංඛ්‍යා සටහන

2016 වර්ෂයේ දී අලෙවි කර ඇති නිවාස සංඛ්‍යාව

අනු අංකය	නිවාස යෝජනා ක්‍රමය	නිවාස සංඛ්‍යාව	දුන් වට්ටම්
01.	117 වත්ත V අදියර	01	-
02.	යක්කල සියනෑ උයන iii අදියර	09	-
03.	කුරුණෑගල වෙලන්ගොල්ලවත්ත නිවාස ක්‍රමය	10	10%
04.	හෝමාගම ජල්තර රාජ්‍ය සේවක නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් පවරාගත් නිවාස	05	-
05.	පිළියන්දල සයිමන්ඩේල් නිවාස ක්‍රමය	01	-

3

3.3 ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය පහත අංශවලින් සමන්විත වේ.

- ඉංජිනේරු අංශය.
- වාස්තු විද්‍යා අංශය.
- ප්‍රමාණ සමීක්ෂණ අංශය.
- සැළසුම් අංශය.
- විදුලි අංශය.
- නඩත්තු අංශය.

2016 වර්ෂය තුළ දී පහත සඳහන් වැඩසටහන් මගින් සියලු ජන කොටස්වල නිවාස අරමුණු හා ඒ සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමට කටයුතු කර ඇත.

මහල් නිවාස ප්‍රතිසංස්කරණය (නගමු පුරවර)

පැරණි මහල් නිවාස ක්‍රම හා ඒවායේ සියලුම යටිතල පහසුකම් නවීකරණය කර නිවැසියන්ට හිතකර ජනාවාසයක් බවට පත්කිරීම, කළමනාකරණ සංස්ථා ස්ථාපිත කර නිවාස ක්‍රම නඩත්තු කිරීමේ වගකීම නිවැසියන්ට බාරදීම හා පොදු පහසුකම් නඩත්තු අදාළ පළාත් පාලන ආයතනවලට නීත්‍යානුකූලව බාරදීම නගමු පුරවර වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

නගමු පුරවර නවීකරණ වැඩසටහන

ව්‍යාපෘති ඇස්තමේන්තුව - රු.මි. 1,033.06

- පැරණි සිව්මහල් නිවාස හා යටිතල පහසුකම් නවීකරණය.
- අරමුණ - නිවැසියන්ගේ නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම.
- කළමනාකරණ සංස්ථා පිහිටුවා නිවාස යෝජනා ක්‍රම එයට බාර දී නඩත්තු කටයුතු ඔවුන්ට පැවරීම.
- මාර්ග, කාණු, වීථි ලාම්පු සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය අදාළ පළාත් පාලන ආයතනවලට බාරදීම.

3.3 සංඛ්‍යා සටහන

2016 වසර තුළ ඉටුකර ඇති ව්‍යාපෘති
නගමු පුරවර 2013 අවිච්ඡේද

ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	ඇස්තමේන්තු ගත මුදල රු.මිලි.	කොන්ත්‍රාත්කරු	ප්‍රගතිය 2016.12.31 දිනට	
				භෞතික ප්‍රගතිය %	මූල්‍යමය ප්‍රගතිය රු.මිලි.
I. සොයිසාපුර නිවාස ක්‍රමය (අදියරII) වැසි ජල කාණු පද්ධති	960	11.53	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	90%	7.55
II. සොයිසාපුර නිවාස ක්‍රමය (අදියර II) මළ නාළිකා ප්‍රතිසංස්කරණය B1,B2, B3,B4 & B5		19.60	- එම -	95%	10.59
III.සොයිසාපුර නිවාස ක්‍රමය (අදියර II) මළ නාළිකා ප්‍රතිසංස්කරණය B6,B7,B8,B9, O & P අදියර - V දින 147		13.67	- එම -	100%	8.72
IV.මිහිඳු මාවත නිවාස ක්‍රමය	125	23.50	- එම -	91%	19.25
V. බ්ලූමැන්ඩල් නිවාස ක්‍රමය	392	60.00	- එම -	88.2%	53.13
VI. ආමර්වීදිය නිවාස ක්‍රමය	310	33.0	- එම -	85.6%	24.65

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

3.4 සංඛ්‍යා සටහන
නගමු පුරවර 2014 අවිච්ඡේද
(විශාල පරිමාණයේ ව්‍යාපෘති)

ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	ඇස්තමේන්තුගත මුදල රු. මිලි.	කොන්ත්‍රාත්කරු	ප්‍රගතිය 2016.12.31 දිනට	
				භෞතික ප්‍රගතිය ٪	මූල්‍යමය ප්‍රගතිය රු. මිලි.
1. සයිමන්ඩේල් ගොඩනැගිලි සහ යටිතල පහසුකම් නවීකරණය	48	16.60	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	20%	4.57
2. ඇලපිටිවල නිවාස ක්‍රමය	232	94.40	- එම -	18%	19.09
3. චිත්‍රාලේන් නිවාස ක්‍රමය	200	96.30	- එම -	48%	25.10
4. මාලිගාවත්ත දුම්රිය සේවක නිවාස ක්‍රමය	100	52.50	- එම -	17.5%	10.57
5. ඩයස් පෙදෙස නිවාස ක්‍රමය	303	75.30	- එම -	10%	15.39
6. කම්මල්වත්ත නිවාස ක්‍රමය	72	15.80	- එම -	98.5%	6.22

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

3.5 සංඛ්‍යා සටහන
නගමු පුරවර 2014 අවිච්ඡේද
(කුඩා පරිමාණයේ ව්‍යාපෘති)

ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	ඇස්තමේන්තු ගත මුදල රු.මිලි.	කොන්ත්‍රාත්කරු	ප්‍රගතිය 2016.12.31 දිනට	
				භෞතික ප්‍රගතිය(٪)	මූල්‍යමය ප්‍රගතිය රු. මිලි.
1. ගල්කිස්ස මහල් නිවාස නවීකරණය	52	24.06	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	96%	12.88
2. ෆෝබස් පාර නිවාස ක්‍රමය	160	29.77	- එම -	55%	6.54
3. කෙන්ට්පාර මහල් නිවාස ක්‍රමය	30	8.77	- එම -	85%	3.95
4. පාමංකඩ නිවාස ක්‍රමය	14	14. 80	- එම -	20%	2.86
5. ටොරින්ටන් අඩු ආදායම් නිවාස ක්‍රමය	24	14.50	- එම -	11%	2.80
6. මැනිංටවුන් මාතාෂ්‍රා නිවාස ක්‍රමය	16	5.50	- එම -	45%	1.06
7. ගෝතමීපුර නිවාස ක්‍රමය	48	25.40	- එම	70%	7.43

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

3

3.6 සංඛ්‍යා සටහන

නගමු පුරවර නවීකරණ වැඩසටහන - 2016

අනු අංකය	ව්‍යාපෘතියේ නම	නිවාස ගණන	කොන්ත්‍රාත් මුදල (රු.මි.) 11% + 3% වැට්සමඟ	2016.12.31 ප්‍රගතිය		කොන්ත්‍රාත්කරු
				භෞතික (%)	මූල්‍ය රු. මිලි.	
01	ටොරින්ටන් නිවාස ක්‍රමය වහල අළුත්වැඩියා කිරීම	16	7.68	100	7.99	බ්‍රයන් ඉංජිනේරු සමාගම
02	සොයිසාපුර නිවාස ක්‍රමයේ (මාර්ග සහ කාණු පමණි)	-	18.91	89	9.23	රුවන් ට්‍රේඩ් ආයතනය
03	විපුලසේන මාවත නිවාස ක්‍රමය	72	13.14	95..5	6.50	ධර්මදාස කන්ස්ට්‍රක්ෂන් සමාගම
04	ආමර් වීදිය නිවාස ක්‍රමය	310	26.16	50	9.17	ගාමිණී කන්ස්ට්‍රක්ෂන්
05	ඩයස් පෙදෙස නිවාස ක්‍රමය	303	50.64	60	16.46	ගාමිණී කන්ස්ට්‍රක්ෂන්
06	ටොරින්ටන් නිවාස ක්‍රමය (අඩු ආදායම්)	24	12.85	100	4.84	ගාමිණී කන්ස්ට්‍රක්ෂන්
07	නවලෝක නිවාස ක්‍රමය	41	7.48	100	5.72	ගාමිණී කන්ස්ට්‍රක්ෂන්
08	117 වත්ත ඇල්විටිගල (අඩු ආදායම්) නිවාස ක්‍රමය	32	10.00	28	2.00	බ්‍රයන් ඉංජිනේරු සමාගම
09	මැනිංටවුන් මාතා පාර	16	5.30	60	2.99	බ්‍රයන් ඉංජිනේරු සමාගම
10	මත්තේගොඩ සාප්පු සංකීර්ණයෂ නිවාස - 07 කඩ කාමර - 23	30	16.55	82	6.79	රුවන් ට්‍රේඩ් ආයතනය
11	මයුර පෙදෙස නිවාස ක්‍රමය	24	3.10	100	0.60	වික්‍රමසිංහ බිල්ඩර්ස්
12	මාලිගාවත්ත දුම්රිය සේවක නිවාස ක්‍රමය	100	38.50	25	11.30	ධර්මදාස කන්ස්ට්‍රක්ෂන් සමාගම
13	හිඹුටු උයන නිවාස ක්‍රමය	80	16.58	02	-	ටෙඩ් ලංකා (පුද්) සමාගම
14	චිත්‍රාලේන් නිවාස ක්‍රමය	128	29.47	02	-	පද්මිණී කන්ස්ට්‍රක්ෂන්
15	සයිමන්ඩේල් නිවාස ක්‍රමය	48	16.27	35	-	පද්මිණී කන්ස්ට්‍රක්ෂන්
16	පාමංකඩ නිවාස ක්‍රමය	14	14.54	-	-	පද්මිණී කන්ස්ට්‍රක්ෂන්
17	ඇලපිටිවල නිවාස ක්‍රමය	80	24.74	-	-	ටෙඩ් ලංකා (පුද්) සමාගම
18	797 වත්ත අදියර 11 (වැසිකිළි ජලරෝධක කිරීම)	112	5.36	-	-	නැවත ටෙන්ඩර් කැඳවීමට තීරණය කර ඇත.
		1430	**278.30**	**-**	**113.29**	**-**

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

3.7 සංඛ්‍යා සටහන

අනෙකුත් ව්‍යාපෘති

ඉදිකිරීම් ආරම්භ වර්ෂය	ව්‍යාපෘතිය	කොන්ත්‍රාත් මුදල (රු.මි.) 11% + 3% වැට් සමඟ	2016.12.31 දිනට ප්‍රගතිය		කොන්ත්‍රාත්කරු
			භෞතික %	මූල්‍ය රු.මිලි.	
2014	කොළඹ දිස්ත්‍රික් කාර්යාලය බිම් මහල ඉදිකිරීම	17.45	68	9.13	ඉනෝවේටි ඉංජිනියරින් (පුද්ගලික) සමාගම
2015	සොයිසාපුර පුනස්ථාන ව්‍යාපෘති අදියර III නිවාස - 60 කළාප 1 - 20 කළාප 2 - 20 කළාප 3 - 20 දින 728	කළාප 1 - 55 කළාප 2 - 55 කළාප 3 - 55	35 (කළාප - 1)	39.9 (කළාප 1)	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
	යාපනය සංචාරක බංගලාව	1.72	90	1.41	පිරවින් මාර්කටින් සමාගම
	හන්තාන සංචාරක බංගලාව	5.53	27	1.09	රෝහිත සප්ලයර්ස්
2016	මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය නවීකරණය	9.56	100	6.5	මහාදේවන් කොන්ත්‍රාත්කරු

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

- **රාජ්‍ය,පෞද්ගලික ඒකාබද්ධ ව්‍යාපෘති වැඩසටහන (PPP Projects)**

2016 වර්ෂය තුළ ඉදිකෙරෙමින් පැවති සහ මේ වනවිටත් සිදුකරමින් පවතින ව්‍යාපෘති.

- යක්කල, සියනෑ උයන සොබා උයන නිවාස ව්‍යාපෘතිය (නිවාස 42)
- කළුගල පල්ලේ කැලේ රිජන්සි උද්‍යාන නිවාස ව්‍යාපෘතිය (නිවාස 21)
- පල්ලේකැලේ ලිවිං හෝම් නිවාස ව්‍යාපෘතිය (නිවාස 39)

අනෙකුත් ව්‍යාපෘති

- හන්තාන, පතනවත්ත නිවාස ව්‍යාපෘතිය (හන්තාන වැඩබිම III)
    - නිවාස ගණන 20 කි. මෙම ව්‍යාපෘතිය සහිත ප්‍රදේශය නාය යෑමේ අවදානමට ලක්වන බැවින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙතින් විශේෂිත පරීක්ෂණයක් සිදුකර අදාළ වාර්තා ලබා ගෙන ඇත. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත.
- කිරුලපන, මිහිඳුපුර නිවාස ව්‍යාපෘතිය
    - නීතිපති දෙපාර්තමේන්තුව හා උපදේශක සමාගම වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උපදෙස් මත සංවර්ධනකරුගේ වැඩවල මන්දගාමීත්වය සැලකිල්ලට ගෙන 2016.11.18 දින ව්‍යාපෘතියට අදාළ ගිවිසුම අවලංගු කිරීමේ නිවේදනය යවා ඇත. කොන්ත්‍රාත්කරු එම තීරණ නොපිළිගැනීම නිසා බේරුම්කාරක මණ්ඩලයට යොමු කර ඇත.

- **කඩිනම් මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය**

මධ්‍යම පාන්තික ප්‍රජාවට වසර 05 ක් තුළ නිවාස ලක්ෂ පහක් ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණ යි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය මෙම ව්‍යාපෘති කමිටුවේ ප්‍රධාන මෙහෙයුම් ආයතන වේ. මෙහි මුල් අදියර සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් දායක කර ගැනේ.

3

අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි මේ වන විට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු පහත සඳහන් ඉඩම්වල, තෝරාගෙන ඇති සංවර්ධනකරුවන් වෙතින් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

- දඹුවත්ත,රාගම - නිවාස 116
- නුගගහකනත්ත වත්ත, පානදුර - නිවාස 196
- ජල්තර දෙවන අදියර, අතුරුගිරිය - නිවාස 352
- මවුන්ට්ක්ලිෆ්ඩ් වත්ත, හෝමාගම - නිවාස 860

- **ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති:**
  - රන්පොකුණගම, අත්තනගල්ල
  - වැරැල්ලවත්ත, යක්කල
  - ලංකා ලෝහ, යක්කල
  - කැප්ටන් ගාර්ඩින් වත්ත, අක්මීමන, ගාල්ල
  - ඉස්කාගාර වත්ත, කුණ්ඩසාල, මහනුවර

3.4 මානව සම්පත් කළමනාකරණ

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය පහත සඳහන් අංශවලින් සමන්විත වේ.

01. මානව සම්පත් කළමනාකරණ අංශය.
02. පාලන අංශය.
03. විනය අංශය.
04. ප්‍රවාහන අංශය.
05. පුහුණු හා සංවර්ධන අංශය.
06. මාණ්ඩලික නිවාස ණය අංශය.
07. ආරක්ෂක අංශය.
08. සෙවණ අධ්‍යයන කේන්ද්‍රය.
09. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය හා සමාජ වෙබ් අඩවි (Social Media) මෙහෙයුම් හා පරිගණක මෘදුකාංග නිර්මාණ හා දෘඩාංග නඩත්තු අංශය.
10. ලේඛනාගාරය හා පොත් බැඳුම් අංශය.

3.4.1 මානව සම්පත් කළමනාකරණ අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත සේවකයෙකු බඳවා ගැනීමේ සිට විශ්‍රාම යන තෙක් රාජකාරී පැවැත්මට අදාළ වන සියලු ම කාර්යයන් මානව සම්පත් අංශය හරහා සිදු කරනු ලබයි.

ප්‍රධාන කාර්යාලය ඇතුළු දිස්ත්‍රික් කාර්යාලවල සමස්ථ සේවක මණ්ඩලයට අදාළව සියලු කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

2016 වර්ෂය තුළ මානව සම්පත් අංශයේ කාර්යසාධනය

- 2016.12.31 දිනට සමස්ථ කාර්යමණ්ඩල සංයුතිය

අනු අංකය	සේවා මට්ටම	අනුමත සංඛ්‍යාව	භෞතික සංඛ්‍යාව
01	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ	115	88
02	තෘතීය කළමනාකරණ	157	301
03	ද්විතීය	899	1405
04	ප්‍රාථමික	205	349
	එකතුව	**1376**	**2143**

- 2016.12.31 දිනට බඳවා ගැනීම්

සෘජු බඳවා ගැනීම්				නැවත සේවය බඳවා ගැනීම් විශ්‍රාම ගැන්වීමෙන් පසු		එකතුව
ස්ථිර		කොන්ත්‍රාත්	දෛනික			
විධායක	විධායක නොවන			විධායක	විධායක නොවන	
-	30	74	20	-	-	124

- සේවා කාණ්ඩ නාමාවලියේ 2016.01.01 සිට 2016.12.31 දින දක්වා කාලය තුළ අභ්‍යන්තර උසස්වීම් පහත සඳහන් අයුරින් ලබා දී ඇත.

අනු අංකය	සේවා මට්ටම	උසස්වීම්
01	ජ්‍යෙෂ්ඨ කළමනාකරණය	05
02	තෘතීය කළමනාකරණය	01
03	ද්විතීය කළමනාකරණය	-
04	ප්‍රාථමික කළමනාකරණය	-
	එකතුව	**06**

- 2016.01.01 සිට 2016.12.31 දින දක්වා කාලය තුළ විශ්‍රාම ගැන්වීම්, කොන්ත්‍රාත් අවසන් කළ හා ඉල්ලා අස් වූ සේවක තොරතුරු පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	සේවා මට්ටම	විශ්‍රාම ගැන්වීම්	කොන්ත්‍රාත් අවසන්	ඉල්ලා අස්වීම්	එකතුව
01	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ	7	-	2	09
02	තෘතීය කළමනාකරණ	32	-	4	36
03	ද්විතීය කළමනාකරණ	42	2	38	82
04	ප්‍රාථමික කළමනාකරණ	19	2	1	22
	එකතුව	100	4	45	149

- මෙම අධිකාරියේ සේවයේ නියුතුව සිටිය දී 2016.01.01 සිට 2016.12.31 දින දක්වා කාලය තුළ මියගිය සංඛ්‍යාව 04 කි.
- කාර්මික විද්‍යාලවල / විශ්වවිද්‍යාලවල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීම පහත පරිදි සිදුකර ඇත.

  පුහුණුව සඳහා බඳවා ගත් සංඛ්‍යාව - 624
  වර්ෂය තුළ පුහුණුව අවසන් කළ සංඛ්‍යාව - 9

3.4.2 පාලන අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පාලන අංශය ප්‍රධාන කාර්යාලය ඇතුළු දිස්ත්‍රික් කාර්යාල සඳහා පරිපාලන චක්‍රලේඛ නිකුතුව, අතිකාල, සංයුක්ත දීමනා, ගමන් වියදම් දීමනා, ගෙවල් කුලී දීමනා ඇතුළු අනෙකුත් දීමනා අනුමත කිරීම හා කාර්යාල කළමනාකරණ උපදෙස් නිකුත් කිරීම, දෛනික තැපෑල කළමනාකරණය, දෛනික පැමිණීම, පිටවීම හා නිවාඩු කළමනාකරණය, ආපදා ණය, ප්‍රසාද දීමනා, දිරි දීමනා හා විවේක නිවාඩු දීමනා ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම් කිරීම, ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිලි රක්ෂණය කිරීම ඇතුළු පරිපාලන කටයුතු සඳහා මැදිහත් වන අංශය වේ. මෙම අංශය යටතේ පහත සඳහන් කටයුතු ද සිදුකරනු ලබයි.

2016 වර්ෂයේ පාලන කොට්ඨාශයේ කාර්යය සාධනය

01. 2016 වර්ෂය වෙනුවෙන් ප්‍රසාද දීමනා වශයෙන් රුපියල් 2,000/- ක් (වැටුප් රහිත නිවාඩු ලබා නොගත්) ගෙවීම් කර ඇති අතර දිරිදීමනා වශයෙන් රුපියල් 5,000/- ක මුදලක් සේවකයින්ට ගෙවීම් කර ඇත.

02. ඉකුත් වර්ෂය සඳහා ලබා නොගත් විවේක නිවාඩු සඳහා මුදල් ගෙවීම් කර ඇත.

03. වෛද්‍ය ප්‍රතිකාර යටතේ සේවකයින්හට පහත ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.

- සාමාන්‍ය බාහිර ප්‍රතිකාර
  රු. 5,000 - 20,000 දක්වා
- නේවාසික ප්‍රතිකාර
  රු.10,000 - 40,000 දක්වා
- නේවාසික ශල්‍යකර්ම හා වෛද්‍ය සේවා පහසුකම්
  රු.15,000 - 60,000 දක්වා
- රජයේ රෝහල් නේවාසික ප්‍රතිකාර
  (දින ගණන අනුව - උපරිම දින 15 කට සීමා වේ)
  රු.15,000 - 60,000 දක්වා
- බෝවන රෝග සඳහා (මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහතිකය මත ලබා දෙන අතර උපරිම දින 14 ක් දක්වා)
  රු. 100 - 400 දක්වා
- පිළිකා , වකුගඩු / බරපතල සැත්කම්
  රු. 150,000 - 600,000 දක්වා

වැටුපෙන් අයකර ගනු ලබන සාමාජික ගාස්තුව මත ගෙවීම් කරනු ලබන මුදල් තීරණය වේ.

3.4.3 විනය අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින්ට විනය විරෝධී ක්‍රියාවන්ගෙන් වැළකී සිටීම ට මඟපෙන්වමින් සේවක විනය සුරැකීමට කැපවීමෙන් කටයුතු කරන අංශයක් ලෙස විනය අංශය හඳුනාගත හැකි ය.2016 වර්ෂයේ විනය කටයුතු අංශයේ කාර්යය සාධනය පහත දැක්වේ.

01. 2016 වර්ෂය ආරම්භ වන විට පැවති විනය කරුණු ගණන 102 ක් වන අතර ඉන් බරපතල විෂමාචාර ගණන 52 කි. 2016 වර්ෂයේ ඉන් අවසන් නොවූ විනය කරුණු සංඛ්‍යාව 20 කි.

02. 2016 වර්ෂය ආරම්භ වන විට පැවති සුළු විෂමාචාර ක්‍රියා පිළිබඳ විනය කරුණු 50 ක් පැවති අතර 2016 වර්ෂය තුළ දී වාර්තා වූ ගණන 44 කි. ඉන් 86 ක් නිදහසට කරුණු පිළිගෙන විනය කරුණු අවසන් කිරීම්/තරයේ අවවාද කිරීම් හා අවවාද කිරීම් තුළින් විසඳා ඇති අතර 2016 අවසන් නොවූ සුළු විෂමාචාර ක්‍රියා ගණන 08 කි.

3.4.4 ප්‍රවාහන අංශය

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය සතු තවත් අංශයක් ලෙස ප්‍රවාහන අංශය හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම අධිකාරියේ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රවාහන පහසුකම් සළසා දීම වාහන නඩත්තු කටයුතු හා වාහන අංගනය, වාහන ගරාජය නඩත්තුව මෙහි ප්‍රමුඛතම කාර්යය වේ.

2016 වර්ෂය තුළ ප්‍රවාහන අංශය සම්පාදනය කළ ඉලක්ක

1. ධාවනයෙන් ඉවත්කරන ලද වාහන ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ටෙන්ඩර් කැඳවා අපහරණය කරන ලදී.

2. ඉන්ධන පරිභෝජන ඵලදායිතාවය සඳහා ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලයේ වාහන ද බොහෝමයක ඉන්ධන පරීක්ෂාව සිදුකිරීම.

3. ආයතනික ගරාජයේ අළුත්වැඩියාවන් සිදුකෙරෙන බැවින් මූල්‍ය වැයවීම් අවම කිරීමට කටයුතු කිරීම.

4. මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ කැබ් රථ 15 ක් හා ජීප් රථ 03 ක් ලබාගැනීමට කටයුතු කිරීම හා එමඟින් දිස්ත්‍රික් කාර්යාල සතු වාහන ප්‍රවාහන සංචිතය ට එකතු වීමෙන් ප්‍රවාහන සංචිතය ශක්තිමත් වීම.

5. සියලුම වාහන රක්ෂණය කිරීම හා වාහනවල ආදායම් බලපත්‍ර නියමිත පරිදි ලබාගැනීම.

6. රියදුරු/ රිය සහායක මහතුන්ට නිලඇඳුම් කට්ටල 03 බැගින් ලබාදීමට කටයුතු කිරීම.

7. අයවැයගත ඉන්ධන සීමාව රු.මිලියන 16.9 ක් වූ අතර රු.මිලියන 8.2 ක ඉතිරියක් කර ගැනීමට කටයුතු කිරීම.

8. අයවැයගත වාහන අළුත්වැඩියා මුදල රු.මිලියන 13 ක් වූ අතර රු.මිලියන 6.3 ක ඉතිරියක් කර ගැනීමට කටයුතු කිරීම.

3.4.5 පුහුණු හා සංවර්ධන අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඇතුළු ව දිස්ත්‍රික් කාර්යාලවල විෂයානුබද්ධ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඊට අවශ්‍ය කරනු ලබන සියලු කටයුතු පුහුණු අංශය මගින් සිදුකරනු ලබයි.

3

පුහුණු වැඩසටහන් - 2016.01.01 සිට 2016.12.31 දක්වා ප්‍රගතිය

	වැඩසටහන් විස්තරය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	වියදම් වූ මුදල රු.ශත.
1	**2016.01.01-2016.12.31 දක්වා පවත්වන ලද අභ්‍යන්තර පුහුණු වැඩසටහන්**			
1.1	නව නාගරික නිවාස වැඩසටහන පිළිබඳ සාකච්ඡාව හා ඉදිරිපත් කිරීම.	1	77	14,950.00
1.2	අලුතින් බඳවා ගන්නා ලද තාක්ෂණ සහකාරවරුන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන.	1	26	37,300.00
1.3	අලුතින් බඳවා ගන්නා ලද ඉංජිනේරුවන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන	1	6	-
1.4	සෙවන අධ්‍යන කේන්ද්‍රයට අදාළ වියදම්	-		22,217.00
1.5	ප්‍රසම්පාද කළමනාරණය පිළිබඳ වැඩමුළුව	1	103	35,000.00
1.6	හෝටල් කළමනාකරණය පිළිබඳ ද්වීමාසික පාඨමාලාව	1	1	1,000.00
1.7	ගිණුම් හා විගණන නිලධාරීන් සඳහා වූ සේවාරම්භක වැඩමුළුව	1	16	-
1.8	වැටුප් පරිවර්තනය පිළිබඳ වැඩමුළුව	1	90	50,000.00
1.9	කාර්යාල කළමනාකරණය හා විනය ව්‍යවස්ථාමාලාව පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන.	1	47	33,550.00
1.10	- එම -	1	86	89,634.00
2	**බාහිර පුහුණු වැඩසටහන් (දේශීය) (90%)**	34	85	416,070.00
3	**බාහිර පුහුණු වැඩසටහන් (දේශීය) (50%)**	3	17	65,275.00
4	විදේශ සංචාර	3	3	3,284,540.00
5	විදේශ ශිෂ්‍යත්ව	1	1	511,728.00
6	**ස්වාභිමත පුහුණු ණය වැඩසටහන**	12	15	734,500.00
	මුළු එකතුව	**62**	**573**	**5,295,764.00**

3.4.6 මාණ්ඩලික නිවාස ණය අංශය

ප්‍රධාන කාර්යාලය ඇතුළු දිස්ත්‍රික් කාර්යාලවල ස්ථිර සේවයේ නියුතු (පරිවාස කාලය අවසන් කරන ලද) කාර්යය මණ්ඩලය සඳහා 4.2% යටතේ සේවකයාගේ මූලික වැටුප හා වයස අවුරුදු 60 දක්වා ඉදිරි සේවා කාලය පදනම් කරගෙන ඔවුන්ගේ ණය ඉල්ලුම් කරන ස්වභාවය මත උගස්කරයක් යටතේ මාණ්ඩලික නිවාස ණය ලබාදීම මෙම අංශයෙන් සිදුකරනු ලබයි.

මෙම නිවාස ණය මුදලේ උපරිමය දැනට රු. 1,500,000/- වන අතර ණය අයකර ගැනීමේ උපරිම කාල සීමාව අවුරුදු 15 වේ.

2016 වර්ෂයේ සම්පාදනය කළ ඉලක්ක

2016 වර්ෂය සඳහා රුපියල් මිලියන 157.728 ක් මාණ්ඩලික නිවාස ණය සඳහා ප්‍රතිපාදන ලැබුණි. ප්‍රධාන කාර්යාලය සඳහා රුපියල් මිලියන 48.380 ක් ද, දිස්ත්‍රික් කාර්යාල සඳහා රුපියල් මිලියන 109.350 ක් ද වශයෙනි. එම ප්‍රතිපාදනවලින් පහත සඳහන් ආකාරයට නිවාස ණය අනුමත කරන ලදී.

3.8 සංඛ්‍යා සටහන

ප්‍රධාන කාර්යාලය රුපියල්	දිස්ත්‍රික් කාර්යාලය රුපියල්	මෙවා ඇති මුළු මුදල රුපියල්
12,058,900.00	12,735,700.00	24,794,600.00
11,457,000.00	12,839,100.00	24,296,100.00
23,408,200.00	25,760,090.00	49,168,290.00
-	800,000.00	800,000.00
46,924,100.00	52,134,890.00	99,058,990.00

අනුමත ප්‍රතිපාදන සහ වැය වූ මුදල හා ඉතිරිය පහත දක්වා ඇත.

3.9 සංඛ්‍යා සටහන

කාර්යාලය	අනුමත ප්‍රතිපාදන රුපියල්	මෙවූ මුළු මුදල රුපියල්	ඉතිරිය රුපියල්
ප්‍රධාන කාර්යාලය	48,379,800.00	46,924,100.00	1,455,700.00
දිස්ත්‍රික් කාර්යාලය	109,347,900.00	52,134,890.00	57,213,010.00
මුළු මුදල	157,727,700.00	99,058,990.00	58,668,710.00

2016 වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයේ සේවකයන් 66 ක් හා දිස්ත්‍රික් කාර්යාලවල සේවකයන් 72 ක් සඳහා නිවාස ණය ලබා දී ඇති මුළු සේවක සංඛ්‍යාව 138 කි.

3.4.7 ආරක්ෂක අංශය

සම්පාදනය කළ ඉලක්ක

I. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරක්ෂක අංශය, අධිකාරිය සතු චංචල / නිශ්චල දේපළ හා මානව සම්පත් ආරක්ෂා කිරීම, ආයතනික කීර්තිනාමය හා සේවකයින් ආරක්ෂා කිරීම සඳහා පූර්ණ ශක්තිය හා ක්‍රමවේදයන් යොදා කටයුතු කරනු ලැබීය.

ii. පසුගිය වසර තුළ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් නොපැවතිය ද අඛණ්ඩව ආරක්ෂක සේවා පෙර පැවති තත්ත්වයෙන්ම මේ දක්වා පවත්වාගෙන යාමට සිදුවිය.

iii. 2016 ජනවාරි මස වන විට ආරක්ෂක කාර්යය මණ්ඩලය 103 දක්වා අඩු වූ අතර, තත්ත්වය එසේ තිබියදීත්, ආරක්ෂක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුවිය.

iv. ප්‍රධාන කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන සේවා ස්ථාන කීපයක් සඳහා ආරක්ෂක නිලධාරීන් විවිධ ක්‍රම උපායන් යොදා ආරක්ෂාව තහවුරු කර ගැනීමට සිදුවිය.

ආරක්ෂක නිලධාරීන් විසින් ප්‍රධාන කාර්යාලය/ දිස්ත්‍රික් කාර්යාල සංකීර්ණ හැර ආරක්ෂක සේවාවන් සපයන ස්ථාන

1. ජල්තර රජයේ සේවක නිවාස ව්‍යාපෘතිය.
2. මාලිගාවත්ත ලොකු, කුඩා ප්‍රදීපාගාලා.
3. මෝදර, ගුණසිංහපුර ප්‍රදීපාගාලා.
4. සොයිසාපුර කළාප කාර්යාලය.
5. රත්මලාන වාරිමාර්ග දෙපාර්තමේන්තු පවරාගත් ඉඩම.
6. දියවන්නා නිවාස යෝජනා ක්‍රමය.
7. ෆර්ගියුසන් නිවාස යෝජනා ක්‍රමය.

ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල

i. ප්‍රධාන කාර්යාලය හා නිවාස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි කාර්යාල සඳහා පැමිණෙන වාහන /පුද්ගලයින්, ගමන්මළු ආදිය පරීක්ෂාවට ලක්කිරීම හා අදාළ අංශ වෙත යොමු කිරීම.

ii. ආරක්ෂක නිලධාරීන් වෙත උපදෙස් පංති පැවැත්වීම, දිස්ත්‍රික් කාර්යාල හා සියලු ම සේවා ස්ථාන සඳහා අවශ්‍ය රාජකාරී උපදෙස් ලිඛිත ව නිකුත් කිරීම, එකී උපදෙස් සම්බන්ධව අංශ ප්‍රධානීන් හා දිස්ත්‍රික් කළමනාකරුවන් දැනුවත් කිරීම, ආරක්ෂක නිලධාරීන් සතු වගකීම් හා කාර්යය භාරය සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම.

iii. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කීර්තිනාමයට හානිකර කටයුතු වැළැක්වීම හා වංචනික ක්‍රියා හා අලාභ කිරීමේ චේතනාවෙන් කෙරෙන ක්‍රියාවන් සොයා බලා වාර්තා කිරීම හා විනය පවත්වාගෙන යාමට සහාය වීම.

iv. කොම්පඤ්ඤවිදිය පොලිස් ස්ථානය මූලික ව පවත්වාගෙන යනු ලබන අධි ආරක්ෂිත කලාපයන්හි පිහිටි ආයතන, ආරක්ෂක කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා එහි දී ගනු ලබන තීරණ හා උපදෙස් පරිදි කටයුතු කිරීම, ඒ සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම.

v. නිවාස මහලේකම් ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා ගිනි අවි සන්නද්ධ ආරක්ෂක පිරිස් යෙදවීම.

vi. අධිකරණ නියෝග ලබාගත් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ මෙහෙයුම සඳහා ආරක්ෂක නිලධාරීන් සහභාගි කරවීම හා හිස් බුක්තිය බාරගත් නිවාසවලට නැවත ඇතුල්වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ආරක්ෂක කටයුතු සංවිධානය හා ක්‍රියාවට නැංවීම, මූලික විමර්ශණ වාර්තා සැකසීම.

3.4.8 සෙවණ අධ්‍යයන කේන්ද්‍රය

ප්‍රධාන කාර්යාලයේ 9 වන මහලේ ස්ථාපිත කර තිබූ පුස්තකාලය කොළඹ නගර උතුර කාර්යාලයේ වඩාත් ඉඩකඩ සහිත පරිශ්‍රයකට ගෙන යන ලදී. අධ්‍යයන කේන්ද්‍රයේ පරිපාලනය සඳහා වෙනම ම නිලධාරිණියක් හා කාර්යය මණ්ඩලයක් පත් කර ඇත. එමෙන්ම, වැඩිදුර අධ්‍යාපනය හදාරන්නන්හට අධ්‍යයන කටයුතු සඳහා මෙන්ම බාහිර පාඨකයින්ට ද අවශ්‍ය වූ විට තොරතුරු ලබා ගැනීමට හැකිවන අයුරින් විධිමත් ලෙස සංවර්ධනය කර ඇත.

තවද, විද්වතුන්, ශිෂ්‍යයන් හා පුස්තකාලය භාවිතා කරන පාඨකයන් සඳහා පර්යේෂණ නිබන්ධන, පොත්පත්, සඟරා හා පුවත්පත් ඇතුලත් කර ඇත. දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ සෙවණ නිවාස සංවර්ධන වැඩපිළිවෙලට අයත් ඡායාරූප හා නිවාස ව්‍යාපෘති ආකෘති ප්‍රදර්ශනයට තබා ඇත. දිනකට පොත්පත් පරිශීලනය කිරීම සඳහා 100 ක ට ආසන්න ප්‍රමාණයක් පැමිණේ.

ඉදිරි වර්ෂය තුළ දී පුහුණු මධ්‍යස්ථානයක් (Training Center) ඇති කර ප්‍රසිද්ධ දේශන හා පාඨමාලා පුහුණු අංශය හා ඒකාබද්ධ ව සිදු කිරීමට සැළසුම් කර ඇත.

3.4.9 ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය හා සමාජ වෙබ් අඩවි (Social Media) මෙහෙයුම් පරිගණක අංශය

ප්‍රාථමික මට්ටමේ පැවති ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය නව තාක්ෂණය හා නවීන පරිගණක ශිල්පිය ක්‍රම යොදා නවීකරණය කර ඇත. ඒ තුළින් මුළු ලොවටම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වැඩසටහන් සම්බන්ධ තොරතුරු ලබාදීම, නිවාස අවශ්‍යතාවය ඇති ජනතාවට එය සපුරා ගැනීමට අවශ්‍ය තොරතුරු හා දැනුම ලබාදීම, සෑමට සෙවණ මාසික පුවත්පත පවත්වා ගෙනයාම, ගරු අමාත්‍යතුමාගේ සංවර්ධන වැඩසටහන් ඡායාරූප ගැලරියක් නඩත්තු කිරීම.

ආයතනයේ කාර්යය මණ්ඩලය පිළිබඳ යාවත්කාලීන තොරතුරු මෙන්ම ආයතනය මගින් දියත් කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා අලුතින් ඉදිකරනු ලබන නිවාස ක්‍රම පිළිබඳ යාවත්කාලීන තොරතුරු පාඨකයන් හට දැනගත හැකි ය. ඉදිරියේ දී තවදුරටත් නවතම තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් දිස්ත්‍රික් කාර්යාල හා සියලු ආයතන ඇතුළත් වන පරිදි තොරතුරු යාවත්කාලීන කිරීමට සැළසුම් කර ඇත.

3.4.10 ලේඛනාගාරය හා පොත් බැඳුම් අංශය

දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබූ ලේඛනාගාරය දෙපාර්තමේන්තුවේ ලේඛනාගාරය හා අධිකාරියේ ලේඛනාගාරය ලෙස කොටස් දෙකකට වෙන්කර ක්‍රමවත් ව සකස් කරන ලදී. ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ අලුතින් රාක්ක සකස් කර එක් එක් කොට්ඨාශය සඳහා වෙන්කර දී ඇති අතර විධිමත් ලෙස හා ක්‍රමවත් ලෙස ලේඛන අසුරා තැබීම සඳහා පහසුකම් සළසා දී තිබේ. ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ ලේඛනාගාර භාරකරුට පුහුණුව ලබා දී ඇත.

ඉදිරියේ දී ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අධීක්ෂණය හා උපදෙස් අනුගමනය කරමින් තවදුරටත් ලේඛනාගාරය පුළුල් ව සහ ක්‍රමානුකූල අන්දමින් පවත්වා ගෙනයාමට කටයුතු සැළසුම් කර ඇත. පොත් බැඳුම් අංශය නවීකරණය කර ආයතනයේ සියලු ම අංශවලින් නිකුත්කරනු ලබන වාර්තාමය පොත් සකස් කිරීම සඳහා කටයුතු කෙරේ.

3.5 නීති කොට්ඨාශය

I. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමේ දී අනෙකුත් අංශවලින් මෙන්ම නීති අංශයෙන් ද ඊට අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කරනු ලබයි.

II. ඉඩම් හා නිවාස සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම.

III. මහල් නිවාසවල ඔප්පු ලබාදීම සඳහා අවශ්‍ය වන සභාධිපත්‍ය ප්‍රකාශන සකස් කිරීම.

IV. ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළ දේපළ සම්බන්ධයෙන් පොදුවේ සමාජයට අගතියක් වන පැමිණිලිවලට අදාළ ව කටයුතු කිරීම.

V. අවශ්‍ය යම් අවස්ථාවල දී යම් යම් පුද්ගලයන් ට හා ආයතනවලට එරෙහිව නීති කටයුතු කිරීම.

VI. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් හා නිවාස අනවසරයෙන් භුක්ති විඳින අයට එරෙහිව නඩු පවරා නිරවුල් සන්තකය ලබා ගැනීම.

VII. බාහිර පාර්ශවයන් මෙම අධිකාරිය අතර කටයුතුවල දී කොන්ත්‍රාත් ගිවිසුම් සකස් කිරීම හා අනෙකුත් ගිවිසුම් සකස් කිරීම.

VII. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අණපනත්වලට අනුව හිඟකුලී හිමියන්ට, අනවසර ඉදිකිරීම්කරුවන්ට සහ අනවසර පදිංචිකරුවන්ට එරෙහිව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවරනු ලබන නඩු හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට විරුද්ධව වෙනත් පාර්ශවයන් විසින් පවරනු ලබන නඩු කටයුතු මෙහෙයවීම හා නීති උපදෙස් ලබාදීම.

IX. ණය හා කුලී වාරික නොගෙවන හිඟ ණය වාරික හිමියන්ට නීති මගින් කටයුතු කර අධිකාරියට අයවිය යුතු මුදල් ලබා ගැනීම.

X. නොතාරිස් ගාස්තු, නීති නිවේදන හා නෙරපීමේ නියෝග ක්‍රියාත්මක වීම තුළින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අයකිරීම් සඳහා දායකත්වය ලබාදීම ආදී විවිධ කාර්යන් නීති අංශය මගින් ඉටු කරනු ලබයි.

XI. මානව හිමිකම් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.

XII. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු දේපළ අයුතු අයුරින් පරිහරණය කරන්නන්ට එරෙහිව නීතිමය කටයුතුවල දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින් නීති අංශය සහාය ලබා දෙයි.

3.5.1 ඔප්පු නිකුත් කිරීම

I. සම්පූර්ණ මුදල් ගෙවූ නිවාස ක්‍රමවල නිවාසලාභීන් වෙත සින්නක්කර ඔප්පු පිරිනැමීමේ කාර්යය ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබන කාර්යකි. මෙහි දී සහාධිපත්‍ය නොවන දේපළ හා ඉඩම් සඳහා ද සින්නක්කර ඔප්පු ලබා දේ.

II. 2016 වර්ෂය සඳහා ඔප්පු නිකුත් කිරීමේ වාර්ෂික ඉලක්කය 3,000 ක් වුව ද, ඔප්පු නිකුත් කිරීම සඳහා නීති අංශය වෙත ලැබුණේ ලිපිගොනු 1937 ක් පමණක් වන අතර, එයින් ලිපිගොනු 1851ක වැඩ නිමකර ඇත.

III. සින්නක්කර ඔප්පු ලබාදීමට නොහැකි අයට 2016 වර්ෂයේ සිට නව වැඩසටහනක් වශයෙන් දිවයින පුරා පිහිටි සියලු ම දිස්ත්‍රික් කාර්යාලවලින් බදු ඔප්පු නිකුත් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත.

ඒ අනුව, ලබාදී ඇති බදු ඔප්පු සංඛ්‍යාව පහත පරිදි වේ.

3.10 සංඛ්‍යා සටහන

බදු ඔප්පු නිකුත් කිරීම

අනු අංකය	දිස්ත්‍රික්කය	එවූ ලිපි ගොනු ගණන
01	කොළඹ දිස්ත්‍රික් කාර්යාලය	535
02	කොළඹ නගර (දකුණ)	1293
03	කොළඹ නගර (උතුර)	5503
04	මාතර	05
05	වවුනියාව	205
06	සොයිසාපුර	24
07	කිලිනොච්චිය	34
	ලබා දී ඇති බදු ඔප්පු ගණන (එකතුව)	7599

3.11 සංඛ්‍යා සටහන

ප්‍රධාන කාර්යාලය මගින් මෙහෙයවනු ලබන නඩු

උසාවිය	නඩු සංඛ්‍යාව
ශ්‍රේෂ්ඨාධිකරණය	05
අභියාචනාධිකරණය	07
මහාධිකරණය	07
දිසා අධිකරණය	01
මහේස්ත්‍රාත් අධිකරණය	05
කම්කරු විනිශ්චය සභාව	05
කාර්මික අධිකරණය	01
මානව හිමිකම්	01
එකතුව	**32**

3.6 සැළසුම් හා ප්‍රගති කොට්ඨාශය

නිවාස සංවර්ධනයේ දැවැන්ත පිබිදීමකට අවශ්‍ය පසුබිම සකසමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2015 වර්ෂයේ දී ආරම්භ කළ "සැමට සෙවණ නිවාස වැඩසටහන" වඩාත් පුළුල් ව හා සැළසුම් සහගත ලෙස 2016 වර්ෂයේ දී සාර්ථකව ක්‍රියාවට නංවන ලදී. වර්ෂය තුළ නිවාස 111,405 සංවර්ධනය කිරීමට රු.මි. 6,800.00 ක් ඇස්තමේන්තු කළ අතර, ඒ සඳහා විශේෂ වැඩසටහන් කිහිපයක් සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

ගරු අමාත්‍යතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා හා අමාත්‍යාංශ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා කළ මැදිහත්වීමත් සහාපතිතුමා ඇතුළු ඉහළ කළමනාකාරිත්වය අඩුපාඩු

3

මඟහරවා ගනිමින් ඉලක්ක සපුරා ගැනීම සඳහා ගත් පියවර හා නිරන්තර පසුවිපරම හේතුවෙන් 2016 වර්ෂයේ සැලසුම් කළ නිවාස වැඩසටහන් නියමිත ඉලක්ක ළඟාකර ගැනීමට සමත් විය. **ඒ අනුව, විවිධ වැඩසටහන් යටතේ 2016 වර්ෂය තුළ නිවාස 125,582 ක ඉදිකිරීම් ආරම්භ කළ අතර, එයින් නිවාස 101679 ක වැඩ වර්ෂය තුළ අවසන් කිරීමට හැකිවීම විශේෂත්වයකි. ඒ අනුව සැළසුම් කරන ලද නිවාස සියල්ලෙහිම වැඩ ආරම්භ කිරීමට හැකිවීමත්, වැඩ අවසන් කළ නිවාස සංඛ්‍යාව 81% (101,679) වීමත් ලැබූ ජයග්‍රහණයකි. ඒ සඳහා යෙදවූ මුදල රු.මි. 6,553.4 ක් වන අතර, ඒ අනුව මූල්‍ය කාර්යය සාධනය 94% ක් වේ.**

2016 වර්ෂයේ දී නිවාස සංවර්ධනය සඳහා භාණ්ඩාගාර අරමුදල් රු.මි. 5817/- ක් ලබා ගැනීමට හැකි වූ අතර, එම මුදල සම්පූර්ණයෙන් ම වර්ෂය තුළ දී අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම සඳහා යෙදවීමට හැකි විය. **ඒ අනුව භාණ්ඩාගාර අරමුදල් යොදවා විවිධ නිවාස වැඩසටහන් යටතේ නිවාස 119,891 ක් සංවර්ධනය කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සෘජුව ම මැදිහත් වී කටයුතු කරන ලදී.**

ආදර්ශ ගම්මාන වැඩසටහන, විසිරි නිවාස වැඩසටහන හා ඒ යටතේ උප නිවාස වැඩසටහන් කිහිපයක්, (එනම් උදාකළ ගම්මාන, වකුගඩු රෝගී පවුල් සඳහා නිවාස වැඩසටහන, වැන්දඹු කාන්තා නිවාස වැඩසටහන) අඩක් නිමකළ නිවාසවල බිත්ති කපලාරු කරගැනීම සඳහා සිමෙන්ති ආධාර ලබාදීම, වැලිඔය විශේෂ ආධාර නිවාස වැඩසටහන වැනි ප්‍රධාන වැඩසටහන් කිහිපයක් සැළසුම් කර ක්‍රියාවට නංවන ලදී.

භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. 1079.172 ක් යොදවා දිස්ත්‍රික් 20 ක ආදර්ශ ගම්මාන 147 ක් ක්‍රියාවට නැංවූ අතර, ඒ යටතේ නිවසක් පිළිබඳ සිහින මවමින් සිටි ඉඩම් කැබැල්ලක්වත් නොතිබූ පවුල් 4,641 ක් සඳහා නිවාස ඉදිකර ගැනීමට අවශ්‍ය මූල්‍ය සහය සහ තාක්ෂණ සහාය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ලබාදුන් අතර, අවශ්‍ය මූලික යටිතල පහසුකම් රාජ්‍ය ආයතන හා අනෙකුත් පාර්ශවයන් සම්බන්ධීකරණය තුළින් ලබාදීමට හැකිවීම 2016 වර්ෂයේ ලැබූ විශේෂ ජයග්‍රහණය කි.

2016 වර්ෂයේ දී නිවාස සංවර්ධන කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගැනීම 2015 වර්ෂය ට සාපේක්ෂව 25% කින් වැඩිකර ගැනීමට හැකි විය. 2015 වර්ෂයේ දී ලද මුදල රු.මි. 4536.288 ක් වුව ද 2016 වර්ෂයේ දී රු.මි. 6072/- ක් ලබා ගැනීමට හැකි විය.

පැරණි නිවාස නවීකරණ වැඩසටහන යටතේ නිවාස ක්‍රම 13 ක් නවීකරණය කිරීම සඳහා වර්ෂය තුළ සැළසුම් කළ අතර, ඒ සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. 240 ක් වෙන් කරන ලදී. මේ අනුව රු.මි. 303.676 එම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කර අදියර වශයෙන් ක්‍රියාත්මක කරන ලදී.

3.12 සංඛ්‍යා සටහන

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

"සැමට-සෙවණ" නිවාස සංවර්ධන වැඩසටහන - 2016

වැඩසටහන	වාර්ෂික ඉලක්කය		2016.12.31 දිනට ළඟාවීම					
			භෞතික			කාර්ය සාධනය%		
	භෞතික	මූල්‍ය රු.මි	ආරම්භ කිරීම	නිම කිරීම	මූල්‍ය රු.මි	ආරම්භ කිරීම	නිම කිරීම	මූල්‍ය
1. භාණ්ඩාගාර අරමුදල්								
1.1.ආදර්ශ ගම්මාන	4,500	1,125.00	4,641	259	1,079.172	103%	6%	96%
1.2.විසිරි නිවාස	26,000	3,687.50	34,619	17,715	3,563.45	141%	69%	103%
1.2.1 උදාකළ ගම්මාන			1,180	207	135.633			
1.2.2.වැන්දඹු නිවාස			158	140	11.445			
1.2.3.වකුගඩු රෝගී නිවාස			700	1	74.560			
1.3.කපලාරු නිවාස	75,000	637.50	77,509	77,509	641.899	103%	103%	101%
1.4.වැලි ඔය විශේෂ ව්‍යාපෘතිය	1,000	350.00	1,084	42	310.845	108%	4%	89%
2.අභ්‍යන්තර අරමුදල්								
2.1.සම්පත් සෙවණ නිවාස	2,575	900.00	3,729	2,145	271.506	145%	83%	30%
3.අධාර නිවාස								
3.1.සෙවණ අධාර නිවාස		100.00	118	32	9.910	203%	12%	34%
3.2.සෙවණ ගම්මාන	500		896	27	23.815			
4.වෙනත් අරමුදල් භාහිර අරමුදල්			10 672		0.435			
4.1.මධ්‍යම පාන්තික නිවාස	500					134%		
5.උපහාර මෙහෙයුම් වියදම්		15.00			15.00			100%
එකතුව	**111,405**	**6815.00**	**125,316**	**98,077**	**6137.77**	**113%**	**90%**	**90%**
5.පැරණි නිවාස ක්‍රම නවීකරණය	1,258	240.000		503	240.000		40%	100%
6.ඔප්පු නිකුත් කිරීම								
6.1.සින්නක්කර ඔප්පු	3,000			1,851			62%	
6.2.බදු ඔප්පු	2,000			7,599			80%	
උප එකතුව	**6,258**	**240.000**	**-**	**9,953**	**240.000**	**-**	**-**	**-**
7.අවිච්ඡේද වැඩසටහන	**4,126**	**324.590**	**266**	**3,099**	**190.726**		**75%**	**59%**
එකතුව	**121,789**	**7379.590**	**125,582**	**111,129**	**6588.019**	**108%**	**91%**	**94%**

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

4

මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

4.1 අයකිරීම් අංශය

4.1.1 2016 වසරේ ක්‍රියාකාරිත්වය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දී ඇති ණය හා කුලී ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශය තුළින් සිදු කෙරේ. එහි දී වාර්ෂික ඉලක්ක ලබාදීම, ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම, ඊට අදාළ ප්‍රතිපත්ති තීරණ හා චක්‍රලේඛ නිකුත් කිරීම පුහුණු හා සතිපතා / මාසිකව ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ඒවායේ දුර්වලතා හඳුනාගෙන අදාළ පිළියම් යෙදීම හා අවශ්‍ය සහාය ලබා දීම සිදු කෙරේ.

4.1 සංඛ්‍යා සටහන

ඉලක්ක සපුරා ගැනීම

	වාර්ෂික අයකිරීම් ඉලක්කය (රු.මිලි)	සපුරා ගැනීම (රු.මිලි)	ප්‍රතිශතය %
නිවාස ණය වාරික	6821.727	3962.055	58%
නිවාස කුලී (ග්‍රාමීය හා නාගරික)	429.051	159.151	37%
එකතුව	7250.778	4121.206	57%

4.1.2 2016 වසරේ අයකිරීම් වැඩිකර ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග

01. වාර්ෂික ව සකස් කරනු ලබන අයකිරීම් ඉලක්ක මාසිකව සති දින හා එක් එක් අයකිරීම් නියෝජිතයින්ගේ මට්ටම දක්වා ගොස් අයකිරීම් ඉලක්ක වැඩසටහන් අනුව දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දීම.

02. ලබා දුන් ඉලක්ක වෙත ලඟාවීමට අවශ්‍ය උපදෙස් ලබාදීම. දිස්ත්‍රික් කාර්යාල සමඟ නිතර සම්බන්ධවෙමින් පසු විපරම් කිරීම.

03. අයකිරීම් ඉලක්ක සපුරා ගන්නා ආකාරය දින, සති හා මාසික වශයෙන් සමාලෝචනය කිරීම හා ප්‍රගති වාර්තා සකස් කර ඉහල කළමනාකාරිත්වයේ උපදෙස් සඳහා ඉදිරිපත් කිරීම.

04. එම ප්‍රගති වාර්තා විශ්ලේෂණය තුළින් දිස්ත්‍රික් කාර්යාලවල පවතින ගැටලු නිරාකරණය කර අයකිරීම් වර්ධනය කර ගැනීමට සහාය ලබා දීම.

05. දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් අයකිරීම් නියෝජිතයින් හා කාර්යාලීය නිලධාරීන් සඳහා වැඩමුළු පැවැත්වීම.

06. මාසිකව ආදායම් මෙහෙයුම් කමිටු පවත්වා දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය කිරීමටත් එම කමිටු වාර්තා උපයෝගී කර ගනිමින් අඩු පාඩු නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දීම.

07. ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල අතර සම්බන්ධීකරණ පවත්වා ගනිමින් අයකිරීම් කටයුතු සඳහා ඉහළ කළමනාකාරිත්වයේ සහාය දිස්ත්‍රික් කාර්යාල වෙත ලබාදීම.

08. ණය හා කුළී අයකිරීම් පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම හා කාලීන අවශ්‍යතාව අනුව චක්‍රලේඛ සංශෝධනය කිරීම තුළින් අයකිරීම් වර්ධනය කරගැනීමට දිස්ත්‍රික් කාර්යාල වෙත සහාය වීම.

09. නිවාස ණය ලබාගත් රාජ්‍ය හා පුද්ගලික ආයතනයන්හි සේවය කරනු ලබන නිවාස ණය ලාභීන්ගේ වාරික මුදල් වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.

10. වැටුපෙන් අවකරණය නොකරන රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් දැනුවත් කර අයවිය යුතු වාරික අයකර ගැනීමට කටයුතු කිරීම.

11. අයකිරීම් නියෝජිතයින් වෙත අයකළ හැකි ණය ප්‍රමාණයක් පැවරීම. අයකිරීම් කටයුත්ත සඳහා නව නියෝජිතයින් පත්කිරීම හා දුර්වල නියෝජිතයින් වෙත අවවාද කර ලිපි නිකුත් කරන ලෙස දිස්ත්‍රික් කළමනාකරු දැනුවත් කිරීම.

12.අයකිරීම් කටයුතුවල දී සිදුවිය හැකි මුදල් අවභාවිතය වලක්වා ගැනීමට හැකි උපරිම පියවර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම හා එවැනි අවස්ථාවල දී සිදුවන අලාභයන් අදාළ පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.

13.අයකිරීම් නියෝජිතයින් සඳහා විශ්වාස ඇප රක්ෂණ ඔප්පුවක් හා මාර්ගස්ථ රක්ෂණ ඔප්පුවක් මගින් රක්ෂණ ආවරණය ලබාදීම.

14.අයකිරීම් නියෝජිතයින් සඳහා ආකර්ශනීය කොමිස් මුදලක් ලබා දී අයකිරීම් කටයුතු සඳහා දිරිගැන්වීම.

15.ණය අයකිරීම්වලට අදාළ ව දිනපතා ලැබෙන මහජන ඉල්ලීම් සළකා බලා ලබා දිය හැකි සහන ලබාදීමට කටයුතු කිරීම තුළින් ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීම.

16.මූල්‍ය ඉලක්ක කරා ලඟාවීම සඳහා අය කරනු ලබන ණය සංඛ්‍යාව වැඩිවීම බලපාන බැවින් ඒ සඳහා දිස්ත්‍රික් කාර්යාලවල වැඩි අවධානයක් යොමු කරවීමට කටයුතු කිරීම.

17.සමස්ථ ආදායම් ඉලක්කය කෙරෙහි දේපළ ආදායම් උපයා ගැනීම බලපාන බැවින් දිස්ත්‍රික් කාර්යාලවල දේපළ අලෙවිය වැඩිකර ගැනීමට උනන්දු කිරීම.

18.දිස්ත්‍රික් ආදායම් වර්ධනය කර ගැනීම සඳහා වැඩමුළු පැවැත්වීම.

4.2 සංඛ්‍යා සටහන

නිවාස සාප්පු / වාරික සහ කුලී අයකිරීම්

ක්‍රියාකාරිත්වය - 2016

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රමාණය		%
		අයවැය	අයකිරීම්	
01	ප්‍රධාන කාර්යාලය	20.444	27.227	133.18
02	කොළඹ නගර (උතුර) මාලිගාවත්ත	23.000	42.381	184.27
03	කොළඹ නගර (දකුණ) මැනිංටවුන්	55.650	49.558	89.05
04	කොළඹ දිස්ත්‍රික්කය	31.400	17.783	56.63
05	ගම්පහ	25.350	36.289	143.15
06	මහනුවර	15.650	15.743	100.59
07	මාතර	15.200	2.924	19.24
08	කල්මුණේ / අම්පාර වාණිජ ගොඩනැගිලි	1.250	1.671	133.68
09	යාපනය	2.500	3.718	148.72
එකතුව		**190,444**	**197,294**	**103,60**

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

4

4.3 සංඛ්‍යා සටහන

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
(නිවාස ණය සහ නාගරික හා ග්‍රාමීය කුළී - 2016)


රු මි

අනු අංකය	දිස්ත්‍රික්කය	වර්ෂික ඉලක්කය-ණය	ණය ළඟාවීම	වාර්ෂික ඉලක්කය-කුලී	කුලී ළඟාවීම	වාර්ෂික ඉලක්කය	ළඟාවීම	%
1	කොළඹ නගර (උ)	32.759	15.748	50.361	20.447	83.120	36.195	44
2	කොළඹ නගර (ද)	22.882	9.603	68.497	49.004	91.379	58.607	64
3	කොළඹ දිස්ත්‍රික්	892.701	447.987	68.447	17.817	961.148	465.804	48
4	ගම්පහ	572.846	259.907	76.402	37.792	649.248	297.699	46
5	කලුතර	558.140	293.050	2.858	0.919	560.998	293.969	52
6	මහනුවර	544.898	305.823	18.972	11.454	563.870	317.277	56
7	මාතලේ	163.659	128.845	0.17	0.013	163.829	128.858	79
8	නුවරඑළිය	288.477	122.176	16.825	0.099	305.302	122.275	40
9	ගාල්ල	295.843	190.337	12.721	1.560	308.564	191.897	62
10	මාතර	296.419	193.898	22.231	3.817	318.650	197.715	62
11	හම්බන්තොට	188.507	119.532	2.882	0.798	191.389	120.330	63
12	කුරුණෑගල	225.320	191.119	3.05	0.563	228.370	191.682	84
13	පුත්තලම	192.010	123.327	1.533	0.601	193.543	123.928	64
14	අනුරාධපුරය	247.797	173.891	0.093	0.002	247.890	173.893	70
15	පොළොන්නරුව	151.305	79.996	0.957	0.000	152.262	79.996	53
16	බදුල්ල	343.870	134.664	1.074	2.890	344.944	137.554	40
17	මොණරාගල	481.271	182.981	3.528	1.397	484.799	184.378	38
18	රත්නපුර	165.242	126.724	0.15	0.399	165.392	127.123	77
19	කෑගල්ල	234.303	200.958	2.5	0.376	236.803	201.334	85
20	මඩකලපුව	154.442	96.206	11.035	0.139	165.477	96.345	58
21	අම්පාර	245.952	116.932	28.275	0.729	274.227	117.661	43
22	ත්‍රිකුණාමලය	114.671	75.782	7.463	0.149	122.134	75.931	62
23	යාපනය	110.198	103.130	25.265	2.772	135.463	105.902	78
24	මන්නාරම	63.292	40.260	1.409	0.392	64.701	40.652	63
25	වව්නියාව	121.558	100.032	1.91	4.926	123.468	104.958	85
26	මුලතිව්	49.011	68.141	0		49.011	68.141	139
27	කිලිනොච්චි	64.354	61.006	0.443	0.096	64.797	61.102	94
	මුළු එකතුව	**6821.727**	**3962.055**	**429.051**	**159.151**	**7250.778**	**4121.206**	57

මූලය - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

4.1 සංඛ්‍යා සටහන

ණය අයකිරීම් - 2001 සිට 2016 දක්වා



4

4.2 අභ්‍යන්තර විගණන අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරම්භයේ සිට අභ්‍යන්තර විගණන අංශය පවතින අතර පසුකාලීනව එයට විමර්ශන අංශය ද ඒකාබද්ධ කර ඇත. මෙම අංශය වාර්ෂික විගණන සැළැස්මක් මත කටයුතු කරනු ලබන අතර ඊට අමතරව පැවරෙන විශේෂ රාජකාරී සහ විමර්ශන කටයුතු සිදුකරනු ලබයි. එහි ප්‍රධාන කාර්යන් පහත පරිදි ය.

01. කළමනාකරණය විසින් හඳුන්වා දී ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවල පවත්නා ප්‍රමාණාත්මක බව හා ඵලදායකත්වය සම්බන්ධයෙන් ස්වාධීන අඛණ්ඩ ඇගයීමක් පවත්වා ගෙනයාම.

02. ක්‍රියාවට නංවා ඇති සංවර්ධන යෝජනා ක්‍රම හා ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කොට ඉලක්කගත අරමුණු කරා එය කොතෙක් දුරට ලඟා වී පවතින්නේ ද යන්න ඉහල කළමනාකාරිත්වය වෙත වාර්තා කිරීම.

03. අදාළ තොරතුරු සම්පාදනය කිරීමට දායක වෙමින් ඉහළ හා පහළ කළමනාකාරිත්වය අතර සම්බන්ධීකාරවරයෙකු වශයෙන් කටයුතු කිරීම.

2016 වසර තුළ වාර්ෂික විගණන සැලැස්ම අනුව පහත සඳහන් කටයුතු මෙම අංශය මගින් ඉටුකර ඇත.

01. **විගණන විමසුම්**

- i. රජයේ විගණන විමසුම් 04
- ii. අභ්‍යන්තර විගණන විමසුම් 82

02. **විමර්ශන කටයුතු පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම**

- i. නිදිසි අනතුරු සම්බන්ධයෙන් විමර්ශන කටයුතු 14
- ii. විෂමාචාර හා විශේෂ විමර්ශන කටයුතු 49

03. **දේපළ බැහැර කිරීමේ ක්‍රියාකාරිත්වය**

- i. පරීක්ෂා කළ ඔප්පු සංඛ්‍යාව 1822
- ii. පරීක්ෂා කළ 8/1 වගන්තිය 2029
- iii. වෙනත් දේපළ සම්බන්ධව පරීක්ෂණ කටයුතු 12

04. **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**

- i. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ රැස්වීම් 06
- ii. නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ රැස්වීම් 04
- iii. පූර්ව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01

05. **වෙනත් රාජ්‍ය ආයතනවල විමසීම්වලට අවශ්‍ය තොරතුරු සැපයීම**

- i. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව 03
- ii. මූල්‍ය අපරාධ විමර්ශන කොමිෂන් සභාව 07
- iii. අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව 01

06. **2016 වර්ෂයේ පාරිතෝෂික දීමනාවලට අදාළ ගෙවීම් පරීක්ෂා කිරීම.**

පාරිතෝෂික දීමනා ගොනු 96

07. **ආදායම් මෙහෙයුම් කමිටු හා ප්‍රසම්පාදන කටයුතුවල දී නිරීක්ෂයෙකු වශයෙන් සහභාගි වී කටයුතු කිරීම.**

4.3 තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස වැඩසටහන සඳහා සහභාගී වන නිවාස හිමියන්ගේ සන්නිවේදන අවශ්‍යතා සපුරාලීම සඳහා තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය 2016 වසරේ දී විවිධ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය පහත සඳහන් ඒකකයන් සමඟ ක්‍රියාත්මක කෙරේ.

- තොරතුරු හා ප්‍රචාරක ඒකකය
- සෙවණ මාධ්‍ය සේවය
- මුද්‍රණ ඒකකය

4.3.1 තොරතුරු හා ප්‍රචාරක ඒකකය

2016 වසරේ දී තොරතුරු හා ප්‍රචාරක ඒකකය පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද සැමට සෙවණ නිවාස වැඩසටහනට අදාළ මාධ්‍ය ආවරණ කටයුතු හා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය තුළින් මහජනතාව දැනුවත් කිරීම.
- සැමට සෙවණ වැඩසටහන යටතේ ආදර්ශ ගම්මාන 15 ක් 2016 අවුරුද්ද තුළ ජනතා අයිතියට පත් කරන ලදී. එනම්,

01. මුලතිව් වැලිඔය ඉසුරුපුර
02. හම්බන්තොට තිස්සමාහාරාම සහනගම
03. හම්බන්තොට සංහිඳගම
04. මහනුවර දෙල්තොට රන්කෙත්ගම
05. අම්පාර නවගම්පුර දයාපුර
06. මඩකලපුව එරාවුර්පත්තු කාමච්චි ග්‍රාමම්
07. හම්බන්තොට තිස්සමහාරාම සම්පතගම
08. කළුතර බුලත්සිංහල නවෝද්‍යාගම
09. පොළොන්නරුව දිඹුලාගල නුවරගල

10. හම්බන්තොට තිස්සමහාරාම සොබාසෙත්ගම
12. හම්බන්තොට සෙත්සඳගම
13. පොළොන්නරුව දිඹුලාගල සිරිසීලාලංකාර නාහිමිගම
14. කුරුණෑගල බමුණාකොටුව එදිරිමානගම
15. හම්බන්තොට ලුණුගම්වෙහෙර සිතුමිණිගම
16. අනුරාධපුර තලාව දෙවනපැතිස්ගම

- ආදර්ශ ගම්මාන විවෘත කිරීමේ උත්සව, මුල්ගල් තැබීමේ උත්සව, සැමට සෙවණ වැඩසටහනට අදාළ උත්සව ඇතුළු ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල උත්සව සැළසුම් කිරීම, ප්‍රචාරණය, ශබ්ද විකාශන යන්ත්‍ර ලබාදීම ඇතුළු උත්සව සංවිධානය.
- සැමට සෙවණ වැඩසටහනට අදාළ සියලු ම උත්සවයන්හි සමරුකළාප සකස් කිරීම.
- ඒ සඳහා අවශ්‍ය තොරතුරු හා ඡායාරූප ආදර්ශ ගම්මානවලට ගොස් ලබා ගැනීම.
- ප්‍රචාරක කටයුතුවලට අදාළ ව සියලු ම දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කිරීම.
- උත්සව ආශ්‍රිත ඡායාරූප මුද්‍රණය කර 5 සහ 6 මහලේ ඇති පුවරුවලට ඇතුළත් කිරීම.
- ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් සෑම වසරක ම පවත්වනු ලබන චිත්‍ර සහ රචනා තරඟවලට අදාළ සියලු ම සංවිධාන කටයුතු කිරීම.
- චිත්‍ර හා රචනා ලබා ගැනීම, විනිශ්චය සඳහා යොමු කිරීම, ජයග්‍රාහකයින් තෝරා ගැනීම, ජයග්‍රාහකයින් සඳහා සහතික පත්‍ර හා කුසලාන නිර්මාණය කිරීම.
- එදිනෙදා පුවත්පත්හි පළ වී ඇති නිවාස කටයුතු සම්බන්ධ ප්‍රවෘත්ති පුවත්පතින් ඉවත් කර ඒකරාශී කිරීමේ කටයුතු.
- එදිනෙදා විකාශනය කරන ප්‍රවෘත්ති හා නිවේදන සැකසීම හා ප්‍රචාරණය කිරීම.
- උදෑසන ජාතික ගීය සහ අනෙකුත් ගී වාදනය කිරීම.
- ජනතා අයිතියට පැවරෙන ගම්මාන ආශ්‍රිත ඡායාරූප ප්‍රදර්ශන පැවැත්වීම.
- වෙනත් උත්සව සඳහා අවශ්‍ය සැරසිලි සඳහා ප්‍රදර්ශනයන් සඳහා අවශ්‍ය ප්‍රදර්ශන කුටි නිර්මාණය කිරීම.
- ආදර්ශ ගම්මාන උත්සව හා අධිකාරියේ පවත්වන ලද උත්සව කටයුතුවල ඡායාරූප ලබා ගැනීම.
- දිස්ත්‍රික්වලට අදාළ සංවර්ධන තොරතුරු ඇතුළත් පොත් නිකුත් කිරීම.
- සංවර්ධන වැඩසටහන්වලට අදාළ වාර්තාමය චිත්‍රපට සකස් කිරීම.
- සංවර්ධන වැඩසටහන්වලට අදාළ තොරතුරු රැස්කිරීම.

4.3.2 සෙවණ මාධ්‍ය ඒකකය

2016 වසරේ දී සෙවණ මාධ්‍ය සේවය නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, සහධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය, රජයේ කර්මාන්ත ශාලාව, රාජ්‍ය සංවර්ධන නිර්මාණ නිතීගත සංස්ථාව, සී/ ඕෂන්විච් සංවර්ධන (පුද්) සමාගම, සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඇතුළු ආයතනවල විවිධ පුවත්පත් දැන්වීම් පළකිරීම සිදුකරන ලදී.

- 2016 වසරේ දී සෙවණ මාධ්‍ය සේවයෙහි වාර්ෂික ඇස්තමේන්තුගත ලාභය රු.මිලියන 3.0 කි. 2016 දෙසැම්බර් දක්වා ලැබූ ආදායම රු. මිලියන 57.54 ක් වන අතර ලාභය රු.මිලියන 7.62 කි.
- සෙවණ මාධ්‍ය සේවයේ සියලු ඉපැයීම් "සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය" නමින් වෙනම ගිණුමකට බැර කරනු ලබන අතර, මෙම අරමුදල් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා යොදාගනු ලැබේ.


4.4 සංඛ්‍යා සටහන
සෙවණ මාධ්‍ය සේවය
2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආදායම් සහ ලාභ

මාසය	ආදායම රු.	ලාභය රු.
ජනවාරි	4,016,968.56	550,371.41
පෙබරවාරි	659,497.04	85,577.47
මාර්තු	1,105,787.68	149,430.75
අප්‍රේල්	4,001,062.11	545,119.05
මැයි	3,561,550.86	470,668.50
ජූනි	6,122,535.27	797,162.25
ජූලි	6,612,371.88	822,633.84
අගෝස්තු	1,764,724.73	237,192.75
සැප්තැම්බර්	4,804,605.47	655,616.25
ඔක්තෝම්බර්	8,462,641.68	1,157,424.00
නොවැම්බර්	8,951,137.11	1,170,836.25
දෙසැම්බර්	7,481,164.04	983,921.25
එකතුව	**57,544,046.43**	**7,625,953.77**

4

4.1 රූප සටහන

2016 වර්ෂය සඳහා ආදායම් ඉලක්කය - රු.මි. 3.0



4.3.3 මුද්‍රණ ඒකකය

ජපන් රජයේ ආධාර මත 1985 වසරේ ලැබුණු අප මුද්‍රණාලය සේවක මහතුන් තිදෙනෙකුගේ සහයෙන් පවත්වාගෙන යනු ලබයි. එමගින්,

- ❖ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවලට අදාළ සියලුම ලිපි ලේඛන සහ පොත් මුද්‍රණය කිරීම.
- ❖ ආදර්ශ ගම්මානවලට අදාළ ඔප්පු ප්‍රදාන පත්‍ර මුද්‍රණය කිරීම.
- ❖ මුද්‍රණ ඇණවුම්වලට අදාළ පොත් බැඳුම් කටයුතු කිරීම.

ආදී සියලු මුද්‍රණ කටයුතු සිදුකරයි. 2016 වර්ෂයේ මුද්‍රණ කටයුතුවල මූල්‍යමය වටිනාකම රු. 3,979,590/- පමණ වේ.

4.4 තොරතුරු තාක්ෂණ අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරමාර්ථයන් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යභාරය හැකි උපරිමයෙන් ඉටු කිරීමට උත්සාහ කළ වර්ෂයක් ලෙස 2016 වර්ෂය සඳහන් කළ හැකි ය. ඒ අනුව, ආයතනයේ එක් එක් කොට්ඨාශ වෙත පරිගණක ජාල පහසුකම් ලබාදීම තුළින් තොරතුරු හුවමාරු කර ගැනීමේ පහසුකම හා මුද්‍රණ පිටපත් ලබාගැනීමේ පහසුව ලැබීම තුළින් ද ආයතනයේ පරිගණක අළුත්වැඩියා කටයුතු බොහොමයක් පරිගණක අංශය තුළ ම සිදුකිරීමට ඇති පහසුකම නිසා හා පරිගණක භාවිතයේ දී එදිනෙදා ඇති වන දෝෂ නිවැරදි කිරීම පරිගණක අංශයේ නිලධාරීන් විසින් කඩිනමින් සිදුකිරීම මත සමස්ථ ක්‍රියාවලිය තුළ එහි සේවා ඵලදායිතාවය දියුණු කිරීම සඳහා පරිගණක හා තොරතුරු තාක්ෂණ භාවිතය පසුගිය වසර කීපය තුළ

සතුටුදායක ලෙස ඉහළ ගොස් ඇත. ඒ තුළින් අප අධිකාරිය විසින් මහජනතාව වෙත ලබා දෙන සේවාවන් හි ගුණාත්මකභාවය මෙන්ම කාර්යක්ෂතාවය ද වැඩිදියුණු වී ඇත. මේ සඳහා විශේෂයෙන් ම නිවාස සංවර්ධන ක්‍රියාවලියන් මෙන්ම නිවාස ණය නිකුත් කිරීම හා මූල්‍ය පරිපාලන කටයුතුවලදී ද මානව සම්පත් සංවර්ධන කටයුතු සඳහා ද, අධිකාරිය සතු දේපළ කළමනාකරණ කටයුතු මෙන්ම ඔප්පු ලබාදීම්, ඒ හා සම්බන්ධිත නීතිමය ක්‍රියාවලිය තුළ මෙන්ම අනෙකුත් පරිපාලන කටයුතු සඳහා ද පරිගණක හා තොරතුරු තාක්ෂණ භාවිතය මේ වන විට ඉහල මට්ටමක පවතී.

එවකට තොරතුරු තාක්ෂණ අංශය ට පමණක් සීමා වී තිබූ අන්තර්පාල පහසුකම්, පසුව ප්‍රධාන කාර්යාලයේ සියලු ම අංශ වෙත හා සියලු ම දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දීමෙන් ඒවායෙහි කාර්යයන් කාර්යක්ෂම ඉටුකිරීමට දායකවීමට හැකි විය. තවද, ස්කයිප් (Skype) හා ටීම් වීවර් (Team Viewer) යන කාක්ෂණයන් හඳුන්වාදීමෙන් දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය අතර තොරතුරු හුවමාරු කිරීම වඩාත් කාර්යක්ෂම ව සිදුවන අතර, ඒ තුළින් ආයතනයේ සමස්ත ක්‍රියාවලිය තුළ ඉලෙක්ට්‍රොනික් දත්ත හුවමාරුවේ විශාල ප්‍රගතියක් දැකගත හැකි ය.

තවද, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවක සේවිකාවන් ට (දිස්ත්‍රික් කාර්යාල ඇතුළු) ඔවුන්ගේ එදිනෙදා රාජකාරි කාර්යක්ෂමව කරගැනීම සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය වැඩිදියුණු කරගත හැකි ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීම් සිදුකරගෙන යනු ඇත. ඊට අමතරව සමස්ථ වැඩසටහන ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය තොරතුරු රැස්කිරීම හා ඒවා විශ්ලේෂණය කර ඉහල කළමනාකාරිත්වයට තීරණ ගතහැකි ආකාරයට ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයන් ද තොරතුරු තාක්ෂණ අංශය මගින් සකස් කර, පුහුණු කර, අදාළ අංශ වෙත ලබා දී එම කාර්යන් සිදුවෙමින් පවතී.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජනතාවට වඩාත් සමීප කරවීම සඳහා අධිකාරියේ නිල මුහුණු පොත එළිදක්වා ඇත. මේ තුළින් ආයතනයේ සමස්ථ ක්‍රියාවලිය පිළිබඳ ව තොරතුරු ක්ෂණිකව මහජනතාවට දැනගැනීමට හැකියාව සැලසී ඇත. මෙම ක්‍රියාදාමය තුළින් ආයතනයේ ඉතිහාසය පිළිබඳව තොරතුරු දැනගැනීමට අවශ්‍ය අය ට මහඟු අවස්ථාවක් උදාකර දී ඇත. එදිනෙදා ගනු ලබන තීන්දු තීරණ හා ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳ තොරතුරු, නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම, ජනතා අයිතියට පත්කිරීම, ස්වාභාවික ව්‍යසනයක දී මහජනතාව වෙනුවෙන් කැප වී ක්‍රියාකරන ආකාරය හා දිළිඳු ජනතාවට ලබාදෙන සහන පිළිබඳව ක්ෂණිකව දැනගැනීමට ඇති හැකියාව මෙන්ම ඒ පිළිබඳව අදහස් දැක්වීමට ද අවස්ථාව සළසා ඇත.

මෙම ක්‍රියාවලිය මගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පිළිබඳව ලෝකයේ ඕනෑම රටක සිටින අයෙකුට තොරතුරු හුවමාරු කරගැනීමට ඇති හැකියාව නිසා අපගේ මෙහෙවර ලොවට ඉදිරිපත් කිරීමට අවස්ථාව සැළසී ඇත.

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය වෙත නිර්මාණය කරමින් පවතින වෙබ් පාදක (Web Base) මෘදුකාංගය තුළින් ලංකාවේ ඕනෑම දිස්ත්‍රික් කාර්යාලයක සිටින සේවකයකු පිළිබඳ ව සියලු ම දත්ත ක්ෂණිකව ලබාගැනීමට ඇති හැකියාව නිසා සේවක ගැටලු විසඳීමේ දී වැඩි පහසුවක් සැළසී ඇත.

එමෙන්ම, නිවාස සංවර්ධන අධිකාරියේ පවතින සන්නිවේදන කටයුතු වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව ඉටුකර ගැනීමට හැකිවන පරිදි වෙබ් පාදක (Web Base) මෘදුකාංගයක් නිර්මාණය කර ඇත. මෙම වැඩසටහන තුළින් ආයතනයට ලැබෙන සියලු ම ලිපි පිළිබඳව මනා සැළසුම් හා ක්‍රමවත් භාවයකින් යුතු ව කටයුතු කිරීමට හැකියාව ලැබී ඇත. ඕනෑම ලිපියක් පිළිබඳව ඉහල කළමනාකාරිත්වයට ක්ෂණිකව පසු විපරම් කිරීමට ඇති හැකියාව හා අදාළ කාර්යන් පහසුවෙන් ඉටුකර ගැනීමට හැකියාව එමගින් සැළසී ඇත.

4

4.5 සී/ස ඕෂන්විව් ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගම

4.5.1 හැඳින්වීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ හා නාගරික සංවර්ධන අධිකාරියේ කොටස් හිමිකාරත්වය යටතේ බම්බලපිටිය ටවර් ගොඩනැගිල්ල අංක 94/340/006 සහ 1994.02.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත. පසුකාලීනව එය ලියාපදිංචි අංක PV17667 ලෙස 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව නැවත ලියාපදිංචි කිරීම සිදුකර ඇත.

4.5.2 දැක්ම

2015.12.31 දින ට ශේෂය	40.000	23,957.284	(12,294.823)	11,702.461	834.304	12,536.765
ඕ.වී.ඩී.ෂී. ආයතනයේ විගණන කරන ලද ගිණුම් අනුව වෙනස්වීම	-	-	157.053	157.053	120.946	277.999
2015.12.31 දින ට නැවත ප්‍රකාශිත ශේෂය	40.000	23,957.284	(12,137.770)	11859.514	955.250	12814.764
2016.01.01 දින ට ශේෂය	40.000	23,957.284	(12,137.770)	11,859.514	955.250	12,814.764
2016 සඳහා හිමිකාරත්වය වෙනස්වීම	-	5,190.867	-	5,190.867	-	5,190.867
අතිරික්තය / හිඟ කාල සීමාව සඳහා	-	-	235.604	235.604	(3.603)	232.001
2016.12.31 දින ට ශේෂය ඉදිරියට ගෙනගිය	**40.000**	**29,148.152**	**(11,902.166)**	**17,285.986**	**951.647**	**18,237.633**

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ පාලිත සමාගම
2016 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	ජා.නි.සං.අ	ඔ.වි.ඩි.සී.සමාගම	සමූහය	සමූහය නැවත ප්‍රකාශිත
	2016	2016	2016	2015
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය	රු. මි.	රු. මි.	රු. මි.	රු. මි.
ආදායම් බදුවලට පෙර අතිරික්තය / හිඟ	240.302	(8.301)	232.001	(996.870)
මුදල් නොවන සංසරණ				
පාරිතෝෂික වෙන්කිරීම්	99.882		99.882	147.766
පාරිතෝෂික ගැලපීම්	(0.304)		(0.304)	
විගණන ගාස්තු සඳහා වෙන්කිරීම්	0.850		0.850	0.448
සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සහ අධිභාර වෙන්කිරීම්	215.781			
ක්ෂය කිරීම්	73.596	8.989	82.585	55.811
අලාභ සහ ආයෝජන කපාහැරීම්	(286.656)		(286.656)	
ආධාර යටතේ වාහන සඳහා ක්ෂය වෙන්කිරීම්			-	25.788
බොල් හා අඩමාන ණය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	139.770		139.770	212.568
අඩමාන ණය කපාහැරීම			-	2.499
ක්‍රමක්ෂය වෙන්කිරීම් සම්බන්ධිත වර්ගයේ හා වෙනත්		0.018	0.018	
ක්‍රමක්ෂය අස්පෘශ්‍ය වත්කම් සඳහා		0.022	0.022	0.022
අවසන් නොවූ උසාවි නඩු සඳහා වෙන්කිරීම් - ජා.නි.ස.අ.	0.200		0.200	0.113
ස්ථාවර වත්කම් විකුණුම් ආදායම්	(4.133)	0.521	(3.612)	(18.005)
පොලී ආදායම්	(182.005)	(3.829)	(185.834)	(53.829)
පොලී වියදම්		1.773	1.773	(1.098)
ලාභාංශ ලැබීම්	(183.721)	(126.740)	(183.721)	(17.377)
මෙහෙයුම්වලින් ලද ලාභය කාරක ප්‍රාග්ධනයට පෙර	113.562	(0.807)	(103.026)	(642.164)
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්				
වැඩිවීම්/ අඩුවීම් කෙරෙහෙන යන වැඩ	129.328	(3.593)	125.735	13.002
වැඩිවීම්/ අඩුවීම් අනෙකුත් ලැබීම්	(105.584)	4.364	(101.220)	239.825
වැඩිවීම්/ අඩුවීම් ගෙවිය යුතු වියදම්	(528.086)	16.869	(511.217)	75.933
මෙහෙයුම් කටයුතුවලින් මුදල් ඉපැයීම	(390.780)	16.833	(589.728)	(819.640)
පාරිතෝෂික ගෙවීම්	(82.448)	-	(82.448)	(62.024)
විගණන ගාස්තු	(1.501)	-	(1.501)	-
ආදායම් බදු ගෙවීම්	-	(2.086)	(2.086)	(2.395)
පොලී ගෙවීම්	-	(1.773)	(1.773)	-
ලාභාංශ ගෙවීම්	- (83.949)	-	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල්	(474.729)	12.974	(677.536)	(884.059)
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය				
දිගු කාලීන ආයෝජන				-
දේපළ පිරියත හා උපකරණ මිල දී ගැනීම්	(20.865)	(2.991)	(23.856)	(92.489)
වැඩිවීම්/අඩුවීම් සංවර්ධන වත්කම්	(3,022.641)		(3,022.641)	(2,439.950)
දේපළ පිරියත උපකරණ විකිණීමෙන් ලද මුදල්	4.137	0.062	4.199	23.571
දේපළ ආයෝජනයන් එකතු කිරීම්		(19.229)	(19.229)	(7.022)
පොලී ලැබීම්	182.005	2.572	184.577	52.777
පොලී ලැබීම්				1.995
ආයෝජ්‍යනයන් කල්පිරීමට ලද ශුද්ධ චටිනාකම		0.027	0.027	-
ලාභාංශ ලැබීම්	183.721		183.721	17.377
පාරිතෝෂික අරමුදල			-	3.420
ආයෝජන අරමුදල්	- (2,673.643)		-	24.500
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදූ මුදල්	(3,148.372)	(6.585)	(3,370.738)	(2,793.644)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය				
ආධාර ලැබීම්	6451.532	-	6451.532	4,664.671
ආධාර ගෙවීම්	(1,260.664) 5,190.867	-	(1,260.664)	(515.707)
ණය ලැබීම්	0.010	-	0.010	743.641
ණය ගෙවීම්	(1,222.259) (1,222.249)		(1,222.259)	(880.734)
ශුද්ධ එකතුව මූල්‍ය බදු වගකීම් සඳහා	- -	(4.802)	(4.802)	16.830
මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන්ගේ ශුද්ධ වැඩිවීම	820.246	(11.387)	593.079	1,235.057
කාල පරිච්ඡේදය ආරම්භක දින ට මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන්	2,124.453	14.075	2,138.528	903.471
කාල පරිච්ඡේදයේ අවසාන දින ට මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන්	**2,944.699**	**2.688**	**2,731.607**	**2,138.528**

මුදල් ප්‍රවාහ වාර්තාවට සටහන්


මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන්

අතැති මුදල් බැංකු ශේෂ මූල්‍ය වෙළඳපොලේ මුදල් ආයෝජන වලින් මුදල් හා මුදල් වලට සමාන ආදේශයන් සමන්විත වේ.
පහත සඳහන් මූල්‍යමය අගයන් මුදල් ප්‍රවාහ වාර්තාවේ මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන්ට අයත් වේ.

	2016	2015
අතැති මුදල් සහ බැංකු ශේෂ	726.334	1,069.894
කෙටි කාලීන ආයෝජන	2,218.365	1,068.634
	2,944.699	**2,138.528**

6

දිස්ත්‍රික් කාර්යාල


යාපනය
කිලිනොච්චිය
මුලතිවු
මන්නාරම
වවුනියාව
අනුරාධපුරය
පුත්තලම
කුරුණෑගල
පොලොන්නරුව
මඩකලපුව
මාතලේ
කුවර
ගම්පහ
කෑගල්ල
අම්පාර
බදුල්ල
කුවරළළිය
කොළඹ
මොණරාගල
කළුතර
රත්නපුර
හම්බන්තොට
ගාල්ල
මාතර

6

දිස්ත්‍රික් කාර්යාල නම් හා ලිපිනයන්

1. දිස්ත්‍රික් කාර්යාලය : කොළඹ නගර (උතුර)
   ලිපිනය : පරිසරමාවත, මාළිගාවත්ත, කොළඹ 10
   දුරකථනය : 011 2445546 ෆැක්ස් : 011 2435146
   ඊමේල් : dmccity@nhda.lk

2. දිස්ත්‍රික් කාර්යාලය : කොළඹ නගර (දකුණ)
   ලිපිනය : 280/11, ඇල්විටිගල ම.නිවාස, කො. 08
   දුරකථනය : 011 2679857 ෆැක්ස් : 011 2669753
   ඊමේල් : dmmtown@nhda.lk

3. දිස්ත්‍රික් කාර්යාලය : කොළඹ දිස්ත්‍රික් කාර්යාලය
   ලිපිනය : අංක 190, හොරණපාර, කොට්ටාව
   දුරකථනය : 011 2178226 ෆැක්ස් : 011 2178224
   ඊමේල් : dmcolombo@nhda.lk

4. දිස්ත්‍රික් කාර්යාලය : ගම්පහ
   ලිපිනය : වලව්වත්ත, ගම්පහ
   දුරකථනය : 033 2226017 ෆැක්ස් : 033 2234265
   ඊමේල් : dmgampaha@nhda.lk

5. දිස්ත්‍රික් කාර්යාලය : කළුතර
   ලිපිනය : 03 වන මහල, මහලේකම් කාර්යාලය, කළුතර
   දුරකථනය : 034 2222298 ෆැක්ස් : 034 2222298
   ඊමේල් : dmkalutara@nhda.lk

6. දිස්ත්‍රික් කාර්යාලය : මහනුවර
   ලිපිනය : යටිනුවර වීදිය, මහනුවර
   දුරකථනය : 081 2234967 ෆැක්ස් : 081 2223139
   ඊමේල් : dmkandy@nhda.lk

7. දිස්ත්‍රික් කාර්යාලය : මාතලේ
   ලිපිනය : කච්චේරි සංකීර්ණය, මාතලේ
   දුරකථනය : 066 2222134 ෆැක්ස් : 066 2222134
   ඊමේල් : dmmatale@nhda.lk

8. දිස්ත්‍රික් කාර්යාලය : නුවරඑළිය
   ලිපිනය : හාවාඑළිය, නුවරඑළිය
   දුරකථනය : 052 2222925 ෆැක්ස් : 052 2222925
   ඊමේල් : dmnelia@nhda.lk

9. දිස්ත්‍රික් කාර්යාලය : ගාල්ල
   ලිපිනය : ඊකෝට්ස් ගොඩනැගිල්ල, කොටුව, ගාල්ල
   දුරකථනය : 091 2234373 ෆැක්ස් : 091 2234232
   ඊමේල් : dmgalle@nhda.lk

10. දිස්ත්‍රික් කාර්යාලය : මාතර
    ලිපිනය : දුම්රියපොළපාර, මාතර
    දුරකථනය : 041 2222986 ෆැක්ස් : 041 2229257
    ඊමේල් : dmmatara@nhda.lk

11. දිස්ත්‍රික් කාර්යාලය : හම්බන්තොට
    ලිපිනය : අංක 42, අළුත් පාර, හම්බන්තොට
    දුරකථනය : 047 2222013 ෆැක්ස් : 047 2222013
    ඊමේල් : dmhambantota@nhda.lk

12. දිස්ත්‍රික් කාර්යාලය : යාපනය
    ලිපිනය : නුවර පාර, යාපනය
    දුරකථනය : 021 2222039 ෆැක්ස් : 021 2222039
    ඊමේල් : dmjaffna@nhda.lk

13. දිස්ත්‍රික් කාර්යාලය : මන්නාරම
    ලිපිනය : පල්ලිමොන පාර, ඔප්පුකුලම්, මන්නාරම
    දුරකථනය : 023 2222315 ෆැක්ස් : 023 2222141
    ඊමේල් : dmmannar@nhda.lk

14. දිස්ත්‍රික් කාර්යාලය : මුලතිව්
    ලිපිනය : නුවරපාර (A9), මාන්කුලම් (මුලතිව්)
    දුරකථනය : 021 2060033 ෆැක්ස් : 021 2060022
    ඊමේල් : dmmulativu@nhda.lk

15. දිස්ත්‍රික් කාර්යාලය : මඩකලපුව
    ලිපිනය : කල් අඩි, මඩකලපුව
    දුරකථනය : 065 2224473 ෆැක්ස් : 065 2227310
    ඊමේල් : dmbatticaloa@nhda.lk

16. දිස්ත්‍රික් කාර්යාලය : අම්පාර
    ලිපිනය : ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අම්පාර
    දුරකථනය : 063 2222045 ෆැක්ස් : 063 2222045
    ඊමේල් : dmampara@nhda.lk

17. දිස්ත්‍රික් කාර්යාලය : ත්‍රිකුණාමලය
    ලිපිනය : විදුලිබලාගාර මාවත, ත්‍රිකුණාමලය
    දුරකථනය : 026 2222162 ෆැක්ස් : 026 2222503
    ඊමේල් : dmtrinco@nhda.lk

18. දිස්ත්‍රික් කාර්යාලය : කුරුණෑගල
    ලිපිනය : අංක 05, මිහිඳු මාවත, කුරුණෑගල
    දුරකථනය : 037 2222014 ෆැක්ස් : 037 2222014
    ඊමේල් : dmkurunegala@nhda.lk

19. දිස්ත්‍රික් කාර්යාලය : පුත්තලම
    ලිපිනය : ගම් උදාව,ආණමඩුව
    දුරකථනය : 032 2263427 ෆැක්ස් : 032 2263425
    ඊමේල් : dmputtalam@nhda.lk

20. දිස්ත්‍රික් කාර්යාලය : අනුරාධපුර
    ලිපිනය : බණ්ඩාරනායක මාවත, අනුරාධපුරය
    දුරකථනය : 025 2222558 ෆැක්ස් : 025 2222649
    ඊමේල් : dmanuradhapura@nhda.lk

21. දිස්ත්‍රික් කාර්යාලය : පොලොන්නරුව
    ලිපිනය : පුලතිසිගම, හිඟුරක්ගොඩ
    දුරකථනය : 027 2246362 ෆැක්ස් : 027 2246362
    ඊමේල් : dmpolonnaruwa@nhda.lk

22. දිස්ත්‍රික් කාර්යාලය : බදුල්ල
    ලිපිනය : සායන පාර, බදුල්ල
    දුරකථනය : 055 2222113 ෆැක්ස් : 055 2223163
    ඊමේල් : dmbadulla@nhda.lk

23. දිස්ත්‍රික් කාර්යාලය : මොණරාගල
    ලිපිනය : දිස්ත්‍රික් කාර්යාලය, මොණරාගල
    දුරකථනය : 055 2276202 ෆැක්ස් : 055 2276202
    ඊමේල් : dmmonaragala@nhda.lk

24. දිස්ත්‍රික් කාර්යාලය : රත්නපුරය
    ලිපිනය : නව නගරය, රත්නපුරය
    දුරකථනය : 045 2228724 ෆැක්ස් : 045 2228996
    ඊමේල් : dmrathnapura@nhda.lk

25. දිස්ත්‍රික් කාර්යාලය : කෑගල්ල
    ලිපිනය : අඔන්පිටිය, ගලිගමුව නගරය, කෑගල්ල
    දුරකථනය : 035 2229737 ෆැක්ස් : 035 2229737
    ඊමේල් : dmkegalle@nhda.lk

26. දිස්ත්‍රික් කාර්යාලය : කිලිනොච්චිය
    ලිපිනය : 155, A 9 පාර, කිලිනොච්චිය
    දුරකථනය : 021 2285757 ෆැක්ස් : 035 2229737
    ඊමේල් : dmkilinochchi@nhda.lk

27. දිස්ත්‍රික් කාර්යාලය : වවුනියාව
    ලිපිනය : පාර්ක් මාවත, වවුනියාව
    දුරකථනය : 024 2222214 ෆැක්ස් : 024 2222050
    ඊමේල් : dmvavuniya@nhda.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒඑයුඩී/ඒ/එන්එච්ඩීඒ/1/16/17 මඹේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 ඔක්තෝබර් 31 දින

සභාපති,

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1979 අංක 17 දරන නිවාස සංවර්ධන අධිකාරි පනතේ 29.1 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 සහ 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

තත්ත්වාගණනය කළ මතය - අධිකාරිය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ චත්මන් සභාපතිවරයා ජාතික නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙකු (ස්වාධීන නොවන - විධායක නොවන) ලෙස කටයුතු කරන අතර, එම බැංකුවේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 49 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වුවත් ආශ්‍රිත සමාගමක් ලෙස සලකා ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමට හා සම්බන්ධිත පාර්ශව සම්බන්ධයෙන් ගිණුම්වල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගම වූ සීමාසහිත ඕෂන්විව් ඩිවෙලොප්මන්ට් සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ අතර, පරිපාලිත සමාගමේ ශුද්ධ වත්කම් ප්‍රමාණය අධිකාරියේ ශුද්ධ වත්කම්වලින් සියයට14 ක් විය.

2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - අධිකාරිය

2.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 7.4 අනුව මාළිගාවත්ත සිඒඅර් ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.මිලියන 58.12 ක මුදල ගෙවිය යුතු ඉඩම් වන්දිවලින් හිලව් කරනු ලබන බව දක්වා තිබුණද එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පැවති රු.332,025 ක් වූ අස්පෘශ්‍ය වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.23,700 ක් ක්‍රමක්ෂය කර තිබුණද, මේ සම්බන්ධයෙන් ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.3.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

අධිකාරියේ වත්කම් වලින් සියයට 12 ක් නියෝජනය කරනු ලබන මූල්‍ය වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරෙන පරිදි ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

හුවමාරු නොවන ගනුදෙනුවක් යටතේ 1987 හා 1988 වර්ෂවලඅත්පත් කරගෙන තිබූ හන්තාන නිවාඩු නිකේතනයට අයත් පර්වස් 170.56 ක ඉඩමේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,520ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගයට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී මහනුවර දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ලට රු.මිලියන 33.7ක් වැයකර අළුතින් කොටස් එකතුකර තිබුණි. එසේ වුවත් 2016 වර්ෂයේදී ගොඩනැගිලි සඳහා ක්ෂය ගණනය කිරීමේදී මෙම කොටස සඳහා ක්ෂය ගණනය කර නොතිබුණු බැවින් ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.841,365 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය මගින් මිලදී ගත් රු.144,300 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයෙහි වටිනාකම සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ කාර්යාල උපකරණ හා මෙවලම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) නිවාස යෝජනා ක්‍රමවල තවදුරටත් ඉතිරි වී තිබුණු ඉඩම් කැබලි සහ නිවාස යෝජනා ක්‍රම සඳහා පවරාගෙන තිබුණු ඉඩම් හෙක්ටයාර් 450.3484 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. එසේම ස්ථිර කාර්යාල හා කුලී ගොඩනැගිලි ඉදිකර ඇති අධිකාරිය සතු ඉඩම් කොටස් 32 ක වටිනාකමද සමාලෝචිත වර්ෂය අවසානයට තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) නිවාස ඉදිකිරීම් සඳහා පශු සම්පත් අමාත්‍යාංශයෙන් ලැබී ඉතිරි වී තිබුණු රු. මිලියන 13.32 ක් 2012 වර්ෂයේ සිට ගෙවිය යුතු ලෙස ගිණුම් ගතකිරීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ආධාර යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඉ) වසර 5 කට අධික කාලයක් තිස්සේ කුලී/බදු පදනම මත ලබාදී තිබූ රු.මිලියන 7.08 ක් වටිනා නිවාස ඒකක 09 ක් ආයෝජන වත්කම් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට 2016 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ තොග ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඊ) ගිණුම්කරණ ප්‍රතිපත්ති 7.4 අනුව, වෙනත් ආයතන වලින් අයවියයුතු විවිධ ණයගැතියන් රු.මිලියන 72.42 ක් වෙනුවෙන් සියයට 20 ක අඩමාන ණය වෙන්කල යුතු වුවද වර්ෂ 05 ට වැඩි එකතුව රු.මිලියන 71.06 ක ණයගැතියන් සඳහා පමණක් වෙන් කිරීම් සිදුකර තිබීම හේතුවෙන් අඩමාන ණය වෙන්කිරීම් රු.272,372 ක්අඩුවෙන් දක්වා තිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභයද එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.

2.3.4 පැහැදිලි නොකල වෙනස්කම්

සමාලෝචිත වර්ෂය අවසානයට දිරිපියස ණය ක්‍රමය යටතේ බැංකු 06 කින් අධිකාරිය විසින් ලබාගත් ණය ශේෂය රු.මිලියන 19.7 ක් වූ අතර එම බැංකු විසින් ලබාදුන් ශේෂ සනාථන අනුව වටිනාකම් සහ ලෙජරයේ සඳහන් වටිනාකම් අතර රු.මිලියන 7.81 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

1984 වර්ෂයේ සිට 2002 වර්ෂය දක්වා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.මිලියන 104.36 ක් හා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.මිලියන 52.52 ක් හිලව් කර රු.මිලියන 51.84 ක ලැබිය යුතු ශේෂයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එහෙත්, නාගරික සංවර්ධන අධිකාරියේ ශේෂ සනාථ කිරීම්වල මෙම අධිකාරියෙන් රු.මිලියන 39.89 ක් ලැබිය යුතු බව සඳහන් කර තිබුණි.

2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය මගින් නිවාස ණය වාරික හා ඉඩම් විකුණුම් ණය වාරික අයකර ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දිස්ත්‍රික් කාර්යාලය මගින් වතු නිවාස ණය යටතේ ලබාදී තිබූ රු.මිලියන 5.64 ක ණය මුදලින් රු.මිලියන 3.69 ක් අයවීමේ ප්‍රමාද කාලය වර්ෂ 05 ඉක්මවා තිබුණි.

(ii) 2012 වර්ෂයට පෙර විකුණන ලද ඉඩම් පිළිබඳ වාර්තාවට අනුව, රු.514,948 ක් වටිනා ඉඩම් කට්ටි 03 කට අදාළ කිසිදු වාරිකයක් එම ඉඩම් විකුණූ දින සිට අයකර නොතිබුණු අතර වාරික අයවෙමින් පවතින ඉඩම් කට්ටි 43 කට අදාළවද හිහ වාරික පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) එකවර මුදල් අයකර ගැනීමේ එකඟතාවය මත දිස්ත්‍රික් කාර්යාලය විසින් විකුණන ලද ඉඩම් කැබලි 04 ක් සඳහා අයවිය යුතු එකතුව රු.770,875 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

(iv) කරුණාරත්නගම නිවාස ක්‍රමයේඅංක 56 දරන ඉඩම් කොටස සඳහා ඉල්ලුම් කරන ලද ඉහළම මිල රු.850,000 ක් වුවද සම්මුඛ පරීක්ෂණයේදී වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත් රු.725,000 ක වටිනාකම ඉදිරිපත් කර තිබුණු පුද්ගලයෙකු වෙත මෙම ඉඩම 2015 වර්ෂයේදී ලබාදී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ මුදල් අධිකාරිය විසින් අයකරගෙන නොතිබුණි.

(v) දිස්ත්‍රික් කාර්යාලයට අයත් හිඟ නිවාස කුලී ප්‍රමාණය රු.මිලියන 1.06 ක් වූ අතර ඒ තුළ අවුරුදු 03 ඉක්මවා තිබූ හිඟ කුලී සහිත නිවාස ඒකක 106 ක් විය. අධිකාරිය සතු නොවන ඉඩම් වල සාදා තිබූ නිවාස වලින් කුලී අයවීමේ හිඟයක් පවතින බව සාමාන්‍යාධිකාරී විසින් විගණනයට වාර්තා කර තිබුණද මේ සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ආ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අධිකාරිය ගෙවිය යුතු හිඟ බදු මුදල වූ රු.මිලියන 15.33 ක් සහ ඊට අදාළ දඩ මුදල වූ රු.මිලියන 7.12 ක් වෙනුවෙන් අධිකාරිය විසින් රු.මිලියන 21.52 ක් වෙන්කර තිබුණු නමුත් මෙම වගකීම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් අත්තිකාරම්, ගබඩා අත්තිකාරම්, ගමන් වියදම් අත්තිකාරම් හා විවිධ අත්තිකාරම්වලින් වසර 02 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණු රු.මිලියන 216.3 ක් පියවා ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඈ) අධිකාරියේ සේවකයන් හා නිලධාරීන් වෙනත් රාජ්‍ය ආයතනවල රාජකාරී කටයුතුවල යෙදවීම වෙනුවෙන් අධිකාරියට රු.මිලියන 72.42 ක් අයවිය යුතුව තිබුණි. එයින් රු.මිලියන 71.82 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයනොවී පැවතුණි.

(ඉ) 1998 වර්ෂයේදී නිවාස 60 කින් සමන්විත නිවාස ව්‍යාපෘතියක් සඳහා පෞද්ගලික සමාජ ආයතනයක් වෙත අධිකාරිය විසින් ඇත්නාවල වත්තෙන් ලබාදී තිබූ පර්චස් 685.49 ක්

වෙනුවෙන් තවදුරටත් අධිකාරියට ලැබිය යුතු රු.605,675 ක් සහ ඉඩම් කැබලි 06 ක් වෙනුවෙන් 2016 වර්ෂය සඳහා අයවිය යුතු රු.171,194 ක වාරික මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

(ඊ) 2010 වර්ෂයේදී අධිකාරිය විසින් රු.මිලියන 47.46 ක් ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණු නමුත් එම මුදල නැවත ලබාදෙන බවට භාණ්ඩාගාරයෙන් ලිඛිත තහවුරුවක් නොතිබුණි. එසේ වුවත් මෙම මුදල වර්ෂ 05 කට වැඩි කාලයක සිට ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(උ) රාජ්‍ය හා පෞද්ගලික ආයතන 05 කින් ව්‍යාපෘති සඳහා ලබාගත් ණය සඳහා ගෙවිය යුතු හිඟහිටි ණය වාරික රු.මිලියන 512.42 ක් හා හිඟහිටි ණය පොලී රු.මිලියන 248.07 ක් වසර 05 කට අධික කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ඌ) පුනරුත්ථාපන අමාත්‍යාංශයට හා සීවර අමාත්‍යාංශයට ගෙවිය යුතු එකතුව රු.මිලියන 220.09 ක ණය ශේෂ වසර 05 කට අධික කාලයක සිට පියවීමට කටයුතු කර නොතිබුණි.

(එ) පරිපාලන සමාගමට ඉඩමක් මිලදී ගැනීම සඳහා වසර 10 කට පෙර අධිකාරිය විසින් ලබා දී තිබූ රු.520,369 ක් අයකර ගැනීමට කටයුතු නොකර විවිධ ණයගැතියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) යාපනය දිස්ත්‍රික් කාර්යාලය විසින් සමුපකාර ණයදෙන සමිති නිවාස ණය ක්‍රමය (ටීසීසීඑස්) යටතේ වසර 30 කට පෙර ලබාදී තිබූ රු.මිලියන 5.97 ක් වටිනා නිවාස ණය ලිපිගොනු 1,468 ක් අස්ථානගත වීම හේතුවෙන් එම ණය මුදල් අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ණයගැතියන් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ණය හිමි ශේෂය වූ රු.මිලියන 1,829.81 ක් තුළ වර්ෂ 05 ඉක්මවා තිබූ ණයහිමි ශේෂය රු. මිලියන 1,315.62 ක් විය.

(ඕ) කළුතර දිස්ත්‍රික් කාර්යාලය විසින් 2013 හා 2015 වර්ෂයන්හිදී බාහිර පාර්ශවයන් වෙත එකතුව රු.275,000 ක අත්තිකාරම් ලබාදී ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම අත්තිකාරම් නිරවුල් කර ගෙන නොතිබුණි.

2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම්
(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (බී) වගන්තිය	වටිනාකම රු.මිලියන 2,218.36 ක්වූ ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.
(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත	පල්ලේකැලේ රිජන්සි පාර්ක් නිවාස ක්‍රමය සඳහා සහ ලිවින් හෝම්ස් නිවාස ක්‍රමය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	සුළු මුදල් අග්‍රිමයෙන් එකවර ගෙවිය හැකි උපරිම මුදල රු.5,000 ක් වුවද, කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් අවස්ථා 39 කදී මුද්දර ලබා ගැනීම වෙනුවෙන් එකතුව රු.376,088 ක් අවම සීමාව ඉක්මවා ගෙවීම් කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ සහ අධිකාරියේ මෙහෙයුම් කටයුතුවල අතිරික්තය පිළිවෙලින් රු.මිලියන 232 ක් සහ රු.මිලියන 240ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය පිළිවෙලින් රු.මිලියන 720 ක් හා රු.මිලියන 1,028 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.මිලියන 952 කින් හා රු.මිලියන 1,268 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ඉඩම් විකුණුම් ආදායම රු.මිලියන 872 කින් සහ අනෙකුත් ආදායම් රු.මිලියන 1,377 කින් ඉහළයාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ ඌනතාවය රු.මිලියන 303ක් වූ අතර 2015 වර්ෂය වන විට එම ඌනතාවය රු. මිලියන 1,028 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 240ක අතිරික්තයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.මිලියන 588 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 1,976 ක් දක්වා වර්ධනය වී තිබුණි.

3.2 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

ඉඩම් හා නිවාස පැවරීම, පාරිතෝෂික ගෙවීම හා සේව්‍ය සේවක ආරවුල් යන කරුණු මත බාහිර පාර්ශවයන් 72 ක් විසින් එකතුව රු. මිලියන 66 ක වන්දි ඉල්ලා අධිකාරියට එරෙහිව නඩු 72 ක් අධිකරණ වල ගොනුකර තිබුණි. එසේම, අනවසරයෙන් අධිකාරියේ දේපලවල පදිංචි වී සිටීම, හිඟ ණය හා හිඟ කුලී නොගෙවීම යන කරුණු මත බාහිර පාර්ශවයන් 1,006 කට එරෙහිව අධිකාරිය විසින්ද නඩු පවරා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) භෞතික කාර්ය සාධනය

ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධනය එනම් මහල් නිවාස, නිවාස සහ වෙනත් වාසස්ථාන හෝ ගොඩනැගිලි ඉදිකිරීමෙහිලා සෘජුවම දායක වීම, නිවාස හිඟය අඩු කිරීම පිණිස නිවාස සංවර්ධන යෝජනා ක්‍රම පිහිටුවීමට සැලසුම් කිරීම, නිවාස සංවර්ධනය සඳහා ඉඩම් ලබාදීම යනාදියට අදාළ කටයුතු කරගෙන යාම සඳහා 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත මගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර තිබුණි. ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 26 කින් හා නාගරික කාර්යාල 03 ක් මගින් දිවයින පුරා එහි කටයුතු මෙහෙයවනු ලබන අතර 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) නාගරික ඉඩම් ප්‍රතිසංවර්ධන වැඩසටහන හා මධ්‍යම පාන්තික නිවාස සංවර්ධන වැඩසටහන යටතේ පිළිවෙලින් නිවාස ඒකක 1,330 ක් හා 500 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් කිසිදු නිවාස ඒකකයක් ඉදිකර නොතිබුණි. තවද, ආදර්ශ ගම්මාන වැඩසටහන (ග්‍රාමීය/වතු/ධීවර) යටතේ නිවාස ඒකක 4,500 ක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් අවසන් කර තිබුණේ නිවාස ඒකක 259 ක පමණක් විය.

(ii) සෙවණ දිළිඳු නිවාස සංවර්ධන වැඩසටහන යටතේ නිවාස ඒකක 500 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකර තිබුණේ නිවාස ඒකක 59 ක් පමණක් වූ අතර එහි ප්‍රගතිය සියයට 12 ක් පමණක් විය.

(iii) අවිච්ඡේද වැඩසටහන යටතේ වූ පුනස්ථාපන නිවාස වැඩසටහන අනුව සමාලෝචිත වර්ෂය තුළ නිවාස ඒකක 40 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර එකදු නිවාස ඒකකයක් හෝ ඉදිකර නොතිබුණි.තවද, එම වැඩසටහන යටතේ ඉදිකිරීමට සැලසුම් කර තිබූ රාජ්‍ය පෞද්ගලික දායකත්ව නිවාස වැඩසටහන යටතේ වූ නිවාස ඒකක 660 න් 59 ක් පමණක් ඉදිකර තිබූ අතර එහි ප්‍රගතිය සියයට 9 ක් විය.

(iv) වැලිඔය විශේෂ ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 1,000 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර නිවාස ඒකක 42 ක් පමණක් ඉදිකර තිබුණු අතර එහි ප්‍රගතිය සියයට 4 ක් විය.

(v) 2016 වර්ෂයේ සිදුකරන ලද ඉඩම් සමීක්ෂණ වාර්තාව අනුව අධිකාරිය සතු හිස් ඉඩම් හෙක්ටයාර් 327.56 ක් ද අනවසර පදිංචි ඉඩම් හෙක්ටයාර් 116.1 ක් ද යාබද ඉඩම් හෙක්ටයාර් 6.71 ක් ද ඇති බව හඳුනාගෙන තිබුණු නමුත් එම ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට නිවාස ණය වැඩසටහන් යටතේ ලබාදී තිබූ මුළු ණය ප්‍රාග්ධනය රු.මිලියන 19,340.24 ක් වූ අතර පසුගිය වර්ෂය අවසානයට එම අගය රු.මිලියන 16,307.33 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට නිවාස ණය වැඩසටහන් යටතේ වූ ණයගැති ශේෂයද ඇතුලත්ව සමස්ත ණයගැති ශේෂය රු.මිලියන 4,509.19 ක් වූ අතර ඒ තුළ වර්ෂ 5ට වැඩි ණයගැති ශේෂය රු.මිලියන 2,041.56 ක් හෙවත් සියයට 45 ක් විය.

(iii) ණය එකතුකිරීමේ කොමිස් ලෙස 2016 වර්ෂයේදී රු.මිලියන 86.33 ක් වැයකර තිබුණද ණය අයවීමේ ප්‍රගති වාර්තාව අනුව අපේක්ෂිත ණය අයකිරීම් වලින් සියයට 58 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන තිබුණු අතර අක්‍රියව පැවති ණයගැති සංඛ්‍යාව මුළු ණයගැති සංඛ්‍යාවෙන් සියයට 71 ක් විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(ආ) වගන්තියට අනුව, අධිකාරිය විසින් භුක්තිය භාරගෙන තිබුණු හෙක්ටයාර් 154.85 ක ඉඩම් කැබලි 63 ක් පවරා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු වන්දි ලෙස මූල්‍ය ප්‍රකාශන වල රු.මිලියන 247.6 ක ප්‍රතිපාදන සිදුකර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අධිකාරිය විසින් එම වන්දි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිවාස යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමට ප්‍රථම අදාළ පළාත් පාලන ආයතන වලින් නිවාස සැලසුම් අනුමත කරවා ගෙන නොතිබීම හේතුවෙන් එම නිවාස යෝජනා ක්‍රම සඳහා අනුකූලතා සහතික ලැබී නොතිබුණි. එම නිසා නිවාස යෝජනා ක්‍රමයන්ට අදාළ නිවාස, නිවාස භිමියන්ට පැවරීමක් සිදුකර කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකි වී තිබීම හේතුකොට ගෙන නිවාස යෝජනා ක්‍රම 17 ක නඩත්තු වෙනුවෙන් රු.මිලියන 7.38 ක් හා

නිවාස යෝජනා ක්‍රම 29 ක අඳුත්වැඩියා වෙනුවෙන් රු.මිලියන 105.98 ක් දැරීමට අධිකාරියට සිදුවී තිබුණි.

(ඇ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවුල් 526 ක් සඳහා සූර්ය බල පද්ධති ලබා ගැනීම සඳහා 1989 – 1994 වසර වලදී ලබාදී තිබූ ණය මුදල් වලින් 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4.08 ක් අය විය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.2,590 ක් පමණක් අයවී තිබුණි. ඉතිරි ණය මුදල් අයකර ගැනීමට නිශ්චිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) 2007 වර්ෂයේදී මහනුවර මහ නගර සභාව සතු ඉඩමක අධිකාරිය විසින් ඉදිකර තිබූ නිවාස 32 කින් සමන්විත මහයියාව නිවාස ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 20 ක ඉදිකිරීම් පිරිවැයක් දරා තිබුණද එම මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මහනුවර මහ නගර සභාවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේදී රත්නපුර - ගල්කඩුවත්ත නැමති ඉඩම පවරා ගැනීම වෙනුවෙන්අධිකාරිය විසින් නාගරික සංවර්ධන අධිකාරියට රු.මිලියන 8.69ක් ගෙවා තිබුණු අතර එම පවරා ගැනීම සිදු නොකිරීමට 2014 වර්ෂයේදී අධිකාරිය තීරණය කළ නමුත් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවූ මුදල නැවත අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණු අතර එම මුදල සංවර්ධන වත්කම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඊ) වසර 05 කට අධික කාලයක සිට රු.මිලියන 37.87 ක් වටිනා වෙන්කල නිවාස, ඉතිරි නිවාස හා සාප්පු නිවාස තොගයේ පවතින අතර, වෙන්කල නිවාස සඳහා ලැබිය යුතු හිහ මුදල් අයකර ගැනීමට සහ තොගයේ පවතින ඉතිරි නිවාස හා සාප්පු කඩිනමින් අලෙවිකර ගැනීමට අධිකාරිය විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) ඇල්විටිගල මාවත, 117 වත්ත, IV අදියරෙහි ඉදිකළ නිවාස 08 න් 04 ක් 2011 වර්ෂයේ දී විදේශ අමාත්‍යාංශයට භාර දී තිබූ අතර මේ සඳහා තවදුරටත් ලැබිය යුතු රු.මිලියන 4.97 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) අධිකාරිය සතු රු.මිලියන 1.94 ක් වටිනා වාහන 13 ක් උතුරු නැගෙනහිර හා අනෙකුත් ප්‍රදේශ වලදී අස්ථානගතවී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදුකර විධිමත් පියවර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(එ) අධිකාරිය විසින් රාජ්‍ය හා පෞද්ගලික සේවකයන් සඳහා ලබාදුන් උපහාර ණය ගිවිසුමට අනුව, එම ණයවාරික ණයලාභියාගේ වැටුපෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට ප්‍රතිපාදන සලසා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට එසේ අයකර ගෙන නොතිබුණු නිහ හිටි ණය ශේෂය රු.මිලියන 303.5 ක් විය. රාජ්‍ය බැංකු වලින් ණය ලබාගෙන මෙම උපහාර ණය වැඩසටහන ක්‍රියාත්මක කර තිබූ බැවින් ණයගැනියන්ගෙන් මුදල් නොලැබුණද අධිකාරිය විසින් නියමිත දිනට අදාල වාරික හා පොලිය බැංකු වෙත ගෙවිය යුතුව තිබුණි. මේ හේතුවෙන් අධිකාරියේ සාමාන්‍ය කටයුතු සඳහා ඇති මුදල්ද ණය වාරික හා පොළී ගෙවීමට වැයකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහනුවර දිස්ත්‍රික් කාර්යාලය විසින් ගලහ නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ඒකක 16 ක් ඉදිකිරීම සඳහා 1998 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා රු.මිලියන 2.67 ක් වියදම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් අධිකාරිය වෙත ලැබී නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් තම පරිපාලිත සමාගමේ රු.මිලියන 120 ක් ආයෝජනය කර තිබුණු නමුත් 2014 හා 2015 වර්ෂයන්හි පිළිවෙලින් පරිපාලිත සමාගමේ රු.මිලියන 73.9 ක හා රු.මිලියන 207.67 ක බදු පසු ලාභයක් ගිණුම්වල පෙන්නුම් කලද 2013 වර්ෂයෙන් පසු අධිකාරිය වෙත කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 99/1165/21/122 ට අනුව අනවසර පදිංචිකරුවන් නියාමානුකූල කිරීමේදී වර්තමාන තක්සේරුව පදනම් කරගත යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි අධිකාරිය විසින් වරින් වර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා අභ්‍යන්තර වක්‍රලේඛ පදනම් කරගෙන අධිකාරිය සතු නිවාස, ඉඩම් හා සාප්පු සංකීර්ණ අනවසර පදිංචිකරුවන් වෙත ඔවුන් පදිංචි වූ වර්ෂයන්හි තක්සේරු අගයන්ට පැවරීම සිදුකරන බව විගණනයේදී නිරීක්ෂණය විය. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) 2015 වර්ෂයේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වන්නිගම වෙළඳ සංකීර්ණය හිමි ගොඩනැගිල්ලේ අයිතිය අනවසර පදිංචිකරුවකු වෙත 1998 වර්ෂයේ තක්සේරු මිලවූ රු.257,500කට පැවරීම සිදුකර තිබීම.

(ii) 2011 වර්ෂයේදී ගම්පහ වේවැල්දූව නිවාස යෝජනා ක්‍රමයේ ඉඩම් කොටස් 03 ක් 2000 වර්ෂයේ තක්සේරු වටිනාකම වූ රු.මිලියන 2.23 (පරිපාලන ගාස්තු ඇතුළත්ව) කට පැවරීම. මෙම ඉඩම් වල 2011 වර්ෂයේ තක්සේරු වටිනාකම රු.මිලියන 6 ක් විය.

(iii) 2014 වර්ෂයේදී රු.මිලියන 13.8 කට තක්සේරු කළ මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමයේ නිවාසයක් 1996 වර්ෂයේ තක්සේරු මිල වූ රු.මිලියන 3.7 කට පැවරීම.

(ආ) කොළඹ ඩාර්ලි පාරේ තක්සේරු වටිනාකම රු.මිලියන 650 ක් වූ අක්කර 01 යි පර්චස් 26.5 ක ඉඩමේ නිවාස ඉදිකර සංවර්ධනය කිරීමට පෞද්ගලික සමාගමක් සමග 2006 ජූනි 23 දින රු.මිලියන 812 ක ඒකාබද්ධ ගිවිසුමකට ඇතුළත්වී තිබුණු අතර, ඒ සඳහා එදිනම රු.මිලියන 100 ක් අධිකාරිය වෙත ලැබී තිබුණි. වර්ෂ 10 ක් ඉක්මවා තිබුණද, ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නිවාස ඉදිකිරීමක් හෝ කිසිදු සංවර්ධන කටයුත්තක් ආරම්භකර නොතිබුණු බැවින් ගිවිසුම අවලංගු කර ඉඩම නැවත අධිකාරිය වෙත ලබා ගැනීමට කටයුතු කිරීම වෙනුවට ඉඩමේ වර්තමාන වටිනාකම සැලකිල්ලට නොගෙන 2006 වර්ෂයේ ගිවිසුම අනුව ලැබිය යුතු ඉතිරි මුදල වූ රු.මිලියන 712 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් ලබාගෙන තිබුණි.

(ඇ) නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ලේ බිම් මහල හා I සිට V දක්වා මහල්වල වර්ග අඩි 27,184 ක් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත කුලියට ලබාදීමේදී රජයේ තක්සේරුකරුගෙන් තක්සේරුවක් ලබා නොගැනීම නිසා ප්‍රමාණවත් කුලියක් අයකරන බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. එහෙත් ඒ පිළිබඳ අවධානය යොමු නොකර අධිකාරිය විසින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සමග පහත සඳහන් ගනුදෙනුවලට එළඹී තිබුණි.

(i) එම ගොඩනැගිල්ලේ IX වන මහලේ 7 පරිශ්‍රය එම බැංකුව වෙත 2000 වර්ෂයේ සිට කුලියට ලබාදී තිබුණද ඒ සඳහා කුලී ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර බැංකුව විසින් මාසිකව රු.21,850 බැගින් අධිකාරිය වෙත ගෙවීම් කර තිබුණි.

(ii) රජයේ තක්සේරුකරුගේ තක්සේරුවක් ලබා නොගෙන මෙම ගොඩනැගිල්ලේ IX වන මහලේ වර්ග අඩි 1,345 ක් 2015 වර්ෂයේදී කුලියට ලබාදීමේදී අධිකාරියේ තක්සේරුකරු හා මිල කමිටුව විසින් රු.80,700 ක කුලියක් තීරණය කර තිබියදී ආයතන ප්‍රධානීන්ගේ එකඟතාවය මත රු.54,500 ක මාසික කුලියක් මත ගිවිසුම් අත්සන් කර තිබුණි.

(ඇ) 1979 අංක 17 දරන නිවාස සංවර්ධන අධිකාරී පනතේ 9 වන වගන්තියට අනුකූල නොවන පරිදි නිවාස සංවර්ධන අධිකාරිය විසින් එකම පුද්ගලයෙකු වෙත මත්තේගොඩ හා මැනිංටවුන් නිවාස යෝජනා ක්‍රමයන්හි නිවාස දෙකක් ලබාදී තිබුණු නමුත් එම ගැටළුව විසඳා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඉ) අධිකාරියට අයත් වටිනාකම් රු.මිලියන 4.76 ක් වූ හෝමාගම ජල්තර නිවාස දෙකක් නිවාස බැහැර කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව ගිවිසුම් අත්සන් කිරීමකින්ද තොරව පුද්ගලයින් දෙදෙනෙකු වෙත නිදහස් කොට තිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායක මුදල් ගෙවීමේදී අදාළ කරගතයුතු වැටුපට වඩා අඩු වැටුපකට දායක මුදල් ගෙවීම හේතුවෙන් රු.මිලියන 71.93 ක දඩ මුදලක් හා රු. මිලියන 50.04 ක් වූ සේවකයාගේ දායක මුදලද අධිකාරියට ගෙවීමට සිදුවී තිබුණු අතර එම මුදල් සේවකයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ගෙවිය යුතු ඉඩම් වන්දි වෙනුවෙන් රු. මිලියන 64.68 ක ප්‍රමාද පොලියක් ගෙවීමට සිදු වී තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2012අප්‍රේල් 04 දිනට අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය 1,376 ක්වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 2,143 ක් වූයෙන් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 807 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ විධායක සහ මධ්‍යම මට්ටමේ කළමනාකරණ තනතුරු 28 ක් පුරප්පාඩුව පැවති අතර 2017 වර්ෂයේදී එම තනතුරු 05 ක් සඳහා පමණක් බඳවාගෙන තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තියට පටහැනිව නිලධාරීන් 19දෙනෙකු මාස 06 සිට අවුරුදු 10 ක් දක්වා කාලයක් වැඩ බැලීමේ තනතුරුවල සහ රාජකාරී ආවරණය සඳහා රඳවා තිබුණි.

(ඈ) දිස්ත්‍රික් කාර්යාල වල අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර මානව සම්පත් අවශ්‍යතාවය විධිමත්ව හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණු බැවින් කෑගල්ල හා මහනුවර දිස්ත්‍රික් කාර්යාලවල පිළිවෙලින් නිලධාරීන් 28 දෙනෙකුගේ හිඟයක් හා නිලධාරීන් 52 දෙනෙකුගේ අතිරික්තයක් නිරීක්ෂණය විය.

(ඉ) 2005 අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු සේවයේ යෙදී සිටින නමුත් සංවිධාන සටහන තුළද එම තනතුර ඇතුළත් වී නොමැති අතර 2012 අප්‍රේල් 04 දිනැති අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව එම තනතුර අනුමත කරවා ගෙන නොතිබුණි.

4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට අනුකූල නොවන පරිදි අධිකාරිය විසින් 2016 ලෝක ජනාවාස දින හා මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති කාර්යයන් සඳහා රු.මිලියන 9.57 ක් නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය වෙනුවෙන් දරා තිබුණු අතර, අධිකාරියේ වාහන 05 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතද ලබාදී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව, අධිකාරිය විසින් යාවත්කාලීන කරන ලද සංවිධාන සැලැස්ම, අනුමත සේවක සංඛ්‍යාව, අයවැය ලේඛනය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, අග්‍රිම අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, අයවැයගත හා තථ්‍ය ආදායම්, වියදම් අතර සියයට 53 සිට සියයට 1,597 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි.

5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

අධිකාරිය විසින් 2014 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2017 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

5.4 නොවිසඳී ඇති විගණන ඡේද

2015 වර්ෂයේ විගණන වාර්තාවේ සඳහන් පහත සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ලැබේ.

(අ) අධිකාරිය සතු ලිබර්ටි ප්ලාසා සංචාරක බංගලාව ඕෂන්වීව් ඩිවෙලොප්මන්ට් සමාගමට විකිණීමේදී රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම ලබානොගෙන අධිකාරියේ තක්සේරුකරුගේ තක්සේරුව පමණක් ලබාගෙන තිබුණි. මෙම දේපළට අදාළව පසුව ලබාගත් රජයේ තක්සේරුකරුගේ තක්සේරුව රු.මිලියන 11.52 ක් වුවද, විකුණුම් වටිනාකම රු.මිලියන 9 ක් විය. මේ සම්බන්ධයෙන් 2012 නොවැම්බර් 23 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අවධානයට යොමුවී තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් ගත් පියවර විගණනයට අනාවරණය නොවිය.


(ආ) අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූල නොවන පරිදි 2011 වර්ෂයේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ හා පාලන) තනතුරේ පුරප්පාඩු පිරවීම හා වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ වාර්තාවක් ලබා දුන් බව විගණනයට වාර්තා කලද එහි වර්තමාන තත්ත්වය විගණනයට ඉදිරිපත් නොවිය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ) ණය පාලනය	(i)	ණය අත්වැලට අනුකූල නොවන පරිදි ණයලාභීන් තෝරා ගැනීම හා වාරික නිකුත් කිරීම.
	(ii)	ණය අයවීම් පරිගණකගත කිරීමේ හා කුවිතාන්සි නිකුත් කිරීම විධිමත් නොවීම.
	(iii)	ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ දීර්ඝ කාලීනව නිරවුල් කර නොතිබීම.
(ආ) අත්තිකාරම් පාලනය		අත්තිකාරම් නිකුත් කිරීමේ සීමාවන් පිළිනොපැදීම හා පියවීමේ ප්‍රමාදයන් තිබීම.
(ඇ) ගිණුම්කරණය	(i)	ලෙජරයේ හා මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් නාමයන්හි වෙනස්කම් පැවතීම හා එක් එක් විෂයයන් සඳහා ලබාදෙන ආධාර ගිණුම් වෙන්කර හඳුනා නොගැනීම
	(ii)	ඉඩම් සඳහා ලෙජර් ගිණුමක් පවත්වාගෙන නොයෑම.
(ඈ) ගෙවීම් පාලනය	(i)	අනුමත නොකළ වියදම් වවුචර් සඳහා ගෙවීම් කර තිබීම.
	(ii)	වවුචර්පත්වල ගිණුම් කේතාංක සටහන් කර නොතිබීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති



ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය